# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

# වාර්ෂික වාර්තාව - 2011

**2002 අංක 34 දරණ සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 15 වන වගන්තිය ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.**

# සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි තේමා ගීතය

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
කිත් යසසින් සුදිලේ
හෙලි කොටැ හේළි හෙළේ...//

සක්විති රාවණ ආදි යුගෙන්
දඬු මොණරින් ගුවන දිනා
වික්මැති ලක්දන වා රිය පොලිනුත්
පෑ විදු නුවණ මනා...//

''උවදුරු තොර බව සඳහා මුල් වෙමු''
වෙයි පෙර වැකිය අපේ...//
''ඉක්මන් අය මග නැගුමෙහි මුල් වෙමු''
මේ වෙයි දැකුම අපේ...//

රට වැසි යුතුකම් ඉටුවන අයුරින්
මව් බිම හා බැදෙමු...//
සමාජ මෙහෙවර සාර දහම් රැක
වගකීමෙන් පුදමු...//

| | | |
|---|---|---|
| **පද රචනය** | - | අරිසෙන් අහුබුදු ශූරීන් |
| **ගායනය** | - | ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේව |
| **සංගීතය** | - | ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේව |

## ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,

මෙම වාර්ෂික වාර්තාව 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 15 වන වගන්තියට අනුව සම්පාදනය කර ඇති අතර එයින් 2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඉටු කරන ලද කාර්යයන් අනාවරණය වේ.



**ජෙනරල් රෝහාන් ද සිල්වා දළුවත්ත**
සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

2012 පෙබරවාරි 24

# පටුන


ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි තේමා ගීතය 3

සංක්ෂිප්ත යෙදුම් 10

නාමාවලිය 13

සභාපතිගේ සමාලෝචනය 15

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරීගේ වාර්තාව 18

පැතිකඩ 23

- හැඳින්වීම 23
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි සාමාජිකයින් 23
- සභාපති 24
- උප සභාපති 25
- සාමාජිකයින් 26

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි පාලනය සහ වගකීම 29

- අධිකාරියෙහි කාර්ය භාරය 29
- සංවිධාන ව්‍යුහය 29
- අධිකාරියේ කමිටු 29
- කාර්ය මණ්ඩල කමිටුව 30
- මූල්‍ය කමිටුව 30
- සැලසුම් කමිටුව 30
- විගණන කමිටුව 31
- සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව 31
- හවුල් කරුවන් සමග සම්බන්ධතා පැවැත්වීම 31
- අධිකාරියෙහි සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරණයෙහි වගකීම 31
- වගකිවයුතු බව 31
- බැඳියා පිළිගැටුම් 32

අභ්‍යන්තර විගණනය 32
ව්‍යවස්ථාමය අවශ්‍යතාවයන්ට අනුකූල වීම 32
ආචාර ධර්ම 32

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය 33
ඉදිරි දැක්ම 33
මෙහෙවර 33
ආදර්ශ පාඨය 33
දර්ශනය 33
අරමුණු 33
උපාය මාර්ග 33
සාරධර්ම 33
සිවිල් ගුවන් සේවා අධිකාරියේ ආසන්න ඉලක්ක 34
ප්‍රතිඵල 34
ප්‍රතිදාන 35

මෙහෙයවීම හා කළමණාකරණය 36
අධිකාරිය සහ එහි කමිටු 36
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 36
අධිකාරියෙහි රැස්වීම් 36

ජ්‍යෙෂ්ඨ කළමණාකරණය 36
ICAO –USOAP විගණන ප්‍රතිඵල 36
COSCAP-SA හි 20 වන නියාමන කමිටු රැස්වීම 37
ගුවන්යානා අනතුරු විමර්ශන ඒකකය 37
අභ්‍යන්තර විගණන අංශය 38

ගගන නාවික සේවා ශාඛාව 39

ගුවන් සේවා සුරක්ෂිතතා අංශය 39
ගුවන් සේවා සුරක්ෂිතතා පුහුණුව 39
සෝදිසි කරන්නන් සහතික කිරීම 39
අවිආයුධ රැගෙන යාමට අවසර දීම 39
ගුවන් සේවා සුරක්ෂිතතා සම්මේලන හා රැස්වීම් 39
ගුවන් සේවා සුරක්ෂිතතා පාඨමාලාව සහ සම්මන්ත්‍රණය 40

විශේෂ ව්‍යාපෘති අංශය 40
දැයට කිරුළ ප්‍රදර්ශනය 40
COSCAP-SA ව්‍යාපෘතියට සහාය 40
CAASL පුහුණු පාසල (CAATA) 41
ගුවන් සේවා ඉන්ධන මිල නිරීක්ෂණය 41
2010 වාර්ෂික වාර්තාව 41
තුටු පඬුරු 41

| | |
|---|---|
| ගගන යාත්‍රාංගන හා ගුවන් සංතරණ සේවා අංශය | 41 |
| ATC ප්‍රමාණන තක්සේරුව | 41 |
| සෝදිසි කටයුතු | 41 |
| ජලාශ ගගන යාත්‍රාංගන | 42 |
| උස් ගොඩනැගිලි සඳහා අනුමැතිය | 42 |
| පුහුණු සැසි | 42 |
| ඉහළින් පියාසර කිරීමේ සහ ගොඩබෑමේ අවසරය | 42 |
| ගගන නාවික තොරතුරු සේවාව | 42 |
| හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපළ - නියාමක සහාය | 42 |
| පියසර නිරුපද්‍රිතතා ශාඛාව | 43 |
| පුද්ගල බලපත්‍ර අංශය | 43 |
| අනුමත පුහුණු සංවිධාන මත නිරුපද්‍රිතතා කළමණාකරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම | 43 |
| පියසර විභාග පරීක්ෂකවරුන් පත් කිරීම | 43 |
| විදේශ ගුවන් නියමු බලපත්‍රධාරීන්ගේ දැනුම පරීක්ෂා කිරීම | 43 |
| පුද්ගල බලපත්‍ර අංශයේ කාර්යන් ස්වයංකරණය කිරීම | 44 |
| වෛද්‍ය පරීක්ෂණ සඳහා රෝහලක් නම් කිරීම | 44 |
| මෙහෙයුම් අංශය | 44 |
| විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතික නිකුත් කිරීම | 44 |
| අනුකාරක සඳහා අනුමැතිය දීම | 44 |
| නම් කරන ලද සැසඳුම් නියමුවන් | 44 |
| ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකය | 44 |
| මෙහෙයුම් කරුවන්ගේ අත්පොත් සංශෝධනය කිරීම | 45 |
| දේශීය මෙහෙයුම් කරුවන්ගේ පුහුණු වැඩසටහන් සමාලෝචනය සහ අනුමත කිරීම | 45 |
| USOAP විගණනය | 45 |
| ගුවන් යෝග්‍යතා අංශය | 45 |
| අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව | 45 |
| ගුවන්යානා නඩත්තු සංවිධාන | 45 |
| ගුවන් යානා ලියාපදිංචි කිරීම | 46 |
| නිරුපද්‍රිතතා අධීක්ෂණය | 46 |
| වීසා සඳහා නිර්දේශ | 46 |
| නඩත්තු ඉංජිනේරු බලපත්‍ර | 46 |
| අමතර කොටස් සඳහා අනුමැතිය දීම | 46 |
| ඒකාබද්ධ ශාඛාව | 47 |
| ගුවන් ප්‍රවාහන හා නීති කටයුතු අංශය | 47 |
| ගුවන් සේවා සංඛ්‍යා ලේඛන | 47 |
| ගුවන් ප්‍රවාහන සමාගම් මෙහෙයුම් | 47 |
| මගී සහ නැව් බඩු චලන | 47 |
| සංක්‍රමණ මගීන් | 47 |

| | |
|---|---|
| දේශීය ගුවන් සේවාව | 48 |
| සංචාරක නියෝජිතවරු | 48 |
| ද්වී පාර්ශවීය ගුවන් සේවා සාකච්ඡා | 48 |
| ආසන වෙන් කිරීමේ සහ ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව | 49 |
| වාර සමායෝජනය (SLOT) | 49 |
| පොදු පරීක්ෂණ වැඩසටහන | 49 |
| APIG (ගුවන් තොටුපොළ ක්‍රියා පිළිවෙළ වැඩි දියුණු කිරීමේ සංසදය) | 49 |
| පාරිභෝගික පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම | 50 |
| ගුවන් ප්‍රවාහන කර්මාන්ත හවුල් කරුවන් සමග රැස්වීම්/වාණිජ දෙපාර්තමේන්තුව | 50 |
| මොරටුව විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්ට සේවාස්ථ පුහුණුව | 50 |
| **මානව සම්පත් හා කාර්යාල කළමණාකරණ අංශය** | **50** |
| කාර්ය මණ්ඩලය | 50 |
| සේවක සුභසාධනය | 50 |
| පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් හා සම්මේලන | 50 |
| තාක්ෂණික පුස්තකාලය | 51 |
| CAASL වෙබ් අඩවිය | 51 |
| CAASL ඒකාබද්ධ සැළැස්ම සහ ක්‍රියාත්මක වැඩසටහන් | 51 |
| CAASL ස්වයංකරණය | 51 |
| CAASL නව ස්ථානයකට ගෙන යාම | 51 |
| පිවිසුම් පාලන පද්ධතිය | 52 |
| CAASL සේවකයින් ලබා ගත් නිවාඩු | 52 |
| **මූල්‍ය කළමණාකරණ අංශය** | **52** |
| වැඩසටහන් අයවැය | 52 |
| CAA ආදායම | 52 |
| **2011 කාර්ය සාධක දර්ශක** | **53** |
| 2011 අධිකාරියෙහි කාර්ය සාධනය | 53 |
| මෙහෙයවීම සහ කලමණාකරණය | 54 |
| ගුවන් සේවා සුරක්ෂිතතා අංශය (AVSEC) | 54 |
| විශේෂ ව්‍යාපෘති අංශය (SP) | 54 |
| ගුවන් සංතරණ සේවා අංශය (ANS) | 54 |
| පුද්ගල බලපත්‍ර අංශය (PEL) | 55 |
| මෙහෙයුම් අංශය (OPS) | 56 |
| ගුවන් යෝග්‍යතා අංශය (AW) | 56 |
| ගුවන් ප්‍රවාහන හා නීති කටයුතු අංශය (AT&LA) | 57 |
| මානව සම්පත් හා කාර්යාල කළමණාකරණ අංශය (HR&OM) | 57 |
| මූල්‍ය කළමණාකරණ අංශය (FM) | 57 |
| අභ්‍යන්තර විගණන අංශය (IA) | 58 |
| ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශන අංශය (AAIU) | 58 |

2011 කර්මාන්තයෙහි කාර්ය සාධනය 59

2011 මූල්‍ය ප්‍රකාශ 60

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අධිකාරියේ සාමාජිකයින්ගේ වගකීම් ප්‍රකාශය 60

2011 දෙසැම්බර් 21 වන දිනට ශේෂ පත්‍රය 61

ආදායම් ප්‍රකාශය 62

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 63

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 64

මූල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන් 65

ගිණුම්කරණ ප්‍රතිපත්ති 82

විගණකාධිපති වාර්තාව 86

විගණකාධිපති වාර්තාවට පිළිතුරු 93

1 පරිශිෂ්ඨය - CAA සංවිධාන ව්‍යුහය 100

2 පරිශිෂ්ඨය - 2011 ගුවන් සේවා ආශ්‍රිත සිදුවීම් 101

3 පරිශිෂ්ඨය - USOAP විගණන ප්‍රතිඵල 102

4 පරිශිෂ්ඨය - ගුවන් සේවා ඉන්ධන මිල වෙනස් වීම් 104

5 පරිශිෂ්ඨය - නැව් නැගීමේ ගාස්තු රැස්කිරීම් 105

6 පරිශිෂ්ඨය - CAA කාර්යය මණ්ඩලය ලබා ගත් නිවාඩු 106

7 පරිශිෂ්ඨය - මගී පැමිණීම හා පිටත්වීම 107

8 පරිශිෂ්ඨය - විදුලි සංදේශ කුළුණු සඳහා අනුමැතිය 108

පටුන

# සංක්ෂිප්ත යෙදුම්

| | |
|---|---|
| A&NS | ගගන යාත්‍රාංගන හා ගුවන් සංතරණ සේවා |
| AA | සහකාර ගණකාධිකාරී |
| AAI | සහකාර ගගන යාත්‍රාංගන පරීක්ෂක |
| AA(I) | විගණන සහකාර අභ්‍යන්තර |
| AASI | සහකාර ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂක |
| AASL | සී/ස ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම |
| AATO | සහකාර ගුවන් ප්‍රවාහන නිලධාරී |
| AAwE | සහකාර ගුවන් යෝග්‍යතා ඉංජිනේරු |
| Acct | ගණකාධිකාරී |
| AFM | සහකාර මූල්‍ය කළමණාකාර |
| AFTN | ස්තබ්ධ ගගන නාවික විදුලි සංදේශ ජාලය |
| AGOI | සහකාර භූමි මෙහෙයුම් පරීක්ෂක |
| AI | ගගන යාත්‍රාංගන පරීක්ෂක |
| AIU | අනතුරු විමර්ශන ඒකකය |
| AISO | ගගන නාවික තොරතුරු සේවා නිලධාරී |
| AME(BL) | ගුවන් යානා නඩත්තු ඉංජිනේරු (මූලික බලපත්‍රය) |
| AML | ගුවන් යානා නඩත්තු බලපත්‍රය |
| AMO | අනුමත නඩත්තු සංවිධානය |
| AMT | ගුවන් යානා නඩත්තු තාක්ෂණ ශිල්පී |
| ANR | ගුවන් සංතරණ රෙගුලාසි |
| ANS | ගුවන් සංතරණ සේවා |
| ANSI | ගුවන් සංතරණ සේවා පරීක්ෂක |
| AOC | ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකය |
| AS | ගගන නාවික සේවා |
| ASI | ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂක |
| ASN | ගුවන් සේවා නිරුපද්‍රිතතා නිවේදනය |
| AT&LA | ගුවන් ප්‍රවාහන හා නීති කටයුතු |
| ATC | ගුවන් ගමන් පාලනය/ගුවන් ගමන් පාලක |

| | |
|---|---|
| ATO | ගුවන් ප්‍රවාහන නිලධාරී |
| Av. Sec | ගුවන් සේවා සුරක්ෂිතතාවය |
| Aw | ගුවන් යෝග්‍යතාවය |
| AwE | ගුවන් යෝග්‍යතා ඉංජිනේරු |
| BIA | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ |
| CAASL | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය |
| CAATA | සිවිල් ගුවන් සේවා අධිකාරියේ පුහුණු පාසල |
| CEO | ප්‍රධාන විධායක නිලධාරී |
| CIA | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| COSCAP-SA | මෙහෙයුම් නිරුපද්‍රිතතා සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතාවය වර්ධනය කිරීමේ දකුණු ආසියා සහයෝගිතා වැඩසටහන |
| Cp | සංස්ථාපිත |
| CSI | මැදිරි නිරුපද්‍රිතතා සහ අඛණ්ඩ පරීක්ෂක |
| C of R | ලියාපදිංචි කිරීමේ සහතිකය |
| DCA | සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව |
| D | අධ්‍යක්ෂ |
| DD | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| DGCA | සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් |
| DO | ලේඛනික නිලධාරී |
| DPIG | සංවර්ධන සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ සංසදය |
| ELP | උපකරණ පැටවීමේ සැලැස්ම |
| EU-SA | යුරෝපා සංගමය දකුණු ආසියාව |
| FAL | සුසාධනය |
| FIR | පියසර තොරතුරු කලාපය |
| FOI | පියසර මෙහෙයුම් පරීක්ෂක |
| FS | පියසර නිරුපද්‍රිතතාවය |
| GOI | භූමි මෙහෙයුම් පරීක්ෂක |
| GSA | පොදු වෙළඳ නියෝජිත |
| HR&OM | මානව සම්පත් හා කාර්යාල කළමණාකරණය |
| HR&OMA | මානව සම්පත් හා කාර්යාල කළමණාකරණ සහකාර |
| HR&OMO | මානව සම්පත් හා කාර්යාල කළමණාකරණ නිලධාරී |
| IA | අභ්‍යන්තර විගණනය |
| ICAO | ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය |
| MEL | අවම උපකරණ ලැයිස්තුව |
| NOTAM | ගුවන් සේවාවන්හි නිරත වුවන්ට දැනුම් දීම |
| Ops | මෙහෙයුම් |
| PA | පෞද්ගලික සහකාර |
| PEL | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම |
| PLO | පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ නිලධාරී |

| | |
|---|---|
| PA-AAI | වැඩසටහන් සහකාර - ගුවන් යානා අනතුරු විමර්ශන |
| PA-AE | වැඩසටහන් සහකාර - ගුවන් සේවා විභාග |
| PA-IT | වැඩසටහන් සහකාර - තොරතුරු තාක්ෂණ |
| PA-SP | වැඩසටහන් සහකාර - විශේෂ ව්‍යාපෘති |
| S/CAASL | ලේකම් - සිවිල් ගුවන් සේවා අධිකාරිය |
| SD | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ |
| SAISO | ජ්‍යෙෂ්ඨ ගගන නාවික තොරතුරු සේවා නිලධාරී |
| SARPs | ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් |
| SARAST | දකුණු ආසියා කලාපීය ගුවන් සේවා නිරුපද්‍රිතතා සංසදය |
| SATO | ජ්‍යෙෂ්ඨ ගුවන් ප්‍රවාහන නිලධාරී |
| SAwE | ජ්‍යෙෂ්ඨ ගුවන් යෝග්‍යතා ඉංජිනේරු |
| SFOI | ජ්‍යෙෂ්ඨ පියසර මෙහෙයුම් පරීක්ෂක |
| SLCAP | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා ප්‍රකාශනය |
| SP | විශේෂ ව්‍යාපෘති |
| SEP | නිරුපද්‍රිතතා හා හදිසි අවස්ථා කාර්යය පටිපාටි |
| SMS | නිරුපද්‍රිතතා කළමණාකරණ ක්‍රමය |
| SPLO | ජ්‍යෙෂ්ඨ පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ නිලධාරී |
| SSP | රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන |
| TRCSL | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම |
| USAP | ගුවන් සේවා ආරක්ෂක විගණනය |
| USTDA | එක්සත් ජනපදයේ වෙළඳ හා සංවර්ධන නියෝජිත ආයතන |
| USOAP | විශ්ව නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණන වැඩසටහන |

# නාමාවලිය

| | | |
|---|---|---|
| ප්‍රධාන කාර්යයාලය | : | **ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,** |
| | | 04, හුණුපිටිය පාර, කොළඹ 02. |
| | | දුරකථන : 94-11-2304632 |
| | | ෆැක්ස් : 94-11-2304644 |
| | | විද්‍යුත් තැපැල් ලිපිනය : info@caa.lk |
| | | වෙබ් අඩවිය : www.caa.lk |
| | | තැපැල් ලිපිනය : තැ.පෙ. 535, කොළඹ |
| | | විදුලි සංදේශ ලිපිනය : එයාර්සිවිල් (AIRCIVIL) |
| | | AFTN ලිපිනය : VCCCYAYX |
| ශාඛා කාර්යයාලය | : | **ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,** |
| | | ''හිල්ටොප්''නයිකන්ද, මිනුවන්ගොඩ පාර, කටුනායක. |
| | | දුරකථන : 94-11-2251076 |
| | | ෆැක්ස් : 94-11-2251076 |
| | | විද්‍යුත් තැපැල් ලිපිනය : katcaa@caa.lk |
| උප කාර්යයාලය | : | **ගුවන් යෝග්‍යතා උප කාර්යයාලය,** |
| | | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, |
| | | බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ. |
| | | දුරකථන : 94-11-2252269 |
| | | විද්‍යුත් තැපැල් ලිපිනය : aidbcaa@caa.lk |
| | : | **ගුවන් යෝග්‍යතා උප කාර්යයාලය,** |
| | | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, කොළඹ ගුවන් තොටුපොළ, රත්මලාන. |
| | | දුරකථන : 94-11-2635756 |
| | | විද්‍යුත් තැපැල් ලිපිනය : aidccaa@caa.lk |
| ගිණුම් පරීක්ෂකවරු | : | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති |
| නීතිඥවරු | : | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිපති |
| බැංකුකරු | : | ලංකා බැංකුව |
| රක්ෂණකරුවෝ | : | සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව |
| | | සී/ස සෙලින්කෝ ඉන්ෂුවරන්ස් සමාගම |

# සභාපතිගේ සමාලෝචනය



අපගේ නව වන වර්ෂය වූ 2011 වර්ෂය, අධිකාරිය තුළ මෙන්ම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවාව තුළද කැපී පෙනෙන සාධනයන් කීපයක් අත් කරගත් වර්ෂයක් වශයෙන් සැළකිය හැකිය.

2011 වර්ෂය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් මූලික වශයෙන් යොමු වූයේ ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර ප්‍රමිති ක්‍රියාත්මක කිරීම කෙරෙහිය. මෙරට තුළ ජාත්‍යන්තර ප්‍රමිති සහ අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමේ මට්ටම තක්සේරු කිරීම සඳහා 2010 වර්ෂයේදී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පවත්වන ලද විගණනයේදී ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර ප්‍රමිති සහ අවශ්‍යතා ප්‍රබල කර අන්දමින් ක්‍රියාත්මක කිරීමේ අගය 86.5% තරම් ඉහළ මට්ටමක පවතින බව අනාවරණය විය. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පළ කරන ලද වාර්තා වලට අනුව මෙම උසස් කාර්යසාධන මට්ටම නිසා ශ්‍රී ලංකාවට දකුණු ආසියානු රාජ්‍යයන් අතර ප්‍රථම ස්ථානයත්, ආසියා - ශාන්තිකර කළාපයේ රාජ්‍යයන් 34 අතර සිව් වන ස්ථානයත් හිමි වී ඇත. මෙය විශාල ජයග්‍රහණයක් බව අවධාරණයෙන් සඳහන් කළ යුතුව ඇත. ගුවන් සේවා නිරුපද්‍රිතතා ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම අතින් ශ්‍රී ලංකාවේ කාර්ය සාධන මට්ටම අභිභවා ඇත්තේ කොරියානු ජනරජය, සිංගප්පූරුව සහ ජපානය පමණකි. සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඉතිරි ඌණතාද නිවැරදි කරගෙන සර්ව නිර්දෝශී ගුවන් සේවා නිරුපද්‍රිතතා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිවැරදි කිරීමේ වැඩ සැලැස්මක් යෝජනා කර ඇති අතර ඊට සම්පූර්ණයෙන්ම පාහේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ අනුමැතිය ලැබී ඇත.

සිවිල් ගුවන් සේවා කටයුතු භාර ගරු අමාත්‍යතුමන් විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයක් හරහා 2010 අංක 14 දරණ නව සිවිල් ගුවන් සේවා පනත 2011 පෙබරවාරි මස 04 වන දින සිට බලාත්මක භාවයට පත්විය. එම පනත සම්මත කරවා ගැනීමේ ක්‍රියාවලියට අදාල සියලුම කාර්යයන් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලද අතර අධිකාරිය දැනට එම පනතේ අනෙකුත් අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. පනතේ විධිවිධාන අතරින් හඳුනාගත් විශේෂිත වූ ගගන නාවික සේවා සැපයීම සඳහා ව්‍යවස්ථාපිත සේවා සපයන්නෙකු පත්කිරීමට අවශ්‍ය කටයුතු අධිකාරිය විසින් ඉටුකරන ලදී. පනතේ විධිවිධාන අනුව අවශ්‍යවී ඇති අනෙකුත් සේවා සපයන්නන් පත්කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමටද නොනවත්වා කටයුතු කරනු ඇත. මීට අමතරව රෙගුලාසි පැනවීම අවශ්‍ය වන අංශ දැනටමත් හඳුනා ගෙන ඇති අතර ඒ සඳහා මූලික සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

ගුවන් යානා මගින් ජාත්‍යන්තර මගීන්, ගමන් මලු සහ භාණ්ඩ ප්‍රවාහනයේදී දැරිය යුතු වගකීම් විධිමත් කරන මොන්ට්‍රියල් සම්මුතිය අනුමත කර එහි පාර්ශවකරුවකු වීමටද අවශ්‍ය කටයුතු ඉටු කර ඇත.

සිවිල් ගුවන් සේවා අධිකාරිය දැනට මත්තල ගොඩනැගෙමින් පවතින දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළට අදාළ නියාමන කාර්යයන් ආරම්භ කර ඇත. මත්තල ගුවන් තොටුපළේ මහා සැළැස්ම (Master plan) අනුමත කරනු ලැබ ඇත.

සාමය උදා වීමත් සමග ශ්‍රී ලංකා ගුවන් සේවාවේ අනාගත බලාපොරොත්තු බෙහෙවින් ධනාත්මකව

ඉහළ ගියේය. විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි දුපත් රාජ්‍යයක් තුළ සංචාරක හා ගුවන් සේවා අංශ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා මත යැපෙයි. 2011 වර්ෂය තුළ සංචාරක පැමිණීමේ සංඛ්‍යාව 857975 ඉක්මවා යමින් සංචාරක කර්මාන්තයෙහි වර්ධන ගම්‍යතාවය අඛණ්ඩව පැවතුණි. මෙම ධනාත්මක උපනතිය පිළිබිඹු වන පරිදි සංචාරක කර්මාන්තය එහි ඉලක්ක ඉක්මනින් පුරෝකථනය කර ඇත. ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ ඉපිලියානා (Float planes) මෙහෙයුම සාර්ථක වී ඇති අතර දැන් ඉපිලියානා සංඛ්‍යාව වැඩි කරමින් ඇත. 2011 වර්ෂය තුළ අධිකාරිය විසින් ජලාශ ගගන යාත්‍රාංගන 15 ක් මෙහෙයුම් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

ආරක්ෂක හේතූන් නිසා අභ්‍යන්තර ගුවන් යානා මෙහෙයුම් මත පණවා තිබූ සීමා කිරීම් 2011 ලිහිල් කරන ලද හෙයින් අභ්‍යන්තර ගුවන් සේවා අංශය මෙතෙක් පැවතුණු උදාසීන තත්වයෙන් මිදී යලි පණ ගැන්වී ඇත. පණවා තිබූ සීමා කිරීම් මෙසේ ලිහිල් කිරීම අභ්‍යන්තර ගුවන් සේවා ක්‍රියාකාරකම් වල නිරත වීමට උනන්දුවෙන් හා ආශාවෙන් සිටි දේශීය ප්‍රජාව විසින් ඉතා සතුටින් පිළිගන්නා ලදී. ඔවුන් කැමැත්තෙන් සිටි අභ්‍යන්තර ගුවන් සේවා ක්‍රියාකාරකම් අතරට විවේක පියසර සහ හැන්ඩ් ග්ලයිඩින්, බැලූන් ගමන්, හෙලි ස්කීං, පැරා ජම්පිං ආදී ගුවන් ක්‍රීඩාද ඇතුළත් වේ. මෙම කාර්යයන් වර්ධනය වීමෙන් රටට සැලසෙන ප්‍රමාණයක ආර්ථික සහ සමාජයීය ප්‍රතිලාභ අත් වනු ඇත.

සාමය උදාවීමේ වාසිය ගුවන් ප්‍රවාහන අංශයේ වර්ධනයට සෘජුව දායක වී ඇති බව 2011 වර්ෂය තුළ වාර්තාගත මගී චලන මිලියන 6.1 කින් සහ මෙට්‍රික් ටොන් 157 ක නැව්බඩු චලන සංඛ්‍යාවෙන් පෙනී ගියේය. මෙම සංඛ්‍යා ඊට පෙර වසර සංඛ්‍යා සමග සසඳන කළ මගී සංඛ්‍යාවේ 17% වර්ධනයකුත් නැව් බඩු ප්‍රමාණයේ 21% වර්ධනයකුත් පෙන්නුම් කරයි.

මෙම අවස්ථාවේදී "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව යමින් ශ්‍රී ලංකාව ගුවන් සේවා කේන්ද්‍රයක් බවට පත් කිරීමේ රජයේ ඉදිරි දැක්ම ඉටුකර දීම සඳහා, ඉස්මතු වන වෙළඳපළ අවස්ථා ප්‍රයෝජනයට ගන්නා අතර රටේ ශක්තීන්ගෙන්ද වාසි ලබා ගනිමින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යය භාර්යයක්, ජාතික ආර්ථික වර්ධනය උදෙසා ප්‍රධාන උත්ප්‍රේරකයක් බවට පත්වීමේ ඉදිරි දැක්ම සහිත සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත පැවරී ඇත.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි ක්‍රියාත්මක වැඩ සටහන් තුළ ඉතා වැදගත් කාර්යයන් ගණනාවක් ඇත. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් සම්මත කර ඇති ජාත්‍යන්තර ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් දේශිය වශයෙන් ක්‍රියාත්මක කරන බවටත් ප්‍රබලකර ලෙස බලාත්මක කරන බවටත් සහතික වීමේ අනිවාර්ය බැඳීමක් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මත පැවරී ඇත.

මේ අනුව සිවිල් ගුවන් සේවා කර්මාන්තයෙහි කාර්යක්ෂමතාව පවත්වාගන යාම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට හැකියාව සහ පුහුණුව සහිත තාක්ෂණික කාර්යය මණ්ඩලයක් අවශ්‍ය වේ. අනාගත ඉල්ලුමට මුහුණ දීම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගන්නා අතර එහි සංවිධාන ව්‍යුහය ප්‍රතිව්‍යුහ ගත කිරීමේ යෝජනාවක්ද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් දැනටමත් ස්ථිර කරනු ලැබ ඇත.

ගුවන් සේවා නිරුපද්‍රිතතාව සහතික කිරීමේ එක් ප්‍රධාන පරාමිතියක් වනුයේ අවදානම් ගුවන් සේවා නිරුපද්‍රිතතා කාර්යයන්හි නිරත වන පුද්ගල ප්‍රවර්ග යන්ට ඔවුන්ට අවශ්‍ය පුහුණු පාඨමාලා, විභාග හා පරීක්ෂණ සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යාවලියයි.

පසුගිය වර්ෂය පුරාම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මානව සම්පත් වර්ධනය හා පුහුණුව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කරන ලද්දේ එය ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි මෙහෙවර සාක්ෂාත් කරගැනීමේ ලා දායක වන වඩාත්ම වැදගත් සහ වටිනා සම්පත වන බැවිනි.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, එහි සේවකයන්ට සහ ඔවුන්ගේ ආසන්න පවුල් සාමාජිකයන්ට ලබා දෙන සුභසාධන පහසුකමක් වශයෙන් එහි වෛද්‍ය රක්ෂණ ක්‍රමය නොනවත්වා පවත්වාගන ගියේය. කාර්යය මණ්ඩලයට ලබා දුන් ණය මුදල් වෙනුවෙන් වර්ෂය තුළ රුපියල් මිලියන 23.9 ක් වැය කර ඇත. කාර්යය මණ්ඩලයේ බහුතරයක් සඳහා දේශීය පුහුණු පාඨමාලා ගණනාවක් සංවිධානය කිරීමට අමතරව තවත් නිලධාරීන් ගණනාවක් විදේශ පුහුණු පාඨමාලා සඳහාද සහභාගී කරවන ලදී.

පසුගිය වර්ෂය පුරාම සිවිල් හමුදා සමායෝජනයට උපරිම වැදගත් කමක් ලබා දී කටයුතු කරන ලද

අතර, අභ්‍යන්තර ගුවන් සේවා කර්මාන්තයට උපකාර වෙමින් සිවිල් හමුදා බලධාරීන් අතර පැවති සම්බන්ධතාවන්හි කැපී පෙනෙන දියුණුවක් දක්නට හැකි විය. අදාල සිවිල් සහ හමුදා ආයතන එකඟත්වයෙන් කටයුතු කරන විට රටට ලබාගත හැකි විභව ප්‍රතිලාභ ගණනාවක් අධිකාරිය විසින් හඳුනා ගන්නා ලද අතර මෙම තත්වය නොකඩවා පවත්වාගෙන යාමටද ප්‍රයත්න දරණ ලදි.

විශේෂයෙන් පාසල් සිසුන්ටද, පොදු ජනයාටද ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනුමක් ලබා දීමේ අභිප්‍රායෙන් 2010 දී ආරම්භ කරන ලද අධ්‍යාපනික වැඩසටහන සාර්ථක අන්දමින් නොකඩවා පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සමත් වී ඇත. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ මෙම වැඩසටහන අධ්‍යාපන කලාප 05 ආවරණය වන පරිදි ක්‍රියාත්මක වූ අතර එයින් අ.පො.ස (උසස් පෙළ) පංති පැවැත්වූ පාසල් 160 සිසුන් 2600 කට පමණ යහපතක් සිදු විය. ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කරන අභිප්‍රායෙන් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් පළ කරනු ලබන "ගුවන්සර" ත්‍රෛමාසික අධ්‍යාපන සඟරාව දැනට අ.පො.ස (උසස් පෙළ) දක්වා පංති පැවැත්වෙන පාසල් 2800 කට නොමිලේ බෙදා හරිනු ලැබේ. මෙකී අධ්‍යාපන කාර්යයන්ට අමතරව 2011 පෙබරවාරි මාසයේදී "ගුවන්සර" නමින් අධ්‍යාපනික වෙබ් අඩවියක්ද විවෘත කරන ලදී.

විදේශයන්හීදී මිලදී ගනු ලබන ගුවන් ප්‍රවේශ පත්‍ර මත අයකරනු ලබන අයභාරය ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි මූලික ආදායම් ප්‍රභවය වශයෙන් පැවතුනි. 2011 වර්ශයේ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි ආදායම හා වියදම පිළිවෙළින් රුපියල් මිලියන 744 සහ රුපියල් මිලියන 315ක් වීය. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විවිධ වර්ග වලට අයත් බලපත්‍ර සහ ප්‍රමාණන අයදුම් කරන ගුවන් නියමුවන් සම්බන්ධව නියාමන පරීක්ෂණ සඳහා පාවිච්චි කළ හැකි ගුවන් යානයක් අත්පත් කර ගැනීමටත් යටිතල පහසුකම් සංවර්ධනයෙහි සහය වීමටත් සැලසුම් කරන හෙයින් අත ඇති ඉතිරිය ඊට වැදගත් වත්කමක් වෙනු ඇත. ඉතිරිවන අරමුදල් නියාමන කාර්යය සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් වර්ධනය සඳහාද යොදා ගනු ලබනු ඇත.

ශ්‍රී ලංකාව නැවතත් 2011 වර්ෂයේදී ද ගුවන් සේවා නිරුපද්‍රිතතාව අතින්, ගුවන් සේවා අනතුරු හෝ මරණ හෝ කිසිවකින් තොර උසස් නිරුපද්‍රිතතා මට්ටමක් අත්පත් කර ගත්තේය. මෙලෙස ඉදිරි වර්ෂයේදීද හැකි උපරිම නිරුපද්‍රිතතා කාර්යය සාධන මට්ටමක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඊට හැකි උපරිම ප්‍රයත්නය දරණු ලැබේ.

නිතිපතා අදහස් හුවමාරු කර ගැනීමෙන් සහ සුහද කර්මාන්ත සම්බන්ධතා පැවැත්වීමෙන් ගුවන් සේවා නියාමන ආයතන වශයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි ඉදිරි දැක්ම හා අරමුණු ඉටු කරගන්නා අතර යහපත් රාජකාරී සම්බන්ධතාවක් පවත්වා ගැනීමට අපට හැකිවී තිබේ.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසිනුත් අධිකාරියේ සෑම තරාතිරමකම සේවකයින් සියලු දෙනා විසිනුත් ඉටු කරන ලද විශිෂ්ඨ සේවය මම මෙහිදී කෘතඥපූර්වකව පිළිගනිමි. සියළු කල්හි ඔවුන්ගේ වගකීම පිළිබඳව අවබෝධයෙන් සිට මට මාර්ගෝපදේශ සහ සහයෝගය ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩලයටද මගේ ස්තූතිය පිරිනමමි. තවද මෙම කාර්යයාලයට මාර්ගෝපදේශ සහ සහය ලබාදීම වෙනුවෙන් සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමන්ට සහ සියළු නිලධාරීන්ට ස්තුති කිරීමට මම මෙම අවස්ථාව යොදා ගනිමි.



**එයාර් චීෆ් මාර්ෂල් ඩබ්ලිව්.ඩී.ආර්.එම්.ජේ. ගුණතිලක**
**සභාපති**



# සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

## ගෝලීය දසුන

ගුවන් ප්‍රවාහනය ගෝලීය ව්‍යාපාරයක් වශයෙනුත් රාජ්‍ය තාන්ත්‍රයන්ට අත්‍යවශ්‍ය වූ ආර්ථික හා සමාජ සංවර්ධන දායක කාරකයක් වශයෙනුත් තව දුරටත් පවතියි. අපට පෙනෙන තාක් දුර අනාගතය තෙක් පුද්ගලයින් ඈත දුර ගමන් නිරූපද්‍රිතව ගෙන යා හැකි මූලික ප්‍රවාහන මාධ්‍ය ගුවන් ප්‍රවාහනය වන අතර එය ලොව ප්‍රධාන බලවේගයක් බවට ස්ථිරවම පත්වී තිබේ. පුද්ගලයින් සහ භාණ්ඩ වෙළෙඳපොළ සම්බන්ධ කිරීමටත් විසිරී සිටින පවුල් යළි එක් කිරීමටත් සහය වන ගුවන් ප්‍රවාහනය ගවේෂණ චාරිකා සඳහාද ඉවහල් වෙයි. එය දැඩි රාජ්‍ය නියාමනයකට යටත් වී ඇති කර්මාන්තයක් වශයෙන් පවතියි. එහෙයින් ගුවන් ප්‍රවාහනයෙහි පැවැත්ම සහ වර්ධනය රැඳී පවතින්නේ හුදෙක් කර්මාන්ත හවුල්කරුවන් ඔවුන් වෙනුවෙන්ම කර ගන්නා කාර්‍යයන් මත පමණක් නොව රජයන් විසින් අනුගමනය කරනු ලබන රාජ්‍ය ප්‍රතිපත්තීන් මතද වේ.

2011 වර්ෂය තුළ පියසර මිලියන 38 කින් පුද්ගලයින් බිලියන 2.8 ක් පමණ සහ ආසන්න වශයෙන් ගුවන් නැව්බඩු ටොන් මිලියන 50 ක්ද ප්‍රවාහනය කරනු ලැබ ඇත. 2011 වර්ෂය තුළ නිත්‍ය වාණිජ පියසර ප්‍රමාණයෙහි වර්ධනය 3.5% ක් වූ වශයෙන් පැවතුණි. මෙම වර්ධනය 3.7% ක් වූ තථ්‍ය ගෝලීය දළ දේශීය නිෂ්පාදනයේ (GDP) වර්ධනය සමග සමපාතී වෙයි. ගුවන් නැව්බඩු ප්‍රමාණය ලෝක වාණිජ නැව්බඩු ප්‍රමාණයෙන් 1% ක් තරම් සුළු කොටසක් වන අතර එහි වටිනාකම, නැව් ගත කරන භාණ්ඩ සියල්ලෙහි සම්පූර්ණ වටිනාකමෙන් 35% ක අගයක් ගෙන ඇත. ගුවනින් ප්‍රවාහනය කරන ලද භාණ්ඩ අතරට වටිනාකම අධික සහ ඉක්මනින් නරක් වන හෝ කාල සංවේදී භාවයෙන් යුක්ත හෝ ද්‍රව්‍ය ඇතුළත් විය.

ගුවන් ප්‍රවාහන කාර්ය සංසදය (ATAG) විසින් නිකුත් කරන ලද සංඛ්‍යා ලේඛන අනුව 2011 වර්ෂය තුළ ගුවන් ප්‍රවාහන සමාගම් 1,600 කට අධික සංඛ්‍යාවක් 23,800 කට අධික ගුවන් යානා ඇණියකින් ලොව පුරා ගුවන් තොටුපළ 3,500 ක් තුළට සහ ඉන් පිටතට මෙහෙයුම් සිදු කරමින් නගර යුගල 35,000 කට සේවා සපයා ඇති අතර එහිදී ගගන නාවික සේවා සපයන්නන් 190 කට අධික සංඛ්‍යාවක් විසින් කළමණාකරණය කරනු ලබන සංකීර්ණ ගුවන් තලයක් තුළ මගී කිලෝමීටර් ට්‍රිලියන 5 කට අධික සංඛ්‍යාවක සහ නැව් බඩු ටොන් කිලෝමීටර් බිලියන 172 ක ප්‍රවාහන කාර්යක් සම්පූර්ණ කර ඇත. ගුවන් ප්‍රවාහනය එක් රටක් වූයේ නම් එහි ඩොලර් බිලියන 539 ක වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතය (GDP) සමග එය ලොව 19 වන ස්ථානයට පත් වේ.

ගුවන් සේවාව විසින් සපයනු ලබන අසාමාන්‍ය සම්බන්ධන හැකියාව ලොව පුරා රැකියා මිලියන ගණනාවකට අනුග්‍රහ දක්වන අතර ආර්ථික කාර්යන් සඳහා ඩොලර් ට්‍රිලියන ගණනාවකින් දායකත්වය ලබාදෙයි. ලොව පුරා ගුවන්සේවා සහ ඒ ආශ්‍රිත සංචාරක අංශයන්හි පුද්ගලයින් මිලියන 56 කට අධික සංඛ්‍යාවක් රැකියාවන්හි නිරත වී ඇත. මේ අතුරින් පුද්ගලයින් මිලියන 8.36 ක් සේවය කරන්නේ සෘජුවම ගුවන් සේවා කර්මාන්තයෙහිය. 2030 වර්ෂය වන විට වර්ධනය වන ඉල්ලුමට මුහුණ පෑම සඳහා ගුවන් සේවා කර්මාන්තයට අතිරේක ගුවන් නියමුවන් 250,000 ක් ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවරුන් 400,000 ක් සහ ගුවන් ගමන් පාලකවරුන් 40,000ක් අවශ්‍ය වන බව ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) පුරෝකථනය කරයි. ප්‍රක්ෂේපිත වර්ධනය පවත්වා ගැනීමට හැකිවන අයුරු මානව සම්පත් ප්‍රමාණ වර්ධන වැඩසටහන් වැඩි වැඩියෙන් ක්‍රියාත්මක කරන මෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) රාජ්‍යයන්ට උපදෙස් දෙයි.

2011 වර්ෂය තුළ ලොව පුරා පියාසර කළ ගුවන්යානා කාබන්ඩයොක්සයිඩ් ($CO_2$) ටොන් මිලියන 676 කට වැඩි ප්‍රමාණයක් පරිසරයට මුදාහළ අතර එම ප්‍රමාණය සමස්ථ ගෝලීය නිෂ්පාදයෙන් 2% කි. සියයට හැත්තෑහතරක් (74%) වූ මාර්ග ප්‍රවාහන $CO_2$ දායකත්වය සමග සසඳන කළ ගුවන්සේවා දායකත්වය සියයට දොළහකි (12%). ගුවන් සේවාවෙන් සිදුවන $CO_2$ මෝචනයන්ගෙන් 80% කට අධික ප්‍රමාණයක් සිදුවන්නේ ප්‍රායෝගික විකල්ප ප්‍රවාහන මාධ්‍යයක් නොමැති කි. මී. 1,500 ඉක්මවූ දුර ගමන් පියාසරයන්ගෙනි. විකල්ප ශක්ති ප්‍රභවයක් වශයෙන් ඇල්ජී (Algae) ජැට්රෝෆා (Jatropha) සහ කැලමයින් (Calamine) ආදියෙන් නිෂ්පාදනය කරනු ලබන ජෛව ඉන්ධන හඳුනා ගනිමින් ගුවන් ප්‍රවාහන කර්මාන්තය පරිසර සංරක්ෂණ අවශ්‍යතාව කෙරෙහි ධනාත්මක ප්‍රතිචාර දක්වා ඇත. ගුවන් ගමන් සංඛ්‍යාව වාර්ෂිකව 6% ක සාමාන්‍යයකින් ඉහළ යන නමුදු ඉගිලුමේදී 83 dB තරම් අල්ප වූ ශබ්ධයක් සහිත වඩා නිහඬ නවීන ගුවන් යානා වෙළඳපොළට ඇතුළු වීමත් සමග ගුවන් තොටුපොළ වටපිටාවන්හි ශබ්ධය අඩුවෙමින් පවතියි. කි. මී. 5,200 ක දුරින් පමණක් පියාසර කළ හැකි වූ ප්‍රථම ජෙට් ගුවන් යානය සමග සසඳන කළ වර්තමාන ගුවන් යානයට මගී කි. මී. 100ක් සඳහා ලීටර් 3.5 ක ඉන්ධන කාර්යක්ෂමතාවක් සහිතව කි. මී. 15,200 ක නොනවතින (Non stop) පියසරයක නිරත විය හැකිය.

ප්‍රවාහන සමාගම් ආදායමෙන් 32% ක සාමාන්‍යයක් බවට පත් වෙමින් සීඝ්‍රයෙන් වැඩිවන ඉන්ධන පිරිවැය සමග එකී සමාගම් වල මෙහෙයුම් පිරිවැය පෙර නොවූ විරූ ලෙස ඉහළ යන නමුදු ගමන් පිරිවැය සැලකිය යුතු ලෙස පහළ වැටෙන හෙයින් ගුවන් ගමන් යාම වැඩි වැඩියෙන් තරඟකාරී තත්වයකට පත් වෙමින් පවතී. 2011 වර්ෂය තුළ ගුවන් ප්‍රවාහන කර්මාන්තය ඩොලර් බිලියන 3.5 ක ගෝලීය ලාභයක් ලබා ඇත. මෙය එහි ආදායම වූ ඩොලර් බිලියන 600කින් 0.6 ක ලාභාන්තයක් පමණි. මෙයින් පෙනී යන්නේ ගුවන් ප්‍රවාහන කර්මාන්තය විශාල පිරිවැටුමක් විනා එතරම් ලාභයක් නොලබන ව්‍යාපාරයක් බවය.

නිරුපද්‍රිතතාව, ගුවන් සේවයෙහි පැවැත්ම සඳහා අවශ්‍ය අංක 1 ප්‍රමුඛතාව දිය යුතු සාධකයක් වශයෙන් පවතියි. 2011 වර්ෂය තුළ නිත්‍ය වාණිජ පියසර ආශ්‍රිත සිදු වූ ගුවන්යානා අනතුරු සංඛ්‍යාව 126ක් වූ අතර ගෝලීය ගුවන්යානා අනතුරු අනුපාතය පිටත්වීම් මිලියනයකට 3.4 ක් විය. 2011 වර්ෂය 2004 වර්ෂයෙන් මෙපිට පැවති වඩාත් නිරුපද්‍රිත වර්ෂය බවට පත්කරමින් ගුවන් යානා අනතුරු නිසා සිදුවූ මරණ සංඛ්‍යාව 414ක් වූ අතර එය 41.4% ක අඩු වීමකි. මෙම අඩුවීමට ප්‍රධාන හේතුවක් වූයේ ධාවන පථ නිරුපද්‍රිතතාව වර්ධනය වීමයි. 2011 වර්ෂය තුළ ධාවන පථ නිරුපද්‍රිතතාවට අදාළව මාරාන්තික අනතුරු කිසිවක් සිදු නොවීය.

2005 -2010 කාල සීමාවේ අනතුරු දත්ත පදනම් කර ගනිමින් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) නම් වශයෙන්, ධාවන පථ නිරුපද්‍රිතතාවට අදාළ සිදුවීම්, පියසර අතරතුර පාලනය ගිලිහීම් සහ පාලිත පියසර භූමියෙහි ගැටීම් යන වැඩි අවදානම් අනතුරු සිදුවීම් ප්‍රවර්ග තුනක් හඳුනාගෙන ඇත. අනතුරු ප්‍රමාණය තවදුරටත් අවම කිරීම සඳහා මෙකී ක්ෂේත්‍රයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

ICAO හි විශ්ව නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණන වැඩසටහන (USOAP) සහ විශ්ව සුරක්ෂිතතා විගණන වැඩසටහන (USAP) නොකඩවා ක්‍රියාත්මක වෙමින් ලොව පුරා ගුවන්සේවා නිරුපද්‍රිතතාව, සුරක්ෂිතතාව, කාර්යක්ෂමතාව සහ ක්‍රමවත්භාවය වර්ධනය කිරීමේ අරමුණ සහිතව, නිරුපද්‍රිතතාවට සහ සුරක්ෂිතතාවයට අදාළ ICAO ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම තව දුරටත් දිරිගන්වනු ලැබේ. 2011 වර්ෂය අවසාන වන විට USOAP වැඩසටහන ලොව පුරා සිදු කෙරෙන ගුවන් යානා මෙහෙයුම් 99%ක් ආවරණය කරන ICAO සාමාජික රාජ්‍යයන් සංඛ්‍යාවෙන් 95% ක් සම්බන්ධ තක්සේරු කිරීම් (විගණන) සම්පූර්ණ කර තිබුණි. මෙම විගණනයන්ගේ ප්‍රතිඵල මත පදනම්ව ICAO විසින් එහි සාමාජික රාජ්‍යයන් 11ක් සම්බන්ධව බරපතල නිරුපද්‍රිතතා ප්‍රවේදිතා ඉස්මතු කරන ලදී. මෙම ප්‍රවේදිතා හේතුවෙන් එකී රාජ්‍යයන් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා කාර්යන්හි සක්‍රියව නිරතවීම අභියෝගයකට ලක් වී තිබිණ.

ගුවන් සේවා නිරුපද්‍රිතතා වර්ධනය වූ කලී ගෝලීය ප්‍රමිතීන් ප්‍රබලකර ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත හවුල් කරුවන් විසින් දරණු ලබන සාමූහික ප්‍රයත්නයන්හි ප්‍රතිඵලය වෙයි. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයද මේ සඳහා එහි USOAP සහ USAP වැඩසටහන් හරහා සාමාජික රාජ්‍යයන් සමග සමීප අන්‍යෝන්‍ය සම්බන්ධතාවයකින් කටයුතු කරයි. ඊට සමගාමීව ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සම්මේලනයද (IATA) IOSA විගණන ප්‍රමිති මාර්ගයෙන් ගුවන් ප්‍රවාහන සමාගම් සමග එක්ව කටයුතු කරයි. නිරුපද්‍රිතතා තොරතුරු හුවමාරු කර

ගැනීම සඳහා IATA, ICAO එක්සත් ජනපදයේ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ යුරෝපා කොමිසම අතර ගිවිසුමක් අත්සන් කර ඇති අතර, වඩාත්ම හොඳ පරිචයන් ක්‍රියාත්මක කිරීම පතුරුවාලීම සඳහා ලොව පුරා විවිධ ප්‍රයත්න ගණනාවක් දරණු ලැබේ. 2011 අවසානය වන විට යුරෝපා සංගමය (EU) විසින් අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සමග අනුකූලත්වය නොපැත්වූ ගුවන් ප්‍රවාහන සමාගම් 300 කට පමණ EU ගුවන් තලය තුළට මෙහෙයුම් සිදු කිරීම තහනම් කර තිබුණි.

දැනට වැඩිවෙමින් පවතින ගුවන් ගමන් සංඛ්‍යාව සමග සිවිල් ගුවන් සේවා කාර්යන් සඳහා ස්ථිරව විවෘතව ඇත්තේ ගෝලීය ගුවන් අවකාශයෙන් අඩක් තරම් ප්‍රමාණයකි. ගෝලීය ගුවන් අවකාශයේ ඉතිරි කොටස හමුදා පාලනයට යටත්ව පවතියි. වර්ධනය වෙමින් පවතින අතිරේක ගුවන් අවකාශ සැලකිල්ලට ගනිමින්, ස්ථිතික මාඉම් වෙනුවට අවශ්‍යතාව පදනම් කර ගනිමින් ගුවන් අවකාශය මුදා හරින ගතික ගුවන් අවකාශ කළමණාකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ICAO විසින් රාජ්‍යයන් උනන්දු කරනු ලැබේ.

## කලාපීය දසුන

2011 වර්ෂය තුළ ආසියා කලාපය 7.8% ක සාමාන්‍යය වාර්ෂික ගුවන් ගමන් වර්ධනයක් වාර්තා කළ අතර එය ලොව සියළු ගුවන් සේවා කළාප අතරින් වාර්තා වූ ඉහළම වර්ධන වේග ප්‍රතිශය වීය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2011 වර්ෂය තුළ ආසියාවේ සම්පූර්ණ ගුවන් ගමන් ප්‍රමාණය දෙවැනි වූයේ උතුරු ඇමරිකාවේ ගුවන් ගමන් ප්‍රමාණයට පමණි.

2011 වර්ෂය තුළ ආසියාවේ ගුවන් ප්‍රවාහන සමාගම් වාණිජ මෙහෙයුම් අතරතුර ගුවන්යානා අනතුරු 22 කට මුහුණ පෑ අතර එයින් තුනක් මාරාන්තික අනතුරු විය. මරණ සංඛ්‍යාව 98 කි.

කලාපීය රාජ්‍යයන් බොහොමයක් ක්ෂණික ආර්ථික ප්‍රගමනයක් අපේක්ෂාවෙන් ගුවන් සේවාව උපක්‍රමශීලී ලෙස යොදා ගෙන ඇත. ඒ අනුව එකී රාජ්‍යයන් විසින් ගුවන් සේවා කර්මාන්තය සීමාකාරී ආර්ථික රෙගුලාසි වලින් නිදහස් කර කර්මාන්තය මත පනවා තිබූ බදු කොන්දේසි ලිහිල් කරන ලදී. යටිතල පහසුකම්, ආයෝජන ප්‍රතිපත්ති සහ ගමන් සහ ඉන්ධන බදු කලාපය තුළ ගුවන් සේවා කර්මාන්තය විසින් විශේෂ අවධානය යොමු කරන ලද ප්‍රධාන ගැටළු වීය.

ගුවන් තොටුපොළ යටිතල පහසුකම් සංවර්ධනය අතින් ආසියා කලාපය සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර වැඩි වැඩියෙන් රාජ්‍යයන් රාජ්‍ය - පෞද්ගලික හවුල් ආකෘතිය හඳුන්වා දීමට කටයුතු කර ඇත. ආසියා කළාපය, දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් මත සෘජු විදේශ ආයෝජන සඳහා ඇති ඉල්ලුම කෙරෙහි වැඩි ප්‍රතිචාරයක් දක්වා ඇත. මෙයින් විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් සමග සමානතා කොන්දේසි මත උපක්‍රමික සම්බන්ධතා ඇති කර ගැනීමට අවස්ථාව සැලසේ.

ගුවන් මාර්ග වලින් උපරිම ප්‍රයෝජන ගැනීම, ගුවන් ගමන් කළමණාකරණය වැඩි දියුණු කිරීම, අළුත් සහ වැඩි ඉන්ධන කාර්යක්ෂමතාවක් සහිත ගුවන් යානා මත ආයෝජනය කිරීම සහ ගුවන් බඩු මෙහෙයවීම සඳහා ලියවිලි රහිත විද්‍යුත් නැව් බඩු යන්ත්‍රණය (E-Frieght) භාවිත ආදියට කලාපය ප්‍රමුඛතාවය ලබා දුන්නේය. ගුවන් නැව්බඩු මෙහෙයවීමේ තරගකාරිත්වය සහ කාර්යක්ෂමතාව ඔසවා තැබිය හැකි වඩාමත් වැදගත් වූ එකම ව්‍යාපෘතිය විද්‍යුත් නැව් බඩු (E-Frieght) ව්‍යාපෘතිය බැවින් එය ක්‍රියාත්මක කිරීම සඳහා කලාපයේ රාජ්‍යයන් වැඩි උනන්දුවක් දක්වා ඇත.

2011 වර්ෂය තුළ ආසියා - ශාන්තිකර කලාපයේ ගුවන් ප්‍රවාහන සමාගම් විශාලතම නිරපේක්ෂ ලාභය ඉපයීමේ වාර්තාවක්ද සමග ඩොලර් බිලියන 3.3 ක ආදායමක් උපයා ඇත.

අසල්වැසි ඉන්දියාවේ ගුවන් සේවා කර්මාන්තය ගෝලීය සාමාන්‍ය මෙන් දෙගුණයක් තරම් වූ ප්‍රමාණයකින් වර්ධනය වෙමින් පවතියි. එහි වර්ධන වේගය දේශීය වශයෙන් 12% ක් සහ ජාත්‍යන්තර වශයෙන් 8-9% ක් ද විය. වාර්ෂිකව ටොන් මිලියන 3කට අධික නැව් බඩු ප්‍රමාණයක් සහිතව හොංකොං ගුවන් තොටුපොළ ජාත්‍යන්තර ගුවන් නැව් බඩු සඳහා වූ ලොව ඉහළම ගුවන් තොටුපොළ බවට පත් වී ඇති අතර එහි ජාතික ගුවන් ප්‍රවාහන සමාගම වූ කැතේ පැසිෆික් සමාගම, සාධනය කරන ලද නැව් බඩු ටොන් කිලෝමීටර් සංඛ්‍යාව අතින් ලොව තුන්වන ස්ථානයට පත්වී ඇත.

## දේශීය දසුන

2009 වර්ෂයේදී සාමය යළි උදා වීමත් සමග ශ්‍රී ලංකාව එහි ගුවන් ප්‍රවාහන අංශය යළි පණ ගන්වා ඇත. 2011 වර්ෂය තුළ පිළිවෙලින් මගී නැව් බඩු සහ ගුවන් යානා වර්ධන වේග 15% (මිලියන 6.2) 20% (මෙට්‍රික් ටොන් 158,000) සහ 27% (44,000) වශයෙන් වූ විශ්මයජනක වර්ධනයක් නිරීක්ෂණය කරන ලදී. බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට පැමිණි මිලියන

3.1 ක් වූ මගීන් මුළු සංඛ්‍යාවෙන් 24% ක් පමණ (711,000) කොළඹ බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ හරහා සංක්‍රමණය වන මගී වූහ. මෙයින් පෙනී යන්නේ බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ කේන්ද්‍ර ගුවන් තොටුපොළ බවට පත් වී ඇති බවයි. මෙකී සංක්‍රමණ මගීන්ගෙන් 98% ක් රට තුළට ගෙනවුත් ඇත්තේ ශ්‍රී ලන්කන් එයාලයින්ස් සමාගම විසින් බවද සැලකිය යුතු කරුණකි.

2011 වර්ෂය තුළ අභ්‍යන්තර ගුවන් සේවාවන්හි නිරත වූ ස්තම්භ තටු (Fixed Wing) ගුවන් යානා තුළ ගමන් කළ මගී සංඛ්‍යාවෙහි සැළකිය යුතු වැඩි වීමක් දක්නට නොතිබිණ. කෙසේ වුවද රට අභ්‍යන්තරයෙහි ගමන් කිරීම සඳහා හෙලිකොප්ටර් යානා වලට තිබුණු ඉල්ලුම වැඩි වෙමින් පැවතුණි. හෙලිකොප්ටර් යානා වැඩි වශයෙන් පාවිච්චි කරන ලද්දේ ව්‍යාපාරිකයන් සහ සංචාරකයන් විසින්ය. ශ්‍රී ලන්කන් එයා ලයින්ස් විසින් මෙහෙයවනු ලබන ඉපිළියානා (Float Planes) මගින්ද පුද්ගලයින් සෑහෙන සංඛ්‍යාවක් ගමන් කර ඇති අතර සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දැකුම්කළු ස්ථාන නැරඹීම සඳහා උණු වා බැලුන් පාවිච්චි කිරීමද ජනප්‍රිය විය.

ගුවන් සේවාව, ජාතික ආර්ථිකයේ ත්වරිත සංවර්ධනය සඳහා ස්ථාපනය කළ යුතු ප්‍රධාන කේන්ද්‍ර පහෙන් එකක් වන බව රජය ප්‍රකාශයට පත් කළේය. මෙම තත්වය යටතේ මෙරට ගුවන් සේවා අංශයෙහි නිරුපද්‍රිත, සුරක්ෂිත, කාර්යක්ෂම සහ ක්‍රමවත් වර්ධනයක් සහතික කරමින් ගුවන් සේවා කේන්ද්‍රයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේදී ගුවන් සේවා නියාමකයා වන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට වඩාත් විශාල කාර්යභාරයක් ඉටු කිරීමට සිදුවිය. මෙහිදී රාජ්‍ය සතු නිරුපද්‍රිතතා අධීක්ෂණ හැකියාව වර්ධනය කිරීම සඳහා රාජ්‍ය ආයතන සහ කර්මාන්ත හවුල්කරුවන් සමග සමායෝජනය ඇති කර ගැනීමෙන් පියවර මාලාවක් ගැනීමට සිවිල් ගුවන් සේවා අධිකාරියට සිදුවිය. සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නිරුපද්‍රිතතා අධීක්ෂණ කාර්ය ඉටු කරනු ලබන්නේ රාජ්‍ය සඳහා සහ රාජ්‍ය වෙනුවෙන් වන අතර එය රට තුළ ස්ථාවර ගුවන් සේවා පද්ධතියක් ගොඩනැගීමේ පදනමද වෙයි.

එතෙක් බලාත්මකව තිබුණු 1950 අංක 15 දරණ ගුවන් සංතරණ පනත අභිභවා සිටින 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත 2011 පෙබරවාරි මස 04 වන දින සිට බලාත්මක කිරීම සඳහා කටයුතු කරන ලදී. ගුවන් සේවා කර්මාන්තයේ වර්තමාන අවශ්‍යතාවන්ට සරිලන පරිදි නව සිවිල් ගුවන් සේවා පනත යටතේ නව සුපර්යාප්ත මෙහෙයුම් රෙගුලාසි කාණ්ඩයක් හඳුන්වා දීමටද පියවර ගන්නා ලදී.

කාර්ය මණ්ඩලය සඳහා වැඩි ඉඩකඩකඩ, වඩා හොඳ පහසුකම් සහ සේවා සපයා දෙන අතරම කාර්යාලය තුළට පැමිණෙන ගනුදෙනු කරුවන්ගේ සිත් තුළ චිත්තාකර්ෂණීය ප්‍රතිරූපයක් නිර්මාණය කළ හැකි වන පරිදි සංවිධානයට හොඳ පෙනුමක් ලබා දීමේ අරමුණ සහිතව සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාලය කොළඹ 2, හුණුපිටිය පාරේ අංක 4 දරණ ස්ථානයේ පිහිටි වඩා හොඳ ගොඩනැගිල්ලකට ගෙන යන ලදී. සිවිල් ගුවන් සේවා අධිකාරියට මයික්‍රොසොෆ්ට් එක්ස්චේන්ජ් පිටුවහළ සහිතව වඩා හොඳ සංදේශන ජාලයක්ද සපයන ලදී. කාර්යභාර නිලධාරී තරාතිරමෙන් ඉහළ සියලුම නිලධාරීන්ට දේශීය ප්‍රදේශ ජාලගත කිරීමේ පරිගණකය බැගින් සපයා දෙන ලදී.

මේ අතර CAA මූලස්ථානය ගොඩනැගීම සඳහා සුදුසු ඉඩම් කට්ටියක් හඳුනා ගැනීම සඳහාද යළි කටයුතු ආරම්භ කරන ලදී. පසුගිය වසර කීපය තුළ ආදායම අඩුවීමේ හේතුවෙන් මෙම කාර්ය මගහැරී තිබුණි.

සිවිල් ගුවන් සේවා නියාමන කාර්යන් සඳහා අවශ්‍ය නිපුණතා සහ ප්‍රමාණවත් පළපුරුද්ද සහිත සහ එමෙන්ම රාජ්‍ය අංශයේ සේවයට බඳවා ගැනීම සඳහා නියමකර පළකර ඇති නිර්ණායකයන් සපුරාලන දේශීය පුද්ගයින්ගේ හිඟය, සිවිල් ගුවන්සේවා අධිකාරියට, නිරුපද්‍රිතතා සහ සුරක්ෂිතතා අධීක්ෂණ කාර්යන් ඵලදායී අන්දමින් ඉටු කිරීම සමග ඍජු සම්බන්ධතාවක් සහිත වැදගත් තාක්ෂණික තනතුරු පිරවීම සඳහා පුද්ගලයින් බඳවා ගැනීමේදී මුහුණ පෑමට සිදු වී ඇති ප්‍රධානතම අභියෝගයක් වශයෙන් තව දුරටත් පැවතුණි. මේ සම්බන්ධයෙන් අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සමග අනුකූලත්වය පවත්වමින් කර්මාන්තයේ නිරුපද්‍රිතතා සහ සුරක්ෂිතතා අධීක්ෂණ කටයුතු ඵලදායී ලෙස ඉටු කිරීම ඇතුළුව CAA වෙත පැවරී ඇති නීත්‍යානුකූල කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය ශක්තිය ළඟා කර ගැනීමේ අවශ්‍යතාවට වැඩි වැදගත්කමක්, බරක් සහ ප්‍රමුඛත්වයක් ලබා දීමට සිවිල් ගුවන් සේවා අධිකාරියට සිදුවිය.

2011-2013 ඒකාබද්ධ සැලැස්මෙහි පැහැදිළි කර ඇති ව්‍යවහාර උපාය මාර්ග අනුව යමින් ඒකාබද්ධ ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගන්නා අතරතුර කාර්ය මණ්ඩලයේ වෘත්තීය විශිෂ්ඨත්වය අරභයා ඔවුනට අවශ්‍ය පුහුණුව ලබා දීමට කටයුතු කරන ලදී.

2010 ඔක්තෝබර් 24-නොවැම්බර් 04 කාලය අතරතුර ශ්‍රී ලංකාව සම්බන්ධව පවත්වන ලද නිරුපද්‍රිතතා

අධීක්ෂණ විගණනයේදී ICAO හඳුනාගන්නා ලද ඌනතා නිවැරදි කිරීම සඳහා නිවැරදි කිරීමේ වැඩ සැලසුමක් ඉදිරිපත් කරන මෙන් ශ්‍රී ලංකාවට නියම කර තිබුණි. විගණනයේදී අසන ලද විගණන සන්ධාන ප්‍රශ්න 973 ක් අතුරෙන් ශ්‍රී ලංකාව සතුටුදායක පිළිතුරු ලබා දීමට අසමත් වූ විගණන සන්ධාන ප්‍රශ්න 100 ක් පදනම් කර ගනිමින් ICAO විසින් විගණනයේදී සොයා ගත් ඌනතා 34 ක් ඉදිරිපත් කර තිබුණි. මේ අතරින් ගුවන් යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය සඳහා ස්වාධීන ආයතනයක් පිහිටුවීමට අදාළ එක් සොයාගැනීමක් සමග එකඟ නොවන බව ශ්‍රී ලංකාව ICAO වෙත දැනුම් දුන්නේය. ඉතිරි සොයා ගැනීම් 33 අතුරින් කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පුහුණුවට අදාළ එක් ඌනතාවක් සම්බන්ධව හැර ඉතිරි සියල්ල සම්බන්ධව CAA විසින් ඉදිරිපත් කරන ලද නිවරද කිරීමේ වැඩසටහන ICAO විසින් පිළිගන්නා ලදී. නිවරද කිරීමේ වැඩ පිළිවෙළ ICAO විසින් පිළි නොගන්නා ලද ඌනතාව නිවරද කිරීම සඳහා දීර්ඝ කාලීන විසඳුමක් සොයා ගැනීමට CAA විසින් කිසියම් උපක්‍රමයක් විකාශනය කළ යුතුව ඇත.

2011 අවසාන භාගය වන විට ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය එහි විශ්ව නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණන වැඩසටහනේ 2005 ආරම්භ කරන ලද පස් අවුරුදු විගණන චක්‍රය තුළ විගණනයට ලක් කරන ලද සියලුම රාජ්‍යයන්හි විගණන ප්‍රතිඵල වලට අනුව අදාළ දත්ත නිකුත් කළේය. ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර ප්‍රමිති (ICAO - SARPs) එලදායී අන්දමින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණය 87%ක් ඉක්මවන බව තක්සේරු කර තිබිණ. මෙය ලෝක සාමාන්‍යයට වඩා බෙහෙවින් ඉහළ ප්‍රතිශතයකි. ICAO විසින් නිකුත් කරන ලද සමස්ථ ප්‍රතිඵලය අනුව ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ප්‍රථම ස්ථානයටත් ආසියා ශාන්තිකර කලාපයේ රාජ්‍යයන් 34 ක් අතර 4 වන ස්ථානයටත්, ගෝලීය වශයෙන් රාජ්‍යයන් 177 ක් අතර 19 වන ස්ථානයටත් පත්වී තිබිණ. 1997 දී පවත්වන ලද තක්සේරුවකින් අනතුරුව ICAO විසින් ශ්‍රී ලංකාවට දී තිබුණු තත්වය සමග සසඳන විට මෙය විශිෂ්ඨ ජයග්‍රහණයකි.

CAA වෙත පැවරී ඇති නීත්‍යානුකූල රාජකාරි සහ කාර්යන් සහ ඒ ආශ්‍රිත රාජ්‍ය නිරුපද්‍රිතතා අධීක්ෂණ කාර්යන් ප්‍රබලකර ලෙස නොකඩවා ඉටු කිරීමේ හැකියාව, මූලික වශයෙන් CAA තුළ නිපුණතා සහිත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් උපයෝජ්‍ය වශයෙන් සිටීම මත රඳා පවතියි. සංවිධාන ව්‍යුහයෙහි ඒ ඒ තනතුරු වලට ගැළපෙන නිපුණතා සහිත නිලධාරීන් පත් නොකර CAA ට එහි කාර්යන් එලදායී අන්දමින් ඉටුකළ නොහැකිය. දැනට පවතින සහ ඉදිරියේ එල්ලවිය හැකි නානා ප්‍රකාර අභියෝග මධ්‍යයේ දැනට සාක්ෂාත් කරගෙන ඇති උසස් තත්වය නොකඩවා රඳවා ගැනීමට හැකි වීම පිණිස ඉක්මන් සහ දීර්ඝ කාලීන විසඳුමක් සොයා ගැනීම දැනට CAA මුහුණ පා ඇති විශාල අභියෝගයකි.

සමාලෝචයනට භාජනය වන වර්ෂය තුළ CAA හි කාර්ය සාධන වාර්තාවේ ඉදිරි පිටුවල සංක්ෂිප්ත වශයෙන් දක්වා ඇත.

මෙම කාර්යාලය වෙත පැවරී ඇති කාර්යන් ඉටු කිරීම සඳහා මෙම කාර්යාලයට පළ කරන ලද නොමසුරු සහය සහ ලබා දුන් ධෛර්ය සහ සහයෝගය වෙනුවෙන් සිවිල් ගුවන් සේවා පිළිබඳ ගරු අමාත්‍යතුමන්ටත් එතුමන්ගේ ලේකම් තුමන්ට සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ සමස්ථ කාර්ය මණ්ඩලයටත්, සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපතිතුමන්ට සහ අධ්‍යක්ෂ මණ්ඩලයටත් ස්තුති කිරීමට මම මෙම අවස්ථාව යොදා ගනිමි. ඉදිරි පිටුවල සාරාංශ ගත කර ඇති ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා ලබා දුන් දායකත්වය වෙනුවෙන් සිවිල් ගුවන් සේවා අධිකාරියේ සමස්ථ කාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය පිරිනමමි.



**එච් එම් සී නිමල්සිරි**
**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ**
**ප්‍රධාන විධායක නිලධාරී**

# පැතිකඩ

## හැඳින්වීම

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ වර්ෂ 2002 දෙසැම්බර් මස 27 වන දින ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) පිහිටුවන ලදී. එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය යටතේ අදාළ විගණන කාර්යයන් සඳහා රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වශයෙන් සළකණු ලැබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි මූලික කාර්යය භාර්යය වනුයේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් සම්මත කරන ලද ජාත්‍යන්තර ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් අනුගමනය කරමින් සහ 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු කරමින් සිවිල් ගුවන් සේවාවෙහි නිරුපද්‍රිතතාවය සහ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාකාරකම් ඉටු කිරීම සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්වය නගා සිටුවමින් ශ්‍රී ලංකාවේ ගුවන් සේවා අංශය ජාතික ආර්ථික වර්ධනයේ ප්‍රධාන දායක අංශයක් බවට පත් කරවීමය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සාමාජිකයන් අට (08) දෙනෙකුගෙන් සමන්විත වේ.

ඒ අතරින් පස් (05) දෙනෙකු පත් කරනු ලබන්නේ සිවිල් ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයා විසිනි.

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නියෝජිතයෙකු සහ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා නිල බලයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරියට පත් වන සාමාජිකයෝ වෙති.

අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන්ගේ නිල කාලය පත් කරනු ලබන දිනයේ සිට වසර තුනක් (3) වේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සිවිල් ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයාගේ මග පෙන්වීමට හා පාලනයට යටත්ව කටයුතු කරයි. දැනට එම අමාත්‍යවරයා වනුයේ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයාය.

## CAASL සාමාජිකයින්

අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් :

- එයාර් චීෆ් මාර්ෂල් ඩබ්ලිව්.ඩී.ආර්.එම්.ජේ. ගුණතිලක (සභාපති)
- ජේ.එම්.එස්.ඩබ්ලිව්. ජයසුන්දර මහතා (උප සභාපති)
- කේ.වී.එන්. ජයවර්ධන මහතා (සාමාජික)
- සාකී අලීෆ් මහතා (සාමාජික)
- දිනේෂ් ගාල්ලගේ මහතා (සාමාජික)

නිල බලයෙන් පත් වූ සාමාජිකයින් :

- ආරක්ෂක ලේකම් (ගෝඨාභය රාජපක්ෂ මහතා)
- මුදල් අමාත්‍යාංශයේ නියෝජිත (ඩබ්ලිව්.අයි. තිසේරා මහතා)
- සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් (එච්.එම්.සී. නිමල්සිරි මහතා)



## සභාපති

## එයාර් චීෆ් මාර්ෂල් ඩබ්ලිව්.ඩී.ආර්.එම්.ජේ. ගුණතිලක
RWP & bar, VSV, USP, ndc, psc

එයාර් චීෆ් මාර්ෂල් ඩබ්ලිව්.ඩී.ආර්.එම්.ජේ. ගුණතිලක මහතා බම්බලපිටිය සාන්ත පීතර විදුහලෙන් අධ්‍යාපනය ලැබූ අතර එහිදී අධ්‍යාපන කටයුතු වලදී මෙන්ම ක්‍රීඩා අංශයේදීද විශිෂ්ඨ දක්ෂතා දැක්වීය. ඔහු ශ්‍රී ලංකාවේ පස්වන ගුවන් හමුදාපති එයාර් චීෆ් මාර්ෂල් හැරී ගුණතිලකගේ වැඩිමහල් පුතණුවන් වේ.

ඔහු 1978 ජනවාරි මස 13 වන දින පොදු රාජකාරී නියමු ශාඛාවෙහි ශිෂ්‍ය භට නිලධාරියෙකු වශයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි සේවයට බැඳුනේය. සාර්ථක පියසර පුහුණුවකින් පසු 1979 යේ අගෝස්තු මස 24 වන දින ගුවන් නියමු නිලධාරියෙකු (Pilot Officer) වශයෙන් අධිකාරියට පත් විය. ඔහු ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි විසි අට(28) වසරක කීර්තිමත් සේවා කාලය තුළ විධායක, මෙහෙයුම් සහ පරිපාලන තනතුරු ගණනාවක් හොබවා ඇත. ස්තම්භ තටු (Fixed wing) සහ භ්‍රමණ තටු (Rotary wing) ගුවන් යානා දෙවර්ගයේම පියසර පැය විශාල සංඛ්‍යාවක් සටහන් කරමින් ඔහු අංක 03 නාවුක බලගණයේ  අණ දෙන නිලධාරී වශයෙන්ද අංක 04 හෙලිකොප්ටර් පක්ෂාංගයෙහි අණ දෙන නිලධාරී වශයෙන්ද මෙහෙයුම් නියමුවෙක් වශයෙන් කටයුතු කළේය. අනතුරුව ඔහු ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් විධායක තනතුරු වන උතුරු කලාපයේ කලාප අණ දෙන නිලධාරී වශයෙන්ද, නැගෙනහිර කලාපයේ කලාප අණ දෙන නිලධාරී වශයෙන්ද කටයුතු කළේය.

තව දුරටත් ඒ මහතා කටුනායක, අනුරාධපුරය සහ චීන වරාය ගුවන් හමුදා කඳවුරු භාර අණ දෙන නිලධාරී වශයෙන්ද කටයුතු කර ඇත. ඔහු ගුවන් හමුදාවේ මෙහෙයුම් අධ්‍යක්ෂ, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී - මෙහෙයුම් සහ අනතුරුව මාණ්ඩලික ප්‍රධානී තනතුරු දරමින් ගත කළ අතිශයෙන් සාර්ථක සේවා කාලයකින් පසු 2006 ජුනි මස 11 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 12 වන ගුවන් හමුදාපති වශයෙන් රාජකාරී භාර ගත්තේය. 2011 පෙබරවාරි මස 28 වන දින ගුවන් හමුදාපති තනතුරෙන් විශ්‍රාම ලැබූ ගුණතිලක මහතා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී වශයෙන් පත් කරනු ලැබීය.

2009 මැයි මස 18 වන දින, එතෙක් ක්‍රියාත්මක වූ මානුෂික මෙහෙයුම සාර්ථක ලෙස සම්පූර්ණ වීමත් සමග අතිගරු ජනාධිපතිතුමන් විසින් ගුණතිලක මහතාගේ වටිනා සේවය අගයමින් ඔහු එයාර් චීෆ් මාර්ෂල් නිලයට උසස් කරන ලදී. මෙම උසස් වීම වඩාත්ම විශේෂිත වන්නේ සක්‍රිය රාජකාරියෙහි නිරතව සිටින අතරතුර එයාර් චීෆ් මාර්ෂල් නිලයට උසස් කරනු ලැබූ එකම ගුවන් හමුදාපතිවරයා ඔහු වීමයි.

2009 ඔක්තෝබර් මස 05 වන දින අතිගරු ජනාධිපතිතුමන් විසින් ඔහු ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි සභාපති වශයෙන් පත් කරන ලදී. ඔහුට මෙම තනතුර භාර දෙන ලද්දේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි ගුවන් හමුදාපති තනතුරට අමතරවය. මෙම තනතුරු දෙකටම අමතරව ඒ මහතාට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී තනතුරේ වගකීම් ඉටු කිරීමද පැවරී ඇත.

එයාර් චීෆ් මාර්ෂල් ගුණතිලක 1994 දී ඇමරිකා එක්සත් ජනපදයෙහි ඇලබාමා ගුවන් සරසවියෙහි ගුවන් විධාන සහ මාණ්ඩලික විද්‍යාලයෙන් උපාධි ලබා ගත්තේය. ඒ මහතා 2001 වර්ෂයේදී පකිස්තානයේ සුප්‍රසිද්ධ ජාතික ආරක්ෂක විද්‍යාලයෙන්ද අධ්‍යාපනය ලබා ඇත. ඔහුගේ කීර්තිමත් සේවා කාලය ඇගයීමක් වශයෙන් රජය විසින් ඔහුට "උත්තම සේවා" පදක්කම පිරිනමා ඇති අතර අවස්ථා දෙකකදී ක්‍රියාන්විතයන්හි නිරත වෙමින් සතුරා ඉදිරියෙහි ප්‍රදර්ශනය කරන ලද නිර්භීත භාවය වෙනුවෙන් ඔහු "රණ වික්‍රම" පදක්කමෙන් ද පිදුම් ලබා ඇත.



## උප සභාපති
## ජේ.එම්.එස්.ඩබ්ලිව්. ජයසුන්දර මහතා

මහනුවර ධර්මරාජ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ ජේ.එම්.එස්.ඩබ්ලිව්. ජයසුන්දර මහතා විශිෂ්ඨ ක්‍රීඩකයෙක් විය. 1971 වර්ෂයේදී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණු ඒ මහතා වසර 37 ක නොකැළැල් සේවා කාලයකින් පසු නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වශයෙන් විශ්‍රාම ලැබීය. ඔහුගේ කිර්තිමත් සේවා කාලය ඇතුළත පුහුණුව සඳහා ජපානයට, මැලේසියාවට, ස්කොට්ලන්ඩ්යාර්ඩ් පොලීසියට සහ ඇමරිකා එක්සත් ජනපදයට ගොස් ඇත. ඒ මහතා ජාත්‍යන්තර පොලිස් සම්මේලනයෙහි යාවජීව සමාජිකයෙක්ද වෙයි. සී/ස ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමෙහි විශේෂ කාර්යය අධ්‍යක්ෂවරයා වූ ඒ මහතා අනතුරුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි උප සභාපති සහ සාමාජිකයෙකු වශයෙන් වැඩ භාර ගත්තේය.



## ගෝඨාභය රාජපක්ෂ මහතා- RWP,RSP
## ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්
## (නිල බලයෙන් පත්වූ සාමාජික)

ගෝඨාභය රාජපක්ෂ මහතා- RWP,RSP කොළඹ ආනන්ද විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබුවේය. අනතුරුව දියතලාව හමුදා පුහුණු මධ්‍යස්ථානයෙහි පුහුණුව ලත් ඒ මහතා 1972 මැයි මස 26 වන දින ශ්‍රී ලංකා සංඥා බලකායෙහි අධිකාරියට පත් කරනු ලැබ ඇත.

පසුව 1974 දී ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවටත් 1980 දී රජරට රයිෆල්ස් බලකායටත් 1983 දී ගජබා රෙජිමේන්තුවටත් මාරු කරනු ලැබීය. 1991 දී ලූතිනන් කර්නල් නිලයෙන් කාලයට පෙර විශ්‍රාම ලබන තුරු ඔහු ගජබා රෙජිමේන්තුවේ සේවය කළේය. සිය කීර්තිමත් හමුදා කාලය තුළ ඒ මහතා ඉන්දියාවේ වෙලින්ටන් ආරක්ෂක සේවා මාණ්ඩලික විද්‍යාලයෙහි පාඨමාලාවක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ පාබල නිලධාරීන් සඳහා වූ උසස් පාඨමාලාව ඇතුළු ඉතා වැදගත් පුහුණු පාඨමාලා ගණනාවකට සහභාගී වී ඇත. රාජපක්ෂ මහතා වඩමාරච්චි මෙහෙයුමට සහභාගී වූ රණවිරුවෙකි. මෙම මෙහෙයුමේදී ඔහු ගජබා රෙජිමේන්තුවේ පළමු වන බල ඇණියට අණ දුන්නේය.

1990 දී ක්‍රියාත්මක කරන ලද "ත්‍රිවිධ බලය" සහ "ජයශක්ති" මෙහෙයුම් වලදීද ඔහු මෙකී බලඇණිය අති සාර්ථක ලෙස මෙහෙයවීය. ඔහු කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයෙහි නියෝජ්‍ය සේනාවිධායක වශයෙන්ද කටයුතු කර ඇත. රාජපක්ෂ මහතාගේ කීර්තිමත් කැපී පෙනෙන සහ සාර්ථක හමුදා සේවය වෙනුවෙන් ඔහු "රණවික්‍රම" සහ "රණශූර" පදක්කම්වලින් පිදුම් ලබා ඇත.



## එච්.එම්.සී. නිමල්සිරි මහතා
## සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
## (නිල බලයෙන් පත්වූ සාමාජික)

එච්.එම්.සී. නිමල්සිරි මහතා වර්ෂ 2002 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ආරම්භයේ පටන්ම එහි සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් කටයුතු කරයි. 1987 සිට එවකට පැවති ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා දෙපාර්තුමේන්තුවෙහි සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම්) වශයෙන් කටයුතු කර ඇති ඒ මහතා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියටද මහත් ශක්තියක් වී ඇත. නිමල්සිරි මහතා සිවිල් ගුවන් සේවාවට අදාළ නව නෛතික රාමුව කෙටුම්පත් කිරීමට පුරෝගාමීව කටයුතු කළ නිලධාරීන් කිහිප දෙනාගෙන් එක් අයෙකි. පසු කලෙක සිවිල් ගුවන් සේවා අධිකාරිය පිහිටුවීමටත්, නව සිවිල් ගුවන් සේවා පනත හඳුන්වා දීමටත් මුල් වූ ආයතනික ප්‍රතිසංස්කරණ සිවිල් ගුවන් සේවා දෙපාර්තුමේන්තුවට හඳුන්වා දුන්නේ නිමල්සිරි මහතාය.

ගුවන් ප්‍රවාහනය, ගුවන් සේවා නිරුපද්‍රිතතාව සහ ගුවන් සුරක්ෂිතතාවය, ගුවන් සංතරණ සේවා, නිරුපද්‍රිතතා විගණනය සහ නිරුපද්‍රිතතා කළමණාකරණ ක්‍රම ආදියට අදාළ පුහුණු පාඨමාලා ගණනාවක් හදාරා ඇති නිමල්සිරි මහතා සතුව සිවිල් ගුවන් සේවාව පිළිබඳ පුළුල් දැනුමක් හා පළපුරුද්දක් ඇත. සිවිල් ගුවන් සේවාව පිළිබඳ විවිධ කලාපීය හා ජාත්‍යන්තර සම්මේලන රාශියකට සහභාගී වී ඇති ඔහු පෙර පැවති සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව සහ අනතුරුව සිවිල් ගුවන් සේවා අධිකාරිය නියෝජනය කරමින් විදේශ රාජ්‍යයන් සමග පවත්වන ලද ද්වි පාර්ශවීය ගුවන් සේවා ගිවිසුම් නිගමනය කිරීමේ සාකච්ඡා ගණනාවකටද සහභාගී වී ඇත. 2007 වර්ෂයේ දී ඔහු ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය යටතේ ක්‍රියාත්මක වන (COSCAP-SA) වැඩසටහනෙහි කලාපීය වැඩසටහන් සමායෝජක වශයෙන් වසර 03 ක කාලයක් සඳහා ICAO සංවිධානයට ද්විතීයනය කරනු ලැබීය. ශ්‍රී ලංකා රජය ඔහුට මේ සඳහා නිවාඩු දුන්නේය.

කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (BSc) උපාධියක් ලබා ඇති නිමල්සිරි මහතා ඊට අමතරව එම විශ්ව විද්‍යාලයෙන්ම පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MSc) උපාධියක්ද ලබා ඇත. එමෙන්ම ඔහු රුසියාවේ යුලිනොව්ස්ක් හි පවත්වන ලද පුහුණු පාඨමාලාවක් හැදෑරීමෙන් පසු පියසර මෙහෙයුම් නිලධාරී බලපත්‍රයක්ද ලබා ඇත. ඒ මහතා ගුවන් සේවාව එක් විෂය ධාරාවක් වශයෙන් පවතින විශේෂ විද්‍යාවේදී (BSc) උපාධි පාඨමාලාවක් පවත්වන මොරටුව විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යය වරයෙකු වශයෙන් ද කටයුතු කරයි.

ආසියා - ශාන්තිකර කලාපයේ රාජ්‍යයන්හි ගුවන් සංතරණ කාර්යයන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ICAO යටතේ ක්‍රියාත්මක වන ආසියා-ශාන්තිකර ගුවන් සංතරණ සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ සංසදයේ (APANPRIG) දෙවන සභාපතිවරයා වශයෙන් ද ඒ මහතා තෝරා ගනු ලැබ ඇත.



## ඩබ්ලිව්.අයි. තිසේරා මහතා
## මුදල් අමාත්‍යංශයේ නියෝජිත
## (නිල බලයෙන් පත් වූ සාමාජික)

අයිවන් තිසේරා මහතා 1982 වර්ෂයේ රජයේ ගණකාධිකාරීවරයෙකු වශයෙන් ඔහුගේ වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. ඔහු 1982 සිට 1993 දක්වා බදුල්ල කච්චේරියේ ගණකාධිකාරී ලෙස සේවය කර ඇත. 1993 දී නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් උසස් කරනු ලැබූ ඒ මහතා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අනියුක්ත කරනු ලැබීය.

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ සේවය කළ කාලය තුළ මුදල් කළමණාකරණය, ආදායම් ආදී විවිධ විෂය ක්ෂේත්‍රයන්හි සේවය කිරීමට ඔහුට අවස්ථාව ලැබී ඇත. එම කාලය තුළ ඔහු අදාළ කමිටුවේ සභාපති වරයා වශයෙන් රජයේ නිශ්චල වත්කම් කළමණාකරණයට අදාළව නව මගපෙන්වීම් මාලාවක් සකස් කර ඉදිරිපත් කළේය. ඊට අමතරව ඔහු ශ්‍රී ලංකා යුධ හමුදාවේ මූල්‍ය කළමනාකරණ ක්‍රමය පිළිබඳ සුපර්යාප්ත අධ්‍යයන වාර්තාවක්ද ඉදිරිපත් කළේය. 2000 ජනවාරි මාසයේදී තිසේරා මහතා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි (SLIDA) මූල්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයෙහි ජ්‍යෙෂ්ඨ උපදේශක සහ ප්‍රධානියා වශයෙන් පත් කරනු ලැබීය. 2004 දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපාධි අපේක්ෂක අධ්‍යාපනයෙහි අදාළත්වය සහ තත්වය වර්ධනය කිරීමේ (IRQUE) ප්‍රතිසම්පාදන විශේෂඥ තනතුර ඒ මහතාට පිරිනමා ඇත. 2004 ඔක්තෝබර් මාසයේදී ජාතික ප්‍රතිසම්පාදන නියෝජිත ආයතනය ආරම්භ කළ විට තිසේරා මහතා එහි ධාරිතා වර්ධනය, පර්යේෂණ හා සංවර්ධන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා වශයෙන් තෝරා ගන්නා ලදී. තිසේරා මහතා පොදු ප්‍රතිසම්පාදනය සම්බන්ධ දේශීය විශේෂඥභාවය වර්ධනය කිරීම සඳහා "පොදු ප්‍රතිසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය" පිළිබඳ නව ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දී ඇති අතර රාජ්‍ය නිළධාරීන් දහස් ගණනකට පුහුණුව ලබා දී ඇත. ජාතික ප්‍රතිසම්පාදන නියෝජිත ආයතනය වසා දැමීමෙන් පසු එහි කටයුතු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ආපසු මාරු කරන ලද අතර තිසේරා මහතා ප්‍රතිසම්පාදන කළමණාකරනය භාර අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් පත් කරනු ලැබීය. අනතුරුව 2011 ජනවාරි මාසයේ සිට ඔහු මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශ ආධාර සහ අයවැය අධීක්ෂණ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කරනු ලැබ ඇත.

අයිවන් තිසේරා මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී "ආර්ථික විද්‍යා" [BA-Econ(Hons)] උපාධිධාරියෙකු වන අතර ඔහුගේ වාණිජ සහ ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති (Master & Commerce & Economics) උපාධිය ලබා ගෙන ඇත්තේ ඕස්ට්‍රේලියාවේ වොලෝන්ගොන්ග් විශ්ව විද්‍යාලයෙන්ය. ඔහු රාජ්‍ය මුදල් සහ සංවර්ධන ගණකාධිකරණ ආයතනයෙහි යාවජීව සාමාජිකයෙකි. දැනට ඒ මහතා ලංකා ගමනාගමන මණ්ඩලයේත්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේත්, සිවිල් ගුවන් සේවා අධිකාරියේත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරයි.



## කේ.වී.එන්. ජයවර්ධන මහතා

ජයවර්ධන මහතා 1983 දී ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී ඇත. 1990-1991 වර්ෂයේදී ගුවන් සහ අවකාශ නීතිය පිළිබඳ විශේෂඥභාවය සහිතව ලන්ඩන් සරසවි විද්‍යාලයෙන් ලබාගත් පොදු ජාත්‍යන්තර නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (Master's Degree) ඒ මහතා සතුව ඇත. 1998 සිට 2005 දක්වා නීතිපති දෙපාර්තුමේන්තුවේ ගුවන් නීති අංශයේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් කටයුතු කළ ජයවර්ධන මහතා සතුව ගුවන් නීතිය පිළිබඳ පුළුල් දැනුමක් හා හසළ පළපුරුද්දක් ඇත. පෙර පැවති සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ නීති උපදේශක වශයෙන් කටයුතු කළ ජයවර්ධන මහතා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත හා නව සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත සකස් කිරීමේ කාර්යයට සක්‍රියව දායක විය. විවිධ විදේශ රාජ්‍යයන් සමග පවත්වන ලද ද්විපාර්ශවීය ගුවන් සේවා ගිවිසුම් නිගමනය කිරීමේ සාකච්ඡා වලට සහභාගී වෙමින් ඔහු ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ නීති උපදේශක වශයෙන් කටයුතු කර ඇත.

තවදුරටත් ඔහු 1996 සිට රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිශෝධන කොමිසමේ නීති උපදේශක කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කර ඇත. ජයවර්ධන මහතා 2007 අංක 07 දරණ සමාගම් පනත නීතිගත වීමට මුල් වූ සමාගම් නීති ප්‍රතිශෝධන ක්‍රියාවලියට ද සහභාගී විය.

නීති කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේදී ලබා දුන් විශේෂ දායකත්වය සැලකිල්ලට ගනිමින් 1998 අගෝස්තු මාසයේදී ඔහු සමාගම් නීති උපදේශක කොමිසමේ සමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීය. ඒ මහතා මේ වන තුරුත් මෙම තනතුරේ සේවය කරයි. ඔහු කොළඹ හිල්ටන් හෝටලය අයිති සී/ස හොටෙල් ඩිවෙලොප්පර්ස් (ලංකා) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද සේවය කරයි. ඒ මහතා සී/ස මිල්කො (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද, සී/ස ලංකා ස.තො.ස සමාගමේ අධ්‍යක්ෂ සහ ආරම්භක සභාපති වශයෙන් ද කටයුතු කර ඇත.



## සාකි අලිෆ් මහතා

සාකි අලිෆ් මහතා ස්ටැසන් සමූහ ව්‍යාපාරයේ (Stassen Group of Companies) අධ්‍යක්ෂවරයෙකි. ඔහු දඹදෙණියේ සංවර්ධන පදනමේ සභාපතිවරයා ද වේ. මීට අමතරව ඒ මහතා හම්බන්තොට සංවර්ධන පදනමේ කළමනාකරණ භාරකාර පදවිය ද දරයි.



## දිනේෂ් ගාල්ලගේ මහතා

දිනේෂ් ගාල්ලගේ මහතා මූලික අධ්‍යාපනය ලැබුවේ ගාල්ල මහින්ද විද්‍යාලයෙන්ය. ඔහුට මොරටුව විශ්ව විද්‍යාලයෙන් ලබාගත් ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාවේදී [BSc(Hons)] උපාධියක් ඇත. ඒ මහතා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) විසින් පිළිගන්නා ලද වරලත් ඉංජිනේරුවරයෙකි. ඔහු දැනට රුහුණු විශ්ව විද්‍යාලයේ MBA උපාධියක් සඳහා උගනමින් සිටියි.

දිනේෂ් ගාල්ලගේ මහතා ඔහුගේ වෘත්තීය ජීවිතය ආරම්භ කලේ නව තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ පර්යේෂණ ඉංජිනේරුවරයෙකු වශයෙන් 1999 වර්ෂයේදී ය. අනතුරුව ඔහු ජෛව විද්‍යා සේවා ඉංජිනේරුවරයෙකු වශයෙන් සී/ස ජෙනරල් සේල්ස් සමාගමට සම්බන්ධ වී ඇත. ඔහු දත්ත සන්නිවේදනය පිළිබඳ මූලික පුහුණුව සහ පළපුරුද්ද ලබාගෙන ඇත්තේ ඉංජිනේරුවරයෙකු වශයෙන් සී/ස සන්ටෙල් සමාගමේ සේවය කරන අතරතුරදීය.

2001 වර්ෂයේදී ඔහු සන්ටෙල් සමාගමෙන් ඉල්ලා අස්වී කලාපීය කළමණාකරුවකු වශයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට බැඳී පසුව එම ආයතනයේ මෙහෙයුම් හා නඩත්තු කළමණාකරු වශයෙන් පත් කරනු ලැබ ඇත. 2008 වර්ෂයේදී ගාල්ලගේ මහතා එහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වශයෙන් උසස් කරනු ලැබ ඇත. ඔහු දැනට එහි දකුණු පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වශයෙන් සේවය කරයි. ඔහු රුහුණු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු අධ්‍යයනය අංශයෙහි බාහිර සාමාජිකයෙකි. ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) බද්ධ සාමාජිකයෙක් ද වෙයි.

# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි (CAASL) පාලනය හා වගකීම්

## අධිකාරියේ කාර්යය භාරය

**අධිකාරියේ ප්‍රධාන කාර්ය භාරයට අයත් කාර්යයන් අතර පහත සඳහන් දෑ ප්‍රමුඛ තාවයක් ගනී.**

❖ සිවිල් ගුවන් සේවා අධිකාරියේ සැලසුම් තුළින් අමාත්‍යවරයාගේ සහ රාජ්‍ය අංශයේ හවුල් කරුවන් ගේ අදහස් පිළිබිඹු වන බවට සහතික වීම සඳහා අදාළ පාර්ශවයන් සමග අදහස් හුවමාරු කර ගැනීම.

❖ සිවිල් ගුවන් සේවා අධිකාරියේ රාජකාරි සහ කාර්යයන් ඉටු කළ හැකි සුදුසුකම් සහ නිපුණතා සහිත පුද්ගලයන් සේවයට බඳවා ගැනීම සහ ඔවුන්ගේ වේතන ඇතුළු සේවා කොන්දේසි නිශ්චය කිරීම.

❖ සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි ප්‍රතිපත්ති සහ ඉලක්ක පිහිටුවීම සහ සිවිල් ගුවන් සේවා අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සංවිධානමය කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

❖ නිශ්චිත අරමුණු ඉටු කර ගැනීම සඳහා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරි වෙත වගකීම් පවරා දීම.

❖ සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ අමාත්‍යවරයා වෙත වගකීම

❖ අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යන බවට සහතික වීම.

## සංවිධාන ව්‍යුහය

ප්‍රතිපත්තිමය තිරණ ගැනීමේදී ඒ සඳහා පුළුල් පාරාශයක දැනුම අවශ්‍ය වන හෙයින් අධිකාරිය සමන්විත වන්නේ ව්‍යාපාරික, නෛතික සහ ගුවන් සේවා ආදී විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීන සහ හසල අත්දැකීම් සහිත සාමාජිකයන්ගෙනි. අධිකාරියට පත් කරනු ලැබූ පසු එම සාමාජිකයන් සියළු දෙනා අධිකාරියේ පරම යහපත උදෙසා එක්සත්ව සහ එකමුතුව කටයුතු කළ යුතු අතර අධිකාරිය විසින් ගනු ලබන තීරණ සම්බන්ධයෙන් සාමුහිකව වගකීම් දරමින් අධිකාරියේ පාලන කටයුතු පසුපස එක්සත්ව කටයුතු කළයුතු බවත් තනි තනිව පාලන කටයුතු කළ නොහැකි බවත් පිළිගත යුතුය.

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පත් කරනු ලබන අතර ඔහු සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා ද වන්නේය. හෙතෙම අමාත්‍ය මණ්ඩලය විසින් නිගමනය කරනු ලබන රැකියා කොන්දේසි සහ නියමයන්ට යටත් වෙමින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක් යටතේ හෝ එම පනත මගින් හෝ එවැනි වෙනත් ලිඛිත නීතියක් මගින් හෝ ඔහුට පවරන ලද රාජකාරී හා කාර්යයන් ඉටු කළ යුතුය. අධිකාරියේ කාර්යයන් සම්බන්ධව සාමාන්‍ය පරිපාලනය ද ඔහු වෙත පැවරී ඇත. අධිකාරිය විසින් ප්‍රධාන විධායක නිලධාරීවරයාට බලතල හා රාජකාරි පවරා දෙමින් සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි අරමුණු ඉටු කර ගැනීම සඳහා ඔහු මෙහෙයවනු ලැබේ.

## අධිකාරියේ කමිටු

නිශ්චිත වු කාර්යයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම පිණිස අධිකාරිය විසින් කාර්යය මණ්ඩල කමිටුව, මූල්‍ය කමිටුව, සැලසුම් කමිටුව, විගණන කමිටුව සහ සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව වශයෙන් හඳුන්වනු ලබන ස්ථාවර කමිටු (05) පිහිටුවා ඇත. අධිකාරිය විසින්

නිශ්චය කරන ලද අරමුණු ඉටුකිරීම් වශයෙන් ලබා ඇති ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ වගකීම එකිනෙක කමිටු වෙත පවරා ඇත.

## කාර්යය මණ්ඩල කමිටුව

**කාර්යය මණ්ඩල කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.**

1) සංවිධාන ව්‍යුහයක් සම්මත කිරීම සහ අවශ්‍ය තන්හි, අවශ්‍ය අවස්ථාවන්හි එහි සංශෝධන සිදු කිරීම.
2) සේවක සංඛ්‍යාව සහ වැටුප් නිශ්චය කිරීම.
3) තෝරා ගැනීම්, බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම්, තනතුරෙන් පහත දැමීම්, විශ්‍රාම ගැන්වීම්, සේවය අවසන් කිරීම් ආදී කාර්යය මණ්ඩලයට අදාළ කටයුතු.
4) කාර්යය මණ්ඩල විනය කටයුතු.
5) CAASL හි වාර්ෂික වැඩසටහන අධීක්ෂණය කිරීම.
6) CAASL සඳහා පරිපාලන නීති රීති කාර්යය පටිපාටි විකාශනය කිරීම.
7) CAASL හි කාර්යය මණ්ඩලය සඳහා විනය කාර්යය පටිපාටි විකාශනය කිරීම.
8) CAASL සඳහා කාර්යයාල පටිපාටි විකාශනය කිරීම.
9) CAASL හි කාර්යය මණ්ඩලයට ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම.
10) සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්යය මණ්ඩලය සඳහා කාල පූර්ව විශ්‍රාම ගැනීම වෙනුවෙන් වන්දි යෝජනා ක්‍රම විකාශනය කිරීම.
11) CAASL හි කාර්යය මණ්ඩලය සඳහා සමාජ සහ සුභසාධන යෝජනා ක්‍රම විකාශනය කිරීම.

**කාර්යය මණ්ඩල කමිටුව සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සැදුම් ලබයි.**

1. එයාර් චීෆ් මාර්ෂල් ඩබ්ලිව්.ඩී.ආර්.එම්.ජේ. ගුණතිලක (සභාපති)
2. එච්.එම්.සී. නිමල්සිරි මහතා - DGCA/CEO
3. කේ.වී.එන්. ජයවර්ධන මහතා - සාමාජික

## මූල්‍ය කමිටුව

**මූල්‍ය කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.**

1) වාර්ෂික අයවැය වැඩ සටහන සකස් කිරීම
2) CAASL සඳහා මූල්‍ය නීති සහ කාර්යය පටිපාටි විකාශනය කිරීම.
3) උපකරණ පහසුකම් හෝ සේවා මිලදී ගැනීම් අධීක්ෂණය කිරීම
4) CAASL හි ආදායම් මාර්ග අධීක්ෂණය කිරීම සහ
5) CAASL හි සකසුරුවම් කළමණාකරණය

**මූල්‍ය කමිටුව සිවිල් ගුවන් සේවා අධිකාරියේ පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සැදුම් ලබයි.**

1. එයාර් චීෆ් මාර්ෂල් ඩබ්ලිව්.ඩී.ආර්.එම්.ජේ. ගුණතිලක (සභාපති)
2. එච්.එම්.සී. නිමල්සිරි මහතා - DGCA/CEO
3. ඩබ්ලිව් අයි. තිසේරා මහතා - මුදල් අමාත්‍යාංශයේ නියෝජිත

## සැලසුම් කමිටුව

**සැලසුම් කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.**

1) ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තිය විකාශනය කිරීම
2) ජාතික සිවිල් ගුවන් සේවා සංවර්ධන සැලසුමක් විකාශනය කිරීම
3) සිවිල් ගුවන් සේවාවට අදාළ මූලික සහ උපකාරක නීති සමාලෝචනය කිරීම හා අවශ්‍ය තන්හි සංශෝධන හඳුන්වා දීම
4) ජාතික සිවිල් ගුවන් සේවා සුරක්ෂිතතා වැඩ සටහන ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම
5) ජාතික ගුවන් ප්‍රවාහන සුසාධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම
6) සිවිල්-හමුදා සමායෝජනය අධීක්ෂණය කිරීම
7) ගුවන් සේවා මෙහෙයුම් අධීක්ෂණය කිරීම සහ
8) ගගන නාවික සේවා සැපයුම් කරුවන්ගේ කාර්යයන් අධීක්ෂණය කිරීම

අධිකාරියේ සාමාජිකයින් අට(08) දෙනාම සැලසුම් කමිටුවට ඇතුළත් වේ.

## විගණන කමිටුව

විගණන කමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය වෙත වගකීමට බැඳී ඇත.

1) අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම නිශ්චය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම.

2) සංවිධානයේ සියලුම කාර්යයන් සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කිරීම හා ඇගයීම

3) පිරිවැය ඵලදායිතාවය ද නාස්තිකර වියදම් වැලැක්වීම ද අරමුණු කර ගනිමින් සමාන කාල අන්තරයන් හිදී කාර්යය සාධනය සමාලෝචනය කිරීම.

4) බාහිර ගණන් පරීක්ෂකවරුන් සමග සම්බන්ධතාවය පැවැත්වීම සහ විගණකාධිපතිගේ කළමණාකරණ ලිපි අනුව කටයුතු කිරීම.

5) ව්‍යවස්ථා, රෙගුලාසි, රීති හා චක්‍රලේඛ ආදියට අනුකූලව කටයුතු කරන්නේදැයි නිශ්චය කිරීම.

6) ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.

7) නිවැරදි කිරීම් ක්‍රියා මාර්ග ගැනීම සඳහා අභ්‍යන්තර විගණනය /බාහිර විගණන වාර්තා හා කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම

8) රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ නිර්දේශ /නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම

9) වාර්ෂික වාර්තාවට ඇතුල් කිරීම සඳහා කමිටුවේ සොයා ගැනීම් පිළිබද වාර්තාවක් සකස් කිරීම සහ

10) අධිකාරිය විසින් සකස් කරන ලෙස ඉල්ලා සිටි විට සියලුම විගණන කාර්යයන් සම්බන්ධව අධිකාරිය වෙත වාර්තා කිරීම.

විගණන කමිටුව පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සැදුම් ලබයි.

1. ඩබ්ලිව්.අයි. තිසේරා මහතා - මුදල් අමාත්‍යංශයේ නියෝජිත (සභාපති)
2. සරත් ජයසුන්දර මහතා - උප සභාපති
3. දිනේෂ් ගාල්ලගේ මහතා
4. එස්.එම්. චන්ද්‍රපාල මහතා - සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ නියෝජිත.

## සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව (CADEC)

සිවිල් ගුවන් සේවා කාර්යයන් පිළිබඳව පොදු ජනතාව තුළ ඇති දැනුම වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් විශේෂ වැඩසටහන් සැලසුම් කිරීම, විකාශනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි පහත නම් සඳහන් සේවකයින්ගෙන් සමන්විත සිවිල් ගුවන් සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව පිහිටුවන ලද්දේ 2010 අගෝස්තු මාසයේදී ය. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී මෙම කමිටුවේ සභාපතිත්වය දරණ අතර ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ (ඒකාබද්ධ) ඔහුට සහය වෙයි.

1. දේව් කව්සල සමරජීව මහතා - උප සභාපති
2. ගිම්හාන් දබරේරා මහතා - ලේකම්
3. මංජුලා වික්‍රමනායක මහත්මිය - භාණ්ඩාගාරික

### සාමාජිකයින්

4. දුලාංජලී මාපිටියගේ මහත්මිය
5. සී.එච්. කොඩිතුවක්කු මහත්මිය
6. නිලන්ත තෙන්නකෝන් මහතා
7. ටී.එම්.වයි.බී. තෙන්නකෝන් මහතා
8. ජී.ඊ. මිල්ලවිතානච්චි මහත්මිය
9. එම්.එච්.අයි.කේ. ගුණවර්ධන මහතා
10. එස්.සී.බී. වත්තේවැව මහතා
11. රවීන් තලගල මහතා

## හවුල්කරුවන් සමග සම්බන්ධතා පැවැත්වීම

විශේෂයෙන්ම සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ ගරු අමාත්‍යවරයාගේ අපේක්ෂාවන් සම්බන්ධව දැනුවත්ව සිට ඒ අනුව කටයුතු කිරීම සඳහා හවුල්කරුවන් සමග සම්බන්ධතාව පවත්වා ගැනීම එහි වගකීම බව අධිකාරිය පිළිගන්නේ ය.

## වගකිව යුතු බව

උපායමාර්ගික අරමුණු කරා යන ගමනේ ප්‍රගතිය සමාලෝචනය කිරීමටත් සිවිල් ගුවන් සේවා අධිකාරියේ කටයුතු, අධිකාරියේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික මගපෙන්වීම් අනුව මෙන්ම එහි තුන් අවුරුදු ව්‍යාපාර සැලැසුමේ සඳහන් අපේක්ෂාවන්ට අනුවත් ඉටු කරන බවට සහතික වීම සඳහාත් අධිකාරියේ රැස්වීම් සහ එහි කමිටු රැස්වීම් නිතිපතා පවත්වනු ලැබේ.

## බැඳියා පිළිගැටුම්

අධිකාරිය සම්බන්ධකම් ලේඛනයක් පවත්වාගෙන යමින් එහි සාමාජිකයින් තමතමන්ගේ විවිධාකාර වූ පිටස්තර සම්බන්ධකම් හෙළිදරව් කර ප්‍රකාශ කිරීමට ඇති වගකීම ගැන දැනුවත්ව සිටින බවට සහතික වෙයි. කාර්යය මණ්ඩලය සඳහා ද මෙවැනි සම්බන්ධකම් ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ.

## අභ්‍යන්තර විගණනය

අධිකාරියේ කාර්යයන් අතරින් බොහෝමයක් පවරා දී ඇති අතර ඵලදායි සංවිධාන පාලන ක්‍රම පවත්වාගෙන යාමේ අවසාන වගකීම අධිකාරිය මතම රඳා පවතී.

අභ්‍යන්තර පාලන ක්‍රම අතරට අධිකාරියේ නිෂ්චිත අරමුණු ඉටු කර ගැනීම සඳහා පිහිටුවා ඇති ප්‍රතිපත්ති, ක්‍රම සහ කාර්යය පටිපාටි ද ඇතුළත් වේ. අධිකාරිය හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණය මෙම වාර්තාවේ ඇතුළත් වී ඇති වගකීම් ප්‍රකාශය අත්සන් කිරීම මගින් ඔවුනොවුන්ගේ වගකීම පිළිගෙන ඇත.

සිවිල් ගුවන් සේවා අධිකාරියේ එකිනෙක අංශ වල අභ්‍යන්තර පාලන ක්‍රම අධීක්ෂණය කිරීමේ වගකීම දරණ අභ්‍යන්තර විගණන ඒකකයක් අධිකාරිය සතුව ඇත. සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඉටු කරනු ලබන සියලුම සේවාවන්හි තත්වය පිළිබඳවත්, අධිකාරියට වාර්තා කරනු ලබන මූල්‍ය සහ අනෙකුත් තොරතුරු වල විශ්වාසවන්ත භාවය පිළිබඳවත් මෙම අංශය විසින් නිරීක්ෂණය කරනු ලැබේ.

අභ්‍යන්තර විගණන අංශය ජ්‍යෙෂ්ඨ කළමණාකරණයෙහි බලපෑමකින් තොරව ස්වාධීනව කටයුතු කරන අතර ඔවුන්ගේ සොයා ගැනීම් සම්මත මාර්ග ඔස්සේ කෙලින්ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී (DGCA/CEO) වෙනත් විගණන කමිටුව වෙතත් වාර්තා කරනු ලැබේ.

## ව්‍යවස්ථාමය අවශ්‍යතාවන්ට අනුකූල වීම

තම සංවිධානය සියලුම ව්‍යවස්ථාමය අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික වීම සිය වගකීම වන බව අධිකාරිය පිළිගනියි. විශේෂයෙන්ම තමන්ට අදාළ වන ව්‍යවස්ථාමය අවශ්‍යතාවයන් පිළිබඳව කාර්යය මණ්ඩලයේ සියල්ලන් මනා අවබෝධයකින් සිටින බව සහතික කර ගැනීම සඳහා එවැනි අනුකූලවීම් පිළිබඳ ගැටළු ක්‍රමානුකූලව හඳුනා ගැනීම පිණිස උචිත වැඩ පිළිවෙලක් විකාශනය කර ක්‍රියාත්මක කිරීමේ වගකීම අධිකාරිය ජ්‍යෙෂ්ඨ කළමණාකරණය වෙත පවරා ඇත.

රජයේ සංවිධාන /දෙපාර්තමේන්තු විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ සහ/හෝ විධාන අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් අදාළ කර ගනු ලබන්නේ එකින් එක ගෙන වෙන වෙනම සළකා බලන පදනම මත අධිකාරිය විසින් නිශ්චය කරනු ලබනතාක් දුරකට පමණකි. එහෙයින් අධිකාරිය විසින් අදාළ චක්‍රලේඛයෙහි අන්තර්ගතය පරික්ෂා කර එහි අඩංගු නියෝග /විධාන කොතෙක් දුරට අදාළ කර ගත යුතුද යන්න තීරණය කරනතාක් රජයේ දෙපාර්තමේන්තු විසින් නිකුත් කරනු ලබන එකිනෙක චක්‍රලේඛ එසැනින්ම CAASL හි කළමණාකරණයට අදාළ කර ගැනීමක් සිදු නොකරනු ඇත.

## අචාර ධර්ම

ආචාර ධර්ම රීති සංග්‍රහයක් සකස් කර හඳුන්වා දී ඇති අධිකාරිය එහි කාර්යය මණ්ඩලය සෑම කල්හිම උසස් මට්ටමේ සදාචාර සම්පන්න හැසිරීම් පවත්වාගෙන යන්නේ ද යන්නත් "යහපත් සංස්ථා පාලනය" කට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේද යන්නෙන් නිරතුරුව අධීක්ෂණය කරයි. සම්මත ආචාර රීති සෑමට අනුකූලවීම පවත්වා ගැනීම අධීක්ෂණය කරනුයේ සේවකයින්ට විරුද්ධව ලැබෙන පැමිණිලි සහ විනය පරීක්ෂණ ආදියෙහි උපනතීන් පිළිබඳව විමසිලිමත් වීම, අභ්‍යන්තර විගණන වාර්තා හෝ ආචාර රීති සංග්‍රහයේ ඇතුළත් ප්‍රතිපත්ති කඩ කිරීම් පිළිබඳ පැමිණිලි හෝ පරික්ෂා කිරීම් ආදී ක්‍රම උපායයන් මගින්ය.

යහපත් සංස්ථා සාමාජිකත්වය යනුවෙන් අදහස් කරනුයේ සමස්ත සේවක පිරිස ඇතුළු අධිකාරියෙහි තම සංවිධානයෙනුත් එය නිරත වී සිටින කර්මාන්තයෙනුත් බැහැර වූ තවත් ප්‍රජාවන් ගණනාවක සාමාජිකයෙකු වන බව පිළිගනිමින් එකී ප්‍රජාවන්ට අයත් සියලුම සාමාජිකයින්ගේ පිළිගත් අයිතිවාසිකම්, වගකීම් සහ සමාජ චාරිත්‍ර ආදියට ගරු කරමින් ඊට අනුකූලව කටයුතු කිරීමට කැප වීමයි.

# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

## ඉදිරි දැක්ම

ජාතික ආර්ථික වර්ධනය උදෙසා ප්‍රධාන උත්ප්‍රේරකයෙකු බවට පත් වීම.

## මෙහෙවර

උපාය මාර්ගික සැලසුම්කරණය සහ ප්‍රබලකර පාලනය මගින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත පරිචයන්ට අනුකූල, නිරුපද්‍රිත, සුරක්ෂිත සහ කාර්යක්ෂම ජාතික සිවිල් ගුවන් සේවා කර්මාන්තයක් මෙහෙයවීම සුසාධනය කිරීම.

## ආදර්ශ පාඨය

"සැමට නිරුපද්‍රිත අහසක්"

## දර්ශනය

ශ්‍රී ලංකාවට අයත් ගුවන් තලය ශ්‍රී ලංකාවේ අනාගත පරම්පරාවේ ප්‍රගතිය සහ සුභසිද්ධිය සඳහා කළමණාකරණය කළ යුතු පොදු වස්තුවකි.

## අරමුණු

» CAASL විසින් නිශ්චිත කරනු ලබන නිරුපද්‍රිතතා ප්‍රතිඵල හා සම්බන්ධ ඉලක්ක ඉටුකර ගැනීම

» අවශ්‍ය සම්පත් ලබා ගැනීම

» වෘත්තීය භාවයට සහ නිපුණත්වයට පත්වීම

» පතළ විශ්වාසය හා පිළිගැනීම දිනා ගැනීම

» එහි සාධනයක් නොකඩවා පවත්වාගෙන යාම සහ

» සිවිල් සිවිල් ගුවන් සේවා කර්මාන්තය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීමේ කාර්යයන් උදෙසා ශක්තිමත් සුසාධකයෙකු බවට පත්වීම.

## උපාය මාර්ග

» වඩා හොඳින් සහ යථායෝග්‍ය ලෙස ව්‍යවස්ථාපිත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ සමාජ බැඳීම් ඉටු කිරීම

» වැදගත් ගුවන් සේවා ගැටළු සහ විසඳුම් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම

» විශේෂිත වූ පිළිවෙත් වෙනස් කිරීමේ නව ප්‍රවේශ හඳුන්වා දීම

» ගුවන් සේවා කර්මාන්තය සමග සහයෝගයෙන් සහ හවුලේ කටයුතු කිරීම.

» විනිවිද භාවයෙන් යුක්තව කටයුතු කිරීම සහ ඵලදායි අභ්‍යන්තර සහ බාහිර සංදේශයන් පැවැත්වීම

» සියලුම ලිපි ලේඛන, උපකරණ සහ අභ්‍යන්තර කාර්යය පටිපාටිවල ප්‍රබලකර භාවය සහ අදාළත්වය පවත්වාගෙන යාම

## සාරධර්ම

අධිකාරිය සහ එහි කාර්යය මණ්ඩලය:

» නිරුපද්‍රිතතාවයට ඉහළම ප්‍රමුඛත්වය ලබා දෙමින් නිරුපද්‍රිතතා පිළිවෙත් කෙරෙහි අනුග්‍රහය දක්වනු ඇත.

» CAASL හි සේවා ලාභීන්ට සපයන සේවාවන් හිදී විශිෂ්ඨයන් වනු ඇත

» භාරගන්නා සියලුම කාර්යයන් හිදී "කළ හැකිය" යන ආකල්පයෙන් කටයුතු කරනු ඇත.

» යථාර්ථවාදී සහ විශ්වාස කටයුතු පුද්ගලයින් බවට පත් වීම අරමුණු කරනු ඇත

» අඛණ්ඩ වර්ධනය සොයා යාමේදී වෙනස් වීමට කැමැත්ත සහ හැකියාව ඇති කර ගනු ඇත.

» සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා එක්ව වැඩ කරනු ඇත.

» විවෘතව, අවංකව හා විනිවිද භාවයෙන් යුක්තව කටයුතු කරනු ඇත.

» සෑම කටයුත්තකදීම කාර්යක්ෂමතාව සහ ක්‍රමවත්

භාවය පවත්වා ගනු ඇත.

» සගයන්ට ගරු කිරීමෙන් සහ ඔවුන් විශ්වාස කිරීමෙන් කණ්ඩායමක් ලෙස කටයුතු කරනු ඇත.
» සැමගේ දායකත්වය අගය කරනු ඇත.
» සමාජ වගකීම් හා බැඳීම් හඳුනා ගනු ඇත.
» කරනු ලබන කාර්යයන්ගෙන් සතුට ලබනු ඇත.
» වෘත්තීය ප්‍රවේශය සම්බන්ධව ආඩම්බර වනු ඇත.
» රාජකාරී පරිසරයත් ගෘහ ජීවිත පරිසරයත් තුලනය කර ගනු ඇත.

(CAASL සංවිධාන ව්‍යුහය - I පරිශිෂ්ඨය බලන්න)

## CAASL හි ආසන්න ඉලක්ක

» වාණිජ ගුවන් සේවා අංශයෙහි මාරක අනතුරු වැලැක්වීම.
» ගුවන් යානා බලහත්කාරයෙන් පැහැර ගැනීම් සහ ගුවන් සේවා කාර්යයන්හි නීති විරෝධී ලෙස මැදිහත් වීම් වැළැක්වීම.
» පොදු ගුවන් සේවා අනතුරු වැළැක්වීම.
» ගුවන් තොටුපොළ භූමිය මත සිදුවන මාරක අනතුරු වැළැක්වීම
» ඉන්ජිනේරු /නඩත්තු වැඩපොළ තුළ සිදු වන අනතුරු අඩු කිරීම.
» වාණිජ පියාසර අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර පැය 10,000 ට1 ප්‍රමාණයෙන් පහත හෙලා පවත්වා ගැනීම.
» පොදු ගුවන් සේවා පියසර අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර පැය 5000 ට 1 ප්‍රමාණයෙන් පහත හෙළීම.
» පියසර පාසල්හි පියසර අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර 10,000ට 1 ප්‍රමාණයෙන් පහත හෙළීම.
» භූමි සහාය සහිත වාණිජ පියසර අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර පැය 20,000 ට 1 ප්‍රමාණයෙන් පහත හෙළීම
» භූමි සහායක සහිත පොදු ගුවන්සේවා පියසර අනපේක්ෂිත සිදුවීම් අනුපාතය 10,000 ට 1 ට ප්‍රමාණයෙන් පහත හෙළීම
» ගුවන් ගමන් සේවා (ATS) සහය සහිත පියසර අනපේක්ෂිත සිදුවීම් අනුපාතය පියසර 50,000 ට 1 ප්‍රමාණයෙන් පහත හෙළීම
» "නියමිත වෙලාවට" පිටත්වීම් හි සිදුවන ප්‍රමාද අවම කිරීම
» ගුවන් ගමන් යාම සාමාන්‍ය පංතියේ පුද්ගලයන්ට ඔරොත්තු දෙන තත්වයට පත් කිරීම
» ගුවන් ගමන් වලදී සැපයෙන සේවාවන්හි තත්වය දියුණු කිරීම
» ආරක්ෂක අවශ්‍යතා සිහි තබා ගනිමින් ගුවන්තොටුපොළ තුළ ඇතිවන තදබදය අවම කිරීම සහ මගීන් හැසිරවීමේ කටයුතු කඩිනම් කිරීම
» ගුවන් ප්‍රවාහනයෙහි මෙහෙයුම් පිරිවැය අවම කිරීම සහ නාස්තිය නැති කිරීම සහ
» ගුවන් සේවාවෙන් පරිසරයට එල්ලවන අහිතකර බලපෑම් අවම කිරීම

## ප්‍රතිඵල

» රාජ්‍යය වෙත පැවරී ඇති සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයට අදාල ජාත්‍යන්තර බැඳීම් හා වගකීම් සහ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් නිතිපතා ක්‍රියාත්මක කිරීම.
» සම්බාධක /සීමා පැනවීම් රහිත ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා පද්ධතිය ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වීම.
» සිවිල් ගුවන් සේවාවෙහි නිරුපද්‍රිතතාව, සුරක්ෂිතතාවය, කාර්යක්ෂමතාවය සහ විධිමත්භාවය වර්ධනය වීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ගුවන් ප්‍රවාහන පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය ඇති වීම.
» ශ්‍රී ලංකා ගුවන් තලය ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ යහපත උදෙසා උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම.
» රටේ සමාජ/ ආර්ථික සංවර්ධනය
» අහේතුක තරඟකාරීත්වය නිසා සිදුවන ආර්ථික අපතේ යාම් වැළැක්වීම.
» පුද්ගලයින්ගේ හා භාණ්ඩ වල පිවිසුම් හා චලන වැඩි දියුණු කිරීම.
» සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය තුළ විශ්වාස කටයුතු සේවා සැපයීම.
» සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයහි අධ්‍යාපනය.
» සිවිල් ගගන නාවික කාර්යයන්හි සියලු අංශ කෙරෙහි අනුග්‍රහය දැක්වීම.
» පොදු සෞඛ්‍ය ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම.
» ප්‍රබලකර නියාමනයක් හා නීති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඊට උචිත නීතිමය රාමුවක් සකස් කිරීම.
» පරිසර සංරක්ෂණය

## ප්‍රතිදාන

| ප්‍රතිදාන වර්ගය | ප්‍රතිදානය |
|---|---|
| ප්‍රතිපත්ති උපදෙස් | රජයට හා වෙනත් සංවිධානයන්ට උපදෙස් දීම<br>ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ<br>රීති විකාශනය<br>ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති විකාශනය හා පළ කිරීම<br>ගුවන් සේවා ප්‍රතිපත්ති විකාශනය<br>කාර්ය පටිපාටි අත්පොත් විකාශනය<br>ගුවන් සේවා යටිතල පහසුකම් පිළිබඳ මහා සැලසුම් සකස් කිරීම |
| නිරුපද්‍රිතතා තක්සේරුව සහ සහතික කිරීම | පහත සඳහන් කරුණු වලට අදාළ අවදානම් කළමණාකරණය:<br>ගුවන් තොටුපොළ, ගුවන් පිටිය අංශයෙහි නිරුපද්‍රිතතාව<br>ගුවන් සාමාගම් අංශයෙහි නිරුපද්‍රිතතාව<br>පොදු ගුවන් සේවා අංශයෙහි නිරුපද්‍රිතතාව<br>පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ නිරුපද්‍රිතතාව<br>පියසර පුහුණු නිරුපද්‍රිතතාව<br>ගුවන් යානා නඩත්තු නිරුපද්‍රිතතාව<br>ගුවන් සේවා අංශයෙහි නිරුපද්‍රිතතා / අවදානම් කළමණාකරණය |
| නිරුපද්‍රිතතා විශ්ලේෂණය, තොරතුරු සහ අනුග්‍රහය | නිරුපද්‍රිතතා විමර්ශනය<br>නිරුපද්‍රිතතා විශ්ලේෂණය<br>නිරුපද්‍රිතතා තොරතුරු අධ්‍යාපනය සහ අනුග්‍රහය<br>ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය සහ නිරුපද්‍රිතතා නිර්දේශ ක්‍රියාත්මක කිරීම |
| බලය පැවරීම | ගුවන් සමාගම් උපලේඛන අනුමත කිරීම<br>ගුවන් ගමන් ගාස්තු අනුමත කිරීම<br>සංචාරක නියෝජිතයන් සහතික කිරීම<br>ගුවන් යානා ලියාපදිංචි කිරීම<br>ගුවන් යානා අමතර කොටස් ආනයනය සඳහා බලය දීම<br>උස් ගොඩනැගිලි/නිර්මාණ තැනීමට අවසර දීම<br>පොදු අලෙවි නියෝජිතයන්ට බලය පැවරීම<br>ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් නම් කිරීම |
| සුරක්ෂිතතා තක්සේරුව | සිවිල් ගුවන් සේවා අංශයෙහි සුරක්ෂිතතා අවදානම් කළමණාකරණය |
| බලාත්මක කිරීම | නීති කඩකිරීම් කෙරෙහි දක්වන ප්‍රතිචාර<br>පොදු සෞඛ්‍යය සහ සනීපාරක්ෂක අවශ්‍යතා බලාත්මක කිරීම |
| රජයට සහය වීම | ගුවන් ප්‍රවාහන සමාගම් වෙතින් නැව් නැගීමේ ගාස්තු අය කර දීම |

# මෙහෙයවීම් හා කළමණාකරණය

## අධිකාරිය හා එහි කමිටු

### අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්

අතිගරු ජනාධිපතිතුමා, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වශයෙන් 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා පනතේ විධි විධාන ප්‍රකාර 2010 මැයි මස 13 වන දින සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කළේය. එයාර් චිෆ් මාර්ෂල් ඩබ්ලිව්.ඩී.ආර්.එම්.ජේ. ගුණතිලක සහ ජේ.එම්.එස්.ඩබ්ලිව්. ජයසුන්දර මහතා පිළිවලින් එහි සභාපති සහ උප සභාපති වශයෙන් පත් කරන ලදි.

### CAASL රැස්වීම්

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් එහි රැස්වීම් නවයක් (9) පවත්වන ලද අතර අධිකාරියේත්, අධිකාරිය විසින් නියාමනය කරනු ලබන සිවිල් ගුවන් සේවා කර්මාන්තයේත් ප්‍රගතිය හා යහපත උදෙසා යෝජනා දෙසිය තිස් හතරක් (234) සම්මත කරන ලදී. අදාළ කාල සීමාව තුළ කාර්ය මණ්ඩලය නව (09) වරක් රැස්වී ඇති අතර විගණන කමිටුව සිව් (04) වරක් රැස්වී ඇත.

### ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

### ICAO USOAP විගණනයේ ප්‍රතිඵලය

ගිවිසුම් රාජ්‍යයන් විසින් ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් ක්‍රියාත්මක කරන ප්‍රමාණය තක්සේරු කිරීමට සහ එකිනෙක රාජ්‍යයන්හි නිරුපද්‍රිතතා අධීක්ෂණ හැකියාවෙහි ප්‍රබලකර භාවය තක්සේරු කිරීමටත් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විශ්ව නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණන වැඩසටහන (USOAP) ආරම්භ කළේය.

ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් 2010 වර්ෂයේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පවත්වන ලද USOAP විගණනයේදී ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් ක්‍රියාත්මක කිරීම අතිනුත් ඉතා උසස් ගුවන් සේවා නිරුපද්‍රිතතා මට්ටමක් පවත්වාගෙන යාම අතිනුත් ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති විශිෂ්ඨත්වය මැනවින් ඔප්පු විය. ICAO හි ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් ප්‍රබලකර අන්දමින් ක්‍රියාත්මක කිරීම අතින් ශ්‍රී ලංකාවට ආසියා ශාන්තිකර කලාපයේ රාජ්‍යයන් 34 ක් අතරින් 4 වන ස්ථානය ලැබී ඇත. මෙය අප රට ලැබූ ඉතා වැදගත් සහ ප්‍රශංසනීය ජයග්‍රහනයකි. ආසියා ශාන්තිකර කලාපයේ රාජ්‍යයන් අතරින් ශ්‍රී ලංකාවට වඩා ඉහල කාර්යයසාධන මට්ටමක් ලබා ඇත්තේ කොරියානු ජනරජය, සිංගප්පුරු සහ ජපානය පමණකි. (3 වන පරිශිෂ්ඨය බලන්න)

USOAP තක්සේරුව අනුව ආසියා ශාන්තිකර කලාපයේ රාජ්‍යයන් 18 ක්, 59.8% ක් වූ ලෝක සාමාන්‍යට වඩා ඉහළ කාර්යසාධන මට්ටමක් ලබා ඇත. රාජ්‍යයන් 16 ක කාර්යසාධන මට්ටම ලෝක සාමාන්‍යට වඩා අඩුය. එයිනුත් රාජ්‍යයන් හතරක් ලබා ඇත්තේ ලෝක සාමාන්‍යයෙන් අඩකටත් (29.9%) අඩු කාර්යසාධන මට්ටමකි. USOAP විගණනයට අනුව ආසියා ශාන්තිකර කලාපයේ ඉහළම කාර්යයසාධන මට්ටම් ලබා ඇති රාජ්‍යයන් අවරෝහන ක්‍රමයට පහත දක්වා ඇත.

1. කොරියානු ජනරජය
2. සිංගප්පූරුව
3. ජපානය
4. ශ්‍රී ලංකාව
5. මොන්ගෝලියාව

6. චීනය
7. නවසීලන්තය
8. ඔස්ට්‍රේලියාව

වඩාත්ම මෑතකදී පළ කරන ලද තොරතුරු වලින් හෙළි වී ඇත්තේ ගෝලීය විගණන ප්‍රතිඵල අනුව, විගණන කරන ලද රාජ්‍යයන් 177 ක් අතරින් ශ්‍රී ලංකාවට 19 වන ස්ථානය ලැබී ඇති බවය.

## COSCAP-SA 20 වන නියාමන කමිටු රැස්වීම

මෙහෙයුම් නිරුපද්‍රිතතාව සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව වර්ධනය කිරීමේ දකුණු ආසියා සහයෝගිතා වැඩසටහනේ (COSCAP-SA) 20 වන නියාමන කමිටු රැස්වීම (SCM) 2011 අප්‍රියෙල් 05-08 දක්වා කොළඹදී පැවැත්වුණි. මෙම රැස්වීමේ සභාපතිත්වය දරණ ලද්දේ එවකට COSCAP වැඩසටහනේ සභාපතිවරයා වූ ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වරයා විසිනි. තුන්දින රැස්වීමක් වූ මීට නියෝජිතවරු 50 පමණ සහභාගී වූහ. මෙම නියාමන කමිටුවේ සාමාජිකයින් වනුයේ දකුණු ආසියාවේ රාජ්‍යයන්හි සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරුන්ය. මෙම සාමාජිකයන්ට අමතරව එකී රාජ්‍යයන්හි නියෝජිතවරුන්ද ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ නියෝජිතවරුන්ද ප්‍රධාන පෙළේ ගෝලීය සහ දේශීය සිවිල් ගුවන් සේවා සංවිධාන කීපයක නියෝජිතවරුන්ද රැස්වීමට සහභාගී වූහ.

1998 දී COSCAP වැඩසටහන සකස් කරන ලද්දේ දකුණු ආසියානු රාජ්‍යයන්හි සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරුන්ගේ සාමුහික ප්‍රයත්නයක් මගින්ය. මෙම වැඩසටහනෙහි මූලික අරමුණ වූයේ තාක්ෂණික සහය සපයමින් දකුණු ආසියාවේ රාජ්‍යයන්හි ගුවන් සේවා නියාමකයන්ගේ සහ ගුවන් සේවා කර්මාන්තයේ නිරත වන්නන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සහ යාවත්කාල කිරීම ගුවන් සේවා නිරුපද්‍රිතතා නියාමකයන්ගේ සහ ගුවන් සේවා කර්මාන්ත කරුවන්ගේ භාවිතය සඳහා කාර්යපටිපාටි සහ මාර්ගෝපදේශන විකාශනය කිරීම සහ ගුවන් සේවා නිරුපද්‍රිතතා පරීක්ෂකවරුන්ට ප්‍රායෝගික දැනුම ලබාදීමය. මෙම වැඩසටහනෙහි කළමණාකරණය කළාපීය වැඩ සටහන් සමායෝජකවරයෙකුට භාර වී ඇති අතර, දකුණු ආසියා කලාපයෙන් බඳවා ගත් විවිධ විෂයන් පිළිබඳ තාක්ෂණික විශේෂඥයින්ගේ සේවය ඊට ලැබේ.

නියාමන කමිටු රැස්වීම වාර්ෂිකව පැවැත්වේ. මෙම රැස්වීමේදී ගෙවී ගිය වර්ෂය තුළ ඉටුකරන ලද කාර්යයන්හි ප්‍රගතිය තක්සේරු කිරීම, එළඹෙන වර්ෂයේ ක්‍රියාත්මක වැඩසටහන් සමාලෝචනය කර අනුමත කිරීම, මුල්‍ය තත්ත්වය තක්සේරු කිරීම, ජාත්‍යන්තර විශේෂඥයින් විසින් විකාශනය වෙමින් පවතින නව තාක්ෂණිකයන් ඉදිරිපත් කිරීම් ආදිය සිදු කරනු ලැබේ. මෙම රැස්වීමේදී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය ඇමරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් ඒවියේෂන් ඇඩ්මිනිස්ට්‍රේෂන් (FAA) බෝයින් එයාක්‍රාෆ්ට් සමාගම සහ එයාර් බස් ඉන්ඩස්ට්‍රි යන ආයතන වලින් පැමිණි සිටි නියෝජිතවරු ඉදිරිපත් කිරීම් සිදු කළහ.

මෙම තුන්දින රැස්වීම් ඵලදායි ප්‍රතිඵල සහිතව අවසන් විය. සාකච්ඡා කිරීම සඳහා සකස් කරන ලද සාකච්ඡා පත්‍රිකා එකොළහක් (11) රැස්වීමට ඉදිරිපත් විය. රැස්වීමේදී සාකච්ඡා කරන ලද තාක්ෂණික හා පියසර නිරුපද්‍රිතා කරුණු ගණනාවක් අතර දකුණු ආසියානු රාජ්‍යයන් තුළ කාර්යසාධනය පදනම් වූ ගුවන් සංතරණ (PBN) ක්‍රියාත්මක කිරීම සහ ඒ ඒ දකුණු ආසියානු රාජ්‍යයන් තුළ රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩසටහන (SSP) ක්‍රියාත්මක කිරීම යන කාර්යයන්ට ඉහළ ප්‍රමුකත්වයක් ලබා දෙන ලදි.

## ගුවන් යානා අනතුරු විමර්ශන ඒකකය

නැවතත් 2011 වර්ෂයද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවාවට ගුවන් යානා අනතුරු වලින් තොර වඩාත් නිරුපද්‍රිතතා වර්ෂයක් විය. 2005 ඔක්තෝම්බර් මස 16 වන දින බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේදී ශ්‍රී ලංකාවේ ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සාමාගමේ පියසර අංක UL 316-එයාර් බස් A 330-243 ගුවන් යානයට සිදුවූ අනතුරෙන් මෙපිට ගුවන් යානා අනතුරක් සිදුවී නැත.

අනතුරු විමර්ශන අංශය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ ICAO නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණනයේදී සොයා ගත් ඌනතා නිවැරදි කිරීමේ වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීම කෙරෙහිය. ICAO විගණන කණ්ඩායමට අනුව ගුවන් යානා අනතුරු සහ විමර්ශනයට අදාළ සොයා ගැනීම් (05) තිබුණු අතර එකී ඌනතා නිවරද කිරීමේ ක්‍රියාමාර්ගද විගණන වාර්තාවේ නිර්දේශ කර තිබුණි.

එකී සොයා ගැනීම් වූයේ, ගුවන් යානා අනතුරු සහ බරපතල සිදුවීම් පිළිබඳ විමර්ශනය පැවැත්වීම සඳහා වෙනමම ස්වාධීන මණ්ඩලයක් නොතිබීම, විමර්ශකයන්ට පුහුණුව නොතිබීම, විමර්ශන ක්‍රියාවලිය පුරාම සහය හෝ සමායෝජනය ලබා දීම

සඳහා වෙනත් රාජ්‍යයන් හා අධිකරණ බලධාරීන් සමග අත්සන් කරන ලද ගිවිසුම් සිවිල් ගුවන් සේවා අධිකාරිය සතුව නොතිබීම, නිරුපද්‍රිතතා දත්ත විශ්ලේෂණය පිළිබඳ අඩුපාඩු සහ ස්වේච්ඡා සිදුවීම් වාර්තා කිරීමේ ක්‍රමයක් පිහිටුවා නොතිබීමය.

ගුවන් යානා අනතුරු විමර්ශනය කිරීම භාරදීම සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ NTSB වැනි ස්වාධීන නියෝජිත ආයතනයක් ශ්‍රී ලංකාවේ පිහිටුවන මෙන් අනතුරු විමර්ශන ඒකකය අධිකාරියට යෝජනා කර තිබේ. අනතුරු විමර්ශන පැවැත්වීම සඳහා වෙනමම ආයතනයක් පිහිටුවීමේ හැකියාව ගැන අධ්‍යයනය කරන මෙන් රාජ්‍ය ව්‍යවසාය කමිටුවද (COPE) සිවිල් ගුවන් සේවා අධිකාරියට නිර්දේශ කර ඇත. ගුවන් යානා අනතුරු හා සිදුවීම් විමර්ශනයට අදාළව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සිංගප්පූරුවේ අනතුරු විමර්ශන කාර්යංශය සමග ඇති කර ගත් සහයෝගිතා වැඩපිළිවෙල සම්බන්ධ කටයුතු සම්පූර්ණ කරන ලදී. අධිකරණය අමාත්‍යාංශය සමග අවබෝධතා ගිවිසුමක් ඇති කර ගැනීමටද කටයුතු ආරම්භ කරන ලද අතර එම කාර්යය දැන් නිම වෙමින් පවතී.

ගුවන් යානා අනතුරු හා සිදුවීම් විමර්ශන රෙගුලාසි කෙටුම්පත් අවසාන කර ඇති අතර බලාත්මක භාවයට පත් කිරීම සඳහා ගරු ඇමතිතුමන්ගේ අනුමැතිය ඉදිරිපත් කර ඇත.

සමාලෝචනය භාජනය වන වර්ෂය තුළ ගුවන් යානා අනතුරු හෝ බරපතල සිදුවීම් හෝ කිසිවක් වාර්තා වී නැතත් කොළඹ පියසර කලාපය තුළ පියසර කරමින් තිබුණු ගුවන් යානා දෙකක් අතර 2011 පෙබරවාරි මස 05 දින ඇති වූ එක් ATC සිදුවීමක් CAASL විසින් විමර්ශනය කර ඇත.

## අභ්‍යන්තර විගණන අංශය

සංවිධානයේ මෙහෙයුම් වල තත්වය දියුණු කර එයින් සැපයෙන සේවාවන්ට වටිනාකමක් එක් කිරීම අරමුණු කර ගත් ස්වාධීන උපදේශක කාර්යයක් අභ්‍යන්තර විගණන අංශයට පවරා ගනු ලැබ ඇත. අභ්‍යන්තර විගණනය සංවිධානමය කාර්ය සාධනයෙහි සහ නියාමන හා පාලන ක්‍රියාවලියෙහි ප්‍රබලකර භාවය ඇගයීමටත් වර්ධනය කිරීමටත් ක්‍රමානුකූල හා සංයමයෙන් යුත් ප්‍රවිෂ්ඨයක් යොදා ගනිමින් එහි අරමුණු ඉටු කර ගැනීමට සිවිල් ගුවන් සේවා අධිකාරියට සහය වෙයි.

එහි වෘත්තීයමය සේවාවන් තාක්ෂණික අංශ වලටද සපයමින් CAASL සම්බන්ධව ගණුදෙනුකරුවන් තුළ ඇති තෘප්තිමත් භාවය මැන බැලීමටද අභ්‍යන්තර විගණන අංශය පියවර ගෙන ඇත. 2011 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය තාක්ෂණික අංශ සම්බන්ධව විගණන 03 පවත්වා ඇති අතර ගණුදෙනුකරුවන්ගේ තෘප්තිමත් භාවය මැනීම සඳහා කෙටුම්පත් ප්‍රශ්නාවලියක්ද සකස් කර ඇත. මෙම වර්ෂය තුළ CAASL හි තාක්ෂණික අංශ සිය ගණුදෙණුකරුවන්ට වඩාත් හොඳ නියාමන සේවා සපයමින් තත්වය වර්ධනය වූ වඩාත් හොඳ ප්‍රතිඵල ලබා ඇත. විශේෂයෙන්ම සංවිධානයේ මුදල් හා මානව සම්පත් අංශ වල සාර්ථකත්වය වර්ධනය කිරීමේ අරමුණෙන් තාක්ෂණික නොවන අංශ සම්බන්ධව විගණන දහ තුනක් (13) පවත්වා ඇත.

අභ්‍යන්තර විගණන අංශය 'අභ්‍යන්තර විගණනයෙහි නවමාන' නැමැති විෂය සම්බන්ධව සිංගප්පූරුවේ පවත්වන පුහුණු වැඩ සටහනකට එහි විධායක නිලධාරියා සහභාගී කරවීය. එහි කාර්යය මණ්ඩලයේ වෘත්තීය භාවය සහ ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම පුළුල් කිරීම මෙහි අරමුණ වේ.

# ගගන නාවික සේවා ශාඛාව

## ගුවන් සේවා සුරක්ෂිතතා අංශය

### ගුවන් සේවා සුරක්ෂිතතා පුහුණුව

ගුවන් සේවා සුරක්ෂිතතා අංශය සී/ස ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සුරක්ෂිතතා නිලධාරීන් සඳහා ගුවන් යානා තුළ සෙවීම් හා පරීක්ෂා කිරීම් පිළිබඳ මූලික සහ සංස්කරණ පුහුණු පාඨමාලා පැවැත්වීය. මීට න්‍යාය සහ ප්‍රායෝගික පාඩම් දෙවර්ගයම ඇතුළත් විය.

### සෝදිසි කරන්නන් සහතික කිරීම

ගුවන් සේවා සුරක්ෂිතතා අංශය (AVSEC) 2011 වර්ෂය තුළ සී/ස ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ ගුවන් සේවා සුරක්ෂිතතා සෝදිසි කරන්නන්ට සහතික නිකුත් කිරීම නොනවත්වා සිදු කළේය. මෙම සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියට ලිඛිත විභාගයක්, ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් ඇතුළත්ය. සහතික නිකුත් කිරීමේ දෙවන අදියරේදී ගුවන් සේවා සුරක්ෂිතතා නිලධාරීහු 376 දෙනෙක් සෝදිසි කරන්නන් වශයෙන් සහතික ලබා ගැනීමට සුදුසුකම් ලැබූහ. මෙය සිවිල් ගුවන් සේවා අධිකාරිය, සෝදිසි කිරීමේ කාර්යයන්හි නිරත වන පුද්ගලයින්ට සහතික නිකුත් කිරීම සිදු කළ දෙවන අවස්ථාවයි.

### අවි ආයුධ රැගෙන යාමට අවසර දීම

ශ්‍රී ලංකාවට අයත් ගුවන් තලය ඇතුළත හා ශ්‍රී ලංකාව තුළ පිහිටි ගුවන් තොටුපොළ වෙත හෝ ඉන් පිටතට හෝ ගුවන් යානා තුළ අවි ආයුධ රැගෙන යාමට අවසර දීමේ බලය පැවරී ඇත්තේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වරයාටයි. එහෙයින් රජය වෙතිනුත් පෞද්ගලික සංවිධාන මෙන්ම තනි පුද්ගලයින් වෙතිනුත්, VIP ආරක්ෂාව එක්සත් ජාතීන්ගේ සාම හමුදා කාර්යයන්හි නිරත වීම, හමුදාවන් විසින් අවි ආයුධ අත් කර ගැනීම, ජාත්‍යන්තර ක්‍රීඩා ක්‍රියාවලි /තරග ආදිය සඳහාත් තනි පුද්ගලයින් වෙතින් නීත්‍යානුකූල කාර්යයන් සඳහාත් අවි ආයුධ ගුවනින් ප්‍රවාහනය කිරීමට අනුමැතිය ඉල්ලන ඉල්ලුම් පත්‍ර සැහෙන සංඛ්‍යාවක් අධිකාරියට ලැබේ.

මෙවැනි සියලුම අපනයන සහ ආනයන සඳහා ආරක්ෂක අමාත්‍යාශයේ අනුමැතිය ලැබුණු පසු එකී ද්‍රව්‍ය ගුවන් තලය හරහා රැගෙන යාමට ගුවන් තොටුපොළක ගොඩ බෑමට හෝ ගුවන් තොටුපොළකින් පැටවීමට හෝ අනුමැතිය දීමේ අධිකරණ බලය දරණ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් 128 හා 129 වන ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සහ ICAO ලේඛණ අංක 9284 (2009-2010 මුද්‍රණය) හි හෝ IATA විසින් පළ කරන ලද අන්තරායකාරී ද්‍රව්‍ය රෙගුලාසි වල 51 වන මුද්‍රණයේ හෝ නියම කර ඇති අදාළ පිරිවිතර සමග දැඩි අනුකූලත්වය පවත්වමින් මෙම අංශය විසින් අදාල අනුමැතිය ප්‍රදානය කරනු ලැබේ.

2011 වර්ෂය තුළ, ගුවන් යානා නැව් බඩු ගබඩා තුළ අවි ආයුධ රැගෙන යාමට අවස්ථා තිස් හයකදී (36) කදී VVIP/VIP ජාත්‍යන්තර ගමන් සඳහා ගුවන් යානා තුළ අවි ආයුධ රැගෙන යාමට අවස්ථා හතලිස් එකකදී(41) අයදුම්පත් ඇගයීමෙන් පසු අනුමැතිය ප්‍රදානය කර ඇත.

### ගුවන් සේවා සුරක්ෂිතතා සම්මේලනය හා රැස්වීම්

ගුවන් සේවා සුරක්ෂිතතා නියෝජ්‍ය අධ්‍යක්ෂ පී.ජේ. ජයකාන්ත මහතා 2011 ජුනි මාසයේදී ඉන්දියාවේ නවදිල්ලි නගරයේ සහ සිංගප්පූරුවේදී පවත්වන

ලද ගුවන් සේවා සුරක්ෂිතතා නියාමක වරුන්ගේ රැස්වීමට සහ කලාපීය ගුවන් සේවා සුරක්ෂිතතා සම්මේලනයට සහභාගී විය.

### ගුවන් සේවා සුරක්ෂිතතා පාඨමාලාව සහ සම්මන්ත්‍රණය

සහකාර ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂක වින්ග් කමාන්ඩර් (විශ්‍රාමික) අජිත් දේවරාජා 2011 පෙබරවාරි මාසයේ තායිලන්තයේ බැංකොක් නුවර පවත්වන ලද ගුවන් සේවා සුරක්ෂිතතා නීති පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී වීය. මෙම නිලධාරියා 2011 ජුනි මාසයේ හොංකොන්හි පවත්වන ලද ගුවන් සේවා නැව් බඩු සුරක්ෂිතතා පාඨමාලාවත් 2011 ඔක්තෝම්බර් මාසයේ කෙන්යාවේදී පවත්වන ලද ජාතික පරීක්ෂක පාඨමාලාවත් සාර්ථක ලෙස සම්පූර්ණ කළේය.

## විශේෂ ව්‍යාපෘති අංශය

අන්තර් පුද්ගල සම්බන්ධතාවයන් දියුණු කිරීම පෞර්ෂ වර්ධනය සහ සමස්ථ ඵලදායිතා වර්ධනය අරමුණු කර ගනිමින් විශේෂ ව්‍යාපෘති අංශය අධිකාරියේ කාර්යය මණ්ඩලය සඳහා එළිමහන් වැඩමුළු දෙකක් වාර්ෂිකව පවත්වයි. මෙයින් එක් වැඩමුළුවක් කළමණාකරණ කාර්යය මණ්ඩලයට අත්‍යාවශ්‍ය ගති ලක්ෂණ කාවැද්දීමේ අරමුණෙන් තනිකරම විධායක කාර්යය මණ්ඩලය වෙනුවෙන්ද අනෙක් වැඩමුළුව කණ්ඩායම් වැඩ සහ ඵලදායිතා වර්ධනය අරමුණු කර ගනිමින් අධිකාරියේ සමස්ථ කාර්යය මණ්ඩලය වෙනුවෙන්ද පවත්වනු ලැබේ.

2011 දී මෙම එළිමහන් වැඩමුළුව විලාශයෙහි වෙනසක් ඇති කරමින් වයිල්ඩ් ඩ්‍රෆ්ට් (Wild Draft) නමින් මුළුමනින්ම එළිමහනේ සිදු කෙරෙන ක්‍රියාකාරකම් පැකේජයක් තෝරා ගන්නා ලදි. කණ්ඩායම් ගොඩනැගීම, ධෛර්යය, දරා සිටීමේ ශක්තිය සහ පෞර්ෂ වර්ධනය අරමුණු කර ගත් මෙම ක්‍රියාකාරකම් අතිශයෙන් සාර්ථක විය. ප්‍රථමයෙන් බෙලිහුල්ඔය දී විධායක කාර්යය මණ්ඩලය සඳහා පමණක් පවත්වන ලද වැඩමුළුවේ සාර්ථක ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින් එවැනිම වූ වැඩමුළුවක් සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාත් පැවැත්වීමට තීරණය කරන ලදී. එම තීරණය අනුව අධිකාරියේ විධායක නොවන කාර්යය මණ්ඩලය සඳහාත් එවැනිම වූ වැඩමුළුවක් ඉතා සාර්ථක ලෙස පවත්වන ලදී.

### දැයට කිරුළ ප්‍රදර්ශනය

2011 පෙබරවාරි මාසයේදී බුත්තල පවත්වන ලද ''දැයට කිරුළ-2011'' ප්‍රදර්ශනයේදී සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින්ද ප්‍රදර්ශන කුටියක් විවෘත කර තබන ලදී. මෙම වර්ෂයේදී අධිකාරිය AN 24 වර්ගයේ ගුවන් යානයක් ප්‍රදර්ශනයට තැබීය. මුලදී රත්මලාන ගුවන් තොටුපොළේ ගාල් කර තිබුණු ගුවන් යානය කොටස් ගලවා බුත්තලට ප්‍රවාහනය කර ප්‍රදර්ශන භූමියේදී යළි එකලස් කරන ලද්දේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින්ය. ගුවන් යානයේ ඇතුළත හා පිටත අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කර ඊට නව පෙනුමක් ලබා දීමට CAA කාර්යය මණ්ඩලයට හැකි විය. භෞතික අලුත්වැඩියාවන්ට අමතරව එහි සෑම කවුළුවකමත් මැදිරිකුටියේ ඉදිරිපස දර්ශන තිර සවි කර වීරවිල ගුවන් තොටුපොළෙන් ගුවන් ගත වී ලංකාවේ දකුණු ප්‍රදේශයට ඉහළින් පියාසර කර නැවත එම ගුවන් තොටුපොළේම ගොඩබසින තාත්වික පියසරයක් අනුකරණය කෙරෙන වීඩියෝ දර්ශනයක් නරඹන්නන්ට ඉදිරිපත් කරන ලදි.

මෙම විශේෂ ප්‍රදර්ශන කුටිය නැරඹීමට ආශාවෙන් පැමිණි විශාල පිරිසකට මෙම මගී ප්‍රවාහන ගුවන් යානය නොමිලේම අනුකාරක (Simulated) පියසර අත්විදීමක්ද සහිතව ළඟින්ම නිරීක්ෂණය කළ හැකි විය.

### COSCAP-SA ව්‍යාපෘතියට සහය

2005 සැප්තැම්බර් මාසයේ සිට 2011 ජුලි මාසය දක්වා සිවිල් ගුවන් සේවා අධිකාරි COSCAP-SA ව්‍යාපෘතියේ මූලස්ථානය කොළඹ පිහිටුවාගෙන එහි සත්කාරකත්වය දැරූ අතර 2009-2011 වසර දෙක සඳහා එහි සභාපතිත්ව ද දැරීය. ICAO අනුග්‍රහය සහිතව කොළඹ පිහිටුවා ඇති COSCAP-SA ව්‍යාපෘති කාර්යයාලයට පහසුකම් සපයා දීම විශේෂ ව්‍යාපෘති අංශය මගින් ඉටු කෙරෙන එක් සේවාවකි. COSCAP-SA ව්‍යාපෘතිය පිහිටුවන අවස්ථාවේ සාමාජික රාජ්‍යයන් අතර ඇතිකරගත් ගිවිසුමට අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, ව්‍යාපෘතියට අනියුක්ත විශේෂඥයින්ට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් ප්‍රවාහන සමාගම් සහ ශ්‍රී ලංකාව තුළට මෙහෙයුම් සිදු කරන ගුවන් ප්‍රවාහන සමාගම් වෙතින් ශ්‍රී ලංකාව සහ අනෙකුත් සාමාජික රාජ්‍යයන් අතර ගමන් කිරීම සඳහා නොමිලේ ගුවන් ප්‍රවේශ පත්‍ර ලබා දීමෙන් ඔවුන්ගේ නිල ගමන් සඳහා පහසුකම් සලස්වා දුන්නේය. මේ අනුව විශේෂ ව්‍යාපෘති අංශය COSCAP-SA විශේෂඥයින්ට පහත සඳහන් පරිදි (gratis) නොමිලේ ගුවන් ප්‍රවේශ පත්‍ර 46 ලබා දී ඇත.

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් - ගුවන් ප්‍රවේශ පත්‍ර 34
මිහින් ලංකා - ගුවන් ප්‍රවේශ පත්‍ර 11
එමිරේට්ස් - ගුවන් ප්‍රවේශ පත්‍ර 01

## CAASL හි පුහුණු පාසල (CAATA)

CAATA යනු අධිකාරියේ පුහුණු කිරීමේ ශාඛාවයි. සියලු ආම්පන්න සහිත පුහුණු කිරීමේ ශාලා දෙකකින් සමන්විත මෙම ඒකකය පවත්වාගෙන යනු ලබන්නේ විශේෂ ව්‍යාපෘති අංශය විසින්ය. ගෘහස්ත පරිපාලන කාර්යයන්ට අමතරව CAATA පහසුකම්, විභාග පැවැත්වීම (AME, ELPC, AIRLAW, EB, RT) - (දින 38), ගුවන් ප්‍රවාහන සමාගම් ආසන වෙන් කිරීමේ පාඨමාලාව (දින 14), උසස් ශිෂ්‍ය නියමු වැඩසටහන (දින 17) මූලික ගුවන් යෝග්‍යතා පරීක්ෂක පුහුණුව (දින 15), අධිකාරිය විසින් පවත්වන ලද රැස්වීම් හා විවිධ කාර්යයන් (දින 19) වශයෙන් සම්පූර්ණ දින 103 ක් සඳහා පාවිච්චි කර ඇත.

CAATA ස්ථානගතකර තිබුනේ, ලංකා සංචාරක මණ්ඩළයට අයත් බද්දට ලබා ගත් ගොඩනැගිල්ලකය. CAATA පාවිච්චි කිරීම වැඩි කිරීම සඳහා පන්ති කාමර පහසුකම් කුලියට දීමට තිබෙන බව ප්‍රචාරය කරන විද්‍යුත් තැපැල් (e-mail) ප්‍රචාරණ ව්‍යාපාරයක්ද අධිකාරිය විසින් දියත් කරණු ලැබ ඇත. කෙසේ වුවද වර්ෂය අවසානයේදී CAATA ගොඩනැගිල්ල ආපසු ගැනීමට තීරණය කළ ලංකා සංචාරක මණ්ඩලය බදු ගිවිසුම දිර්ඝ කිරීම ප්‍රතික්ෂේප කළේය. ඒ අනුව සිවිල් ගුවන් සේවා අධිකාරිය අදාළ ගොඩනැගිල්ල ලංකා සංචාරක මණ්ඩලයට ආපසු භාර දුන්නේය.

### ගුවන් සේවා ඉන්ධන මිල නිරීක්ෂණය

විශේෂ ව්‍යාපෘති අංශය, ගුවන් සේවා ඉන්ධන මිල පිළිබඳ මාසික වාර්ථා ලංකා ඛණිජ තෙල් සංස්ථාවෙන් ලබාගෙන ඉන්දන මිලෙහි අඩු වැඩි වීම් නිරීක්ෂණය කරමින් එම තොරතුරු අවශ්‍ය පාර්ශවයන්ට සහ තීරණ ගන්නා පුද්ගලයින්ට අවශ්‍ය වූ විට ලබා දෙයි. පසු ගිය වසර කීහිපය තුළ පැවති ඉන්ධන මිල ගණන් පෙන්නුම් කෙරෙන ප්‍රස්ථාරයක් මෙම වාර්තාවේ 4 පරිශිෂ්ඨය වශයෙන් දී ඇත.

### 2010 වාර්ෂික වාර්තාව

2010 වාර්ෂික වාර්තාව සම්පාදනය කර, පළකර පාර්ලිමේන්තුවටද ඉදිරිපත් කරන ලද අතර රජයේ ආයතන සහ වෙනත් කර්මාන්ත හවුල් කරුවන් වෙත බෙදා හැරීමද සිදු කරන ලදී.

### තුටු පඩුරු

දින පොතක් මුද්‍රණය කර හොඳ හිතෙහි සංකේතයක් වශයෙන් අධිකාරියේ වටිනා ගණුදෙනුකරුවන් අතර බෙදා හරින ලදි.

## ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා අංශය

### ATC ප්‍රමාණ තක්සේරුව

සේවස්ථ පුහුණුව (OJT) අධීක්ෂණය කිරීමෙන්, ප්‍රමාණන තක්සේරු කිරීමෙන් සහ ගුවන් ගමන් පාලන පාඨමාලාවන්හි ප්‍රායෝගික පරීක්ෂණ පරීක්ෂා කිරීමෙන් AASL මගින් පවත්වනු ලබන ගුවන් ගමන් පාලන පුහුණු පාඨමාලාවන්හි ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා ANS අංශය ප්‍රධාන කාර්යය භාර්යයක් ඉටු කළේය.

### සෝදිසි කටයුතු

ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා අංශයේ සෝදිසි වැඩසටහනට ගුවන් සේවා ගමන් සැපයුම්කරු, ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරු සහ ගගන නාවික තොරතුරු සේවා සැපයුම්කරු නිත්‍ය පදනමක් මත මාසිකව පරික්ෂා කිරීම ඇතුළත් වේ. මෙම අංශය ගුවන් ගමන් සේවා පරික්ෂණ 24 ද, ගගන යාත්‍රාංගන පරික්ෂණ 19 සහ ගගන නාවික තොරතුරු සේවා පරික්ෂණ 12 ක් මෙම වර්ෂය තුළ පවත්වා ඇත. මේ අනුව අංශය විසින් පවත්වන ලද මුළු පරීක්ෂණ සංඛ්‍යාව 55 කි. මෙකී පරික්ෂණ නිරීක්ෂණය කරන ලද ඌනතා ඒවා නිවැරදි කිරීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ නිර්දේශද සමග සී/ස ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම වෙත දැනුම් දී ඇති අතර එම ඌනතා නිවැරදි කිරිමට අවශ්‍ය පියවර ගන්නේදැයි සුක්ෂම ලෙස නිරීක්ෂණය කර ඇත.

සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත වාර්තා වෙන ATS සිදු වීම් විමර්ශනය කර ඌනතා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග සේවා සැපයුම්කරුට වගකීමටද පැවරී ඇත්තේ ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා අංශයටයි. 2011 වර්ෂය තුළ මෙම අංශය ගුවන් ගමන් පාලනයට සම්බන්ධ සිදුවීම් එකකුත් (01) පරික්ෂාකර ගුවන් ගමන් සේවා සැපයුම්කරු වන සී/ස ගුවන් තොටුපළ හා ගුවන් ගමන් සේවා (ශ්‍රී ලංකා) සමාගම වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇත.

මීට අමතරව මෙම අංශය සිවිල් ගුවන් සේවා

නියාමන කාර්යයන්ට අදාළ රැස්වීම් 70 පමණ පවත්වා/සහභාගී වී ඇත.

### ජලාශ ගගන යාත්‍රාංගන

ට්වින් ඔටර් (Twin Otter) වර්ගයේ ඉපිලියානා (Float planes) පාවිච්චි කරමින් ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගම මෙහෙයුම් කළ එයාර් ටැක්සි (Air taxi) සේවාව පසු ගිය වසරේ යළි ආරම්භ කිරීමෙන් පසු ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගමේ ඉපිලියානා මෙහෙයුම් සඳහා ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා අංශය ජලාශ ගගන යාත්‍රාංගන 15 වක් අනුමත කර ඇත.

### උස් ගොඩනැගිලි සඳහා අනුමැතිය

2011 වර්ෂය තුළ ගගන යාත්‍රාංගන සහ ගුවන් සංතරණ සේවා අංශය විදුලි සංදේශ කුළුණු 572 ක් සහ උස් ගොඩනැගිලි 76 ක් තැනීමට අනුමැතිය ප්‍රදානය කර ඇත. 2005-2011 කාල සීමාවක් තුළ සිවිල් ගුවන් සේවා අධිකාරිය විදුලි සංදේශ කුළුණු තැනීමට අවසර දී ඇති ආකාරය පෙන්නුම් කෙරෙන ප්‍රස්ථාරය 08 පරිශිෂ්ඨය වශයෙන් දී ඇත.

### පුහුණු සැසි

ICAO හි, 2011 නව පියසර සැලැස්ම 2012 නොවැම්බර් 15 දින සිට ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇති හෙයින් මෙම අංශය COSCAP-SA සහයද සහිතව AASL සඳහා පුහුණු සැසි තුනක් (03) පැවැත්වීය.

### ඉහළින් පියාසර කිරීමේ සහ ගොඩබෑමේ අවසරය

2011 වර්ෂය තුළ සිවිල් ගුවන් සේවා අධිකාරිය ජාත්‍යන්තර පියසර 940 කට ශ්‍රී ලංකා දේශයට ඉහළින් පියාසර කිරීමටත් ජාත්‍යන්තර පියසර 630 කට ශ්‍රී ලංකාව තුළ ගොඩබෑමටත් අවසර දී ඇත. කාර්යයාල වේලාවෙන් බැහැර වේලාවන්හිදී AASL ද CAA වෙනුවෙන් මෙවැනි අවසර ලබා දෙන හෙයින් වර්ෂය තුළ ශ්‍රී ලංකා දේශයට ඉහළින් පියාසර කළ / ශ්‍රී ලංකා දේශය තුළ ගොඩබැසීම සිදු කළ පියසර වල මුළු ගණන මෙම සංඛ්‍යාවන්ගෙන් නොකියවේ.

### ගගන නාවික තොරතුරු සේවාව

2011 වර්ෂය තුළ මෙම අංශය මගින් ආරම්භ කර/නිකුත් කර ඇති ගගන නාවික ප්‍රකාශන සංඛ්‍යාව පහත දැක්වේ.

| | | |
|---|---|---|
| NOTAMS (ගුවන් සේවාවන්හි නිරත වූවන්ට දැනුම් දීම) | - | 197 |
| ගගන නාවික තොරතුරු ප්‍රකාශන සංශෝධන | - | 02 |
| ගගන නාවික තොරතුරු අතිරේක | - | 05 |
| ගගන නාවික තොරතුරු චක්‍ර ලේඛ | - | 10 |

### හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ගොඩනැගීම සඳහා නියාමන සහය

2011 වර්ෂය තුළ මෙම අංශය හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් ගුවන් තොටුපොළ අවට ආරක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කෙරෙන රෙගුලාසිද එම ප්‍රදේශ තුළ තැනිය හැකි ගොඩනැගිලි වල උස සීමා කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සුදානම් කර ඇත.

මීට අමතරව මෙම අංශය හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපොළ තැනීම සඳහා අවශ්‍ය නියාමක මග පෙන්වීම්ද ලබා දී ඇත.

# පියසර නිරුපද්‍රිතතා ශාඛාව

## පුද්ගල බලපත්‍ර අංශය

### අනුමත පුහුණු සංවිධාන මත නිරුපද්‍රිතතා කළමණාකරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

2010 නොවැම්බර් මස 18 වන දා සිට, රාජ්‍ය නිරුපද්‍රිතතා වැඩ සටහනෙහි අංගයක් ලෙස සිය සේවා සැපයිමේදී නිරුපද්‍රිතතා අවදානම් තත්වයන්ට නිරාවරණය වී ඇති අනුමත පුහුණු සංවිධාන සම්බන්ධව නිරුපද්‍රිතතා කළමණාකරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ICAO හි සියලුම පාර්ශවකාර රාජ්‍යයන් මත පැවරී ඇති අනිවාර්යය වගකීමකි. මෙම අවශ්‍යතාවයට අනුව කටයුතු කිරීම සඳහා පුද්ගල බලපත්‍ර අංශය නිරුපද්‍රිතතා කළමණාකරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පියසර පුහුණු පාසල් සමග සාකච්ඡා සහ රැස්වීම් ගණනාවක් පැවැත්වීය. නිරුපද්‍රිතතා උවදුරු හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාත්මක කළ යුතු නිවැරදි කිරීමේ පියවර ද යෝජනා කළේය. පුහුණු සංවිධාන තුළ පිළිගත හැකි තත්වයේ නිරුපද්‍රිතතා කළමණාකරණ ක්‍රම ක්‍රියාත්මක වන බවට සහතික වීම සඳහා එම සංවිධාන සම්බන්ධ පරීක්ෂණ ගණනාවක්ද පවත්වන ලදී.

### පියසර විභාග පරීක්ෂකවරුන් පත් කිරීම

විවිධ වර්ග වලට අයත් ගුවන් යානා මත, අයදුම්කරුවන් මත පියසර විභාග පැවැත්වීම සඳහා DGCA වරින් වර පියසර විභාග පරීක්ෂකවරුන් කීප දෙනෙක්ම පත් කර ඇතත් ඒ සියලු දෙනා ඔවුන්ගේ ප්‍රවර්තන පළපුරුද්ද සෑම විටම පවත්වාගෙන යන්නේ නැත. සාමාන්‍යයෙන් ගුවන් නියමු බලපත්‍ර අයදුම්කරුවන්ගේ පියසර පළපුරුද්ද පරීක්ෂා කිරීම සඳහා උපයෝජ්‍ය වශයෙන් ඇත්තේ පරීක්ෂකවරුන් දෙතුන් දෙනෙකු පමණි. 2011 වර්ෂය තුළ පුද්ගල බලපත්‍ර අංශය ගුවන් නියමුවන් දෙදෙනෙකුගේ සුදුසුකම් ඇගයීම සිදු කර ඔවුන්ගේ අවශ්‍ය පුහුණුව හා හැකියාව සම්බන්ධ පියසර විභාග සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුන් දෙදෙනා පියසර විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කළේය. පෞද්ගලික ගුවන් නියමු බලපත්‍ර, වාණිජ ගුවන් නියමු බලපත්‍ර, ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍ර, උපකරණ ප්‍රමාණන සහ සහකාර පියසර උපදේශක බලපත්‍ර අයදුම් කරන අයදුම් කරුවන් මත පියසර විභාග පැවැත්වීම සඳහා දැන් අධිකාරියට පියසර විභාග පරීක්ෂකවරුන් හතර(04) දෙනෙකු උපයෝජ්‍ය වශයෙන් ඇත.

### විදේශ ගුවන් නියමු බලපත්‍රධාරීන්ගේ දැනුම පරීක්ෂා කිරීම

විදේශ ගුවන් නියමු බලපත්‍ර දරන්නන් ඔවුන්ගේ බලපත්‍ර ශ්‍රී ලංකන් බලපත්‍ර වලට පරිවර්තනය කරන මෙන් අයදුම් කරන විට, අවශ්‍ය බලපත්‍ර ප්‍රවර්ධනයට අදාළ වෙනත් අවශ්‍යතා සමග අයදුම්කරුවන්ගේ තාක්ෂණික දැනුමද පරීක්ෂාකර බැලීමට ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වරයාට සිදු වේ.

2011 වර්ෂය වනතුරු එවැනි ගුවන් නියමුවන්ගේ පරීක්ෂා කරන ලද්දේ ගුවනේ නීතිය පිළිබඳ දැනුම පමණකි. එහෙත් 2011 දී පරිවර්ථනය කළ ගුවන් නියමු බලපත්‍ර වල තත්වය සහ ප්‍රමිතිය වර්ධනය කිරීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකාවේ DGCA විසින් ගුවනේ නීතිය සහ මෙහෙයුම් කාර්යය පටිපාටි විෂයට අමතරව, ගුවන් සංතරණ, කාලගුණ විද්‍යාව, කාර්යය සාධනය, උපකරණ, පියසර සැලසුම්, පියසර සිද්ධාන්ත සහ මිනිස් ක්‍රියාකාරීත්වය වැනි තාක්ෂණික විෂයයන්ද ආවරණය වන පරිදි සකස් කරන ලද අමතර ප්‍රශ්න පත්‍ර දෙකක් හඳුන්වා දෙන ලදී.

### පුද්ගල බලපත්‍ර අංශයේ කාර්යයන් ස්වයංකරණය කිරීම

පුද්ගල බලපත්‍ර අංශයේ ප්‍රධාන කාර්යය වනුයේ පුද්ගලයින්ට සහ පුහුණු සංවිධාන වලට බලපත්‍ර/සහතික පත්‍ර නිකුත් කිරීමයි.

සිවිල් ගුවන් සේවා කාර්යයන්හි නිරත වන පුද්ගලයින්ටද එවැනි කාර්යය සඳහා පුද්ගලයින් පුහුණු කරවන සංවිධාන වලටද සීමිත වලංගු භාවයකින් යුක්ත විවිධ ප්‍රවර්ගයන්ට අයත් බලපත්‍ර හා ප්‍රමාණන නිකුත් කරනු ලැබේ. එම බලපත්‍ර කළින් කළ අළුත් කිරීමට සැලැස්වීමෙන් එකී පුද්ගලයින්ගේ සහ සංවිධානවල හැකියාව සම්බන්ධව නිති පතා විමසිල්ලෙන් සිටින බවට සහතික වනු ලැබේ. විවිධ ප්‍රවර්ගයන්ට අයත් පුද්ගල බලපත්‍ර හා ගුවන් සේවා පුහුණු පාසල් බලපත්‍ර නිකුත් කිරීමට හා අලුත් කිරීමට අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා එකී පුද්ගලයින් සහ පුහුණු සංවිධාන, බලපත්‍ර හා ප්‍රමාණන නිකුත් කිරීමට සහ අලුත් කිරීමට අදාළ රෙගුලාසි හා කාර්යය පටිපාටි වල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සතුටු දායක ලෙස සම්පූර්ණ කර ඇත්දැයි සොයා බැලීම මෙම අංශයේ කාර්යයකි. දැනට පවතින ක්‍රමය අනුව මේ සියල්ල සිදු කරන්නේ නිලධාරී විසින් අතින්ය (Manualy).

මහජනයාට ගුවන් සේවා ක්ෂේත්‍රයේ කාර්යක්ෂම සහ ඉක්මන් සේවාවක් සැපයීම සඳහා පුද්ගල බලපත්‍ර අංශයේ කාර්යයන් ස්වයංකරණය කිරීමට තීරණය කරන ලදී. පුද්ගල බලපත්‍ර අංශය මේ සඳහා අදාළ පාර්ශවයන් සමග සාකච්ඡා හා රැස්වීම් පැවැත්වීම, යෝජනා ලබා ගැනීම ක්‍රම අධ්‍යනය සිදු කිරීම, මෘදුකාංග විකාශනය සඳහා මිල ගණන් කැඳවීම ආදී කාර්යයන් ඉටු කර අවසානයේදී 2012 ජනවාරි මාසයේදී පරිගණක ගත කිරීමේ වැඩ සටහන ආරම්භ කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසල සමග ගිවිසුමක් අත්සන් කළේය.

### වෛද්‍ය පරීක්ෂණ සඳහා රෝහලක් නම් කිරීම

සිවිල් ගුවන් සේවා අධිකාරිය පිළිවෙලින් 2006 වර්ෂයේදී සහ 2007 වර්ෂයේදී ගුවන් නියමුවන් හා ගුවන් හා ගුවන් ගමන් පාලක වරුන් සඳහා අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීමේ සේවා ලබා ගැනීම සඳහා සී/ස ඩර්ඩන්ස් හොස්පිටල් (පුද්) සමාගම සහ ආසිරි ශල්‍ය රෝහල නම් කර ඇත.

2011 වර්ෂයේදී අධිකාරිය ඉහත කී රෝහල් දෙකට අමතරව එකී සේවා ලබා ගැනීම සඳහා සී/ස ලංකා හොස්පිටල්ස් (පුද්) සමාගමද ගිවිසුමක් අත්සන් කළේය. මෙම වැඩ පිළිවෙළ යොදන ලද්දේ ගුවන් නියමුවන්ට හා ගුවන් ගමන් පාලක වරුන්ට ඔවුන්ගේ වෛද්‍ය පරීක්ෂණ සඳහා තෝරා ගැනීමට ඇති විකල්ප සංඛ්‍යාව වැඩි කිරීමටය.

## මෙහෙයුම් අංශය

### විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතික නිකුත් කිරීම

ANR 251 අනුව තවත් ගුවන් ප්‍රවාහන සමාගම් පහකට (05) විදේශ ගුවන් යානා මෙහෙයුම්කරු සහතික නිකුත් කරන ලදී. මේ වන විට නිකුත් කර ඇති සම්පූර්ණ සහතික සංඛ්‍යාව පණහකි (50).

### අනුකාරක (simulators) සඳහා අනුමැතිය දීම

මෙහෙයුම් අංශය, පියසර සේවක පිරිස් පුහුණුව සඳහාත්, දේශීය මෙහෙයුම් කරුවන් පරීක්ෂා කිරීම සඳහාත් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ ස්ථාන ගත කර ඇති එක් (01) අනුකාරකයක් (simulators) අනුමත කළේය.

### නම් කරන ලද සැසඳුම් නියමුවන්

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සාමාගම සහ සී/ස මිහින් ලංකා සමාගම විසින් සේවයෙහි යොදවාගෙන ඇති ගුවන් නියමුවන් පස් (05) දෙනෙකුට නම් කරන ලද සැසඳුම් නියමුවන් වශයෙන් කටයුතු කිරීමට බලය පවරන ලදී.

### ගුවන්යානා මෙහෙයුම්කරු සහතිකය

මෙහෙයුම් අංශය සෙනොක් ඒවියේෂන් සර්විස් සමාගමට හෙලිකොප්ටර් යානා දෙකක් යොදාගෙන හෙලිකොප්ටර් මෙහෙයුම් වල නිරත වීම සඳහා ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් නිකුත් කළේය. ගුවන් යානා මෙයෙහුම්කරු සහතිකයක් සඳහා තවත් ඉල්ලුම්පත්‍ර තුනක් (රෙඩ් රොක් වෙන්චර්ස්, ග්‍රීන් අයිලන්ඩ් මාර්කටින්, ජොන් කීල්ස් හෝල්ඩිංග්ස්) අංශය වෙත ලැබී තිබුණු අතර එම අයදුම්පත් සම්බන්ධව අවශ්‍ය කටයුතු කරමින් පැවතිණි. මෙම අංශය ඛණිජ තෙල් ගවේෂණ කාර්යයන් සඳහා වෙරළින් ඔබ්බෙහි මෙහෙයුම් සිදු කිරීමට හෙලිකොප්ටර් යානයක් පාවිච්චි කිරීමට අනුමැතිය දී ඇත. මීට අමතරව ගුවන් යානා මෙහෙයුම්කරුවන් තමන්ගෙ ගුවන් යානා සංඛ්‍යාව වැඩි කරගෙන තිබෙන අතර ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා විශාල ගුවන් යානා හයක් (06) ද දේශීය මෙහෙයුම් සඳහා කුඩා ගුවන් යානා තුනක්ද (03) එක් කිරීමේ ක්‍රියාවලියට මෙහෙයුම් අංශය මැදිහත් වී තිබුණි.

### මෙහෙයුම් කරුවන්ගේ අත්පොත් සංශෝධනය කිරීම

මෙහෙයුම් අංශය පහත සඳහන් අත්පොත් සඳහා වූ සංශෝධන සමාලෝචනය කර අනුමත කළේය.

පියසර මෙහෙයුම් අත්පොත - සංශෝධන 02 - මිහින් ලංකා
පියසර මෙහෙයුම් අත්පොත - සංශෝධන 03 - මිහින් ලංකා
පියසර මෙහෙයුම් අත්පොත - සංශෝධන 01 - එක්ස්පෝ ඒවියේෂන්
පියසර මෙහෙයුම් අත්පොත - සංශෝධන 02 - එක්ස්පෝ ඒවියේෂන්
පියසර මෙහෙයුම් අත්පොත - සංශෝධන 04 - මිහින් ලංකා
පියසර මෙහෙයුම් අත්පොත - සංශෝධන 05 - මිහින් ලංකා
පියසර මෙහෙයුම් අත්පොත - සංශෝධන 12 සහ 13 - ශ්‍රී ලංකන් එයාර් ලයින්ස්
පියසර මෙහෙයුම් අත්පොත - සංශෝධන 06 - මිහින් ලංකා
පියසර මෙහෙයුම් අත්පොත - සංශෝධන 03 - එක්ස්පෝ ඒවියේෂන්

### දේශීය මෙහෙයුම් කරුවන්ගේ පුහුණු වැඩසටහන් සමාලෝචන සහ අනුමත කිරීම

මෙහෙයුම් අංශය පහත සඳහන් පුහුණු වැඩසටහන් සාමාලෝචනය කර අනුමත කළේය.

ගුවන් නියමු පුහුණුව - ගිවිසුම් ආධුනික අත්පොත 06
නෙරපන ලද සේවක පිරිස් අත්පොත
ETOPS අත්පොත
A320 - අණ දෙන පාඨමාලාව - ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්
A330 - A340 ප්‍රතිසක්‍රියන පාඨමාලාව - ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්
SOP අත්පොත - ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්
පියසර පිටත් කිරීමේ අත්පොත - එක්ස්පෝ ඒවියේෂන්
SMS අත්පොත - සෙනොක් එවියේෂන්
බර හා තුලන අත්පොත - සංශෝධන අංක 07 - ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්
A320 ඍජු පිවිසුම් ප්‍රථම නිලධාරී පාඨමාලාව (නව ආකෘතිය) ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්
A320 කණිෂ්ඨ ප්‍රථම නිලධාරී පාඨමාලාව
බර හා තුලන අත්පොත - සංශෝධන අංක 07 - ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්
A320 නිත්‍ය පරිවර්ථන පාඨමාලාව - මිහින් ලංකා
ETOPS භූමි පුහුණු පාඨමාලාව - ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්
A320 ප්‍රතිසක්‍රියන පාඨමාලාව - ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්
ගිවිසුම් ගත වර්ග ප්‍රමාණනික ආධුනික නියමු පුහුණු අත්පොත - මිහින් ලංකා
සංක්‍රමණ පුහුණු අත්පොත (A320 සංක්‍රමණ පාඨමාලාව SFT - CO4) - සවුත් ඒෂියා ඒවියේෂන් සර්විස්
A320 වර්ග ප්‍රමාණන පාඨමාලාව - ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්
A320 ප්‍රතිසක්‍රියන පාඨමාලාව - ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්
පියසර පිටත් කිරීමේ අත්පොත - එක්ස්පෝ ඒවියේෂන්
පුහුණු අත්පොත 06 - සෙස්නා ග්‍රෑන්ඩ් කැරවන් - එක්ස්පෝ ඒවියේෂන්
A320 සංක්‍රමණ පාඨමාලා සවුත් ඒෂියා ඒවියේෂන් සර්විස්

### USOAP විගණනය

සොයාගත් ඌනතා අටක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිවැරදි කිරීම් ක්‍රියා මාර්ග ICAO විසින් පිළිගන්නා ලද අතර එයින් ඌනතා දෙකකට අදාළ නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතුව ඇත.

## ගුවන් යෝග්‍යතා අංශය

### අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව

එයාර් බස් A-320 A-330 සහ A-340 වර්ගයන්හි ගුවන් යානාවන්ගෙන් සමන්විත සම්පූර්ණ ගුවන් යානා සංඛ්‍යාව 19 ක්වූ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ ගුවන් යානා ඇණියෙහි අඛණ්ඩව ගුවන් යෝග්‍යතාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සෝදිසි කාර්යයන් ගුවන් යෝග්‍යතා අංශය විසින් ඉටු කරන ලදී. පොදු ගුවන් සේවා ගුවන් යානා සම්බන්ධව මෙවැනිම සෝදිසි කටයුතු අංශය විසින් ඉටු කරන ලද අතර වර්ෂය තුළ ගුවන් යෝග්‍යතා සහතික (මුල්වර) දහඅටක් (18) නිකුත් කරන ලද අතර ගුවන් යෝග්‍යතා සහතික 27 අළුත් කරන ලදී.

## ගුවන්යානා නඩත්තු සංවිධාන

අවශ්‍ය ඇගයීම් සිදු කිරීමෙන් පසු ගුවන් යානා නඩත්තු සංවිධාන දෙකකට මුල් වර අනුමැතිය ප්‍රදානය කරන ලදී. 2011 වර්ෂය සඳහා විදේශ මූල සහ රේඛීය නඩත්තු සංවිධාන (42) සහ දේශීය නඩත්තු සංවිධාන තුනක් (03) අනුමැතිය අළුත් කරන ලදී.

## ගුවන් යානා ලියාපදිංචි කිරීම

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ගුවන් යානා දාහතරක් (14) සඳහා ලියාපදිංචි කිරීමේ සහතික (මුල්වර) නිකුත් කළ අතර ගුවන් යානා විසි හතරක (24) ක ලියාපදිංචි කිරීමේ සහතික අළුත් කලේය. මෙහෙයුම් කරුවන්ගේ ඉල්ලීම මත ගුවන් යානා දෙකක් (02) ශ්‍රී ලංකා ගුවන් යානා ලේඛනයෙන් ඉවත් කළේය.

## නිරුපද්‍රිතතා අධීක්ෂණය

අනුමත රැම්ප් (Ramp) පරීක්ෂණ උප ලේඛනයට අනුව දේශීය ගුවන් යානා මත රැම්ප් පරීක්ෂණ තිස් හයක්ද (36) විදේශ මෙහෙයුම් කරුවන් මත රැම්ප් පරීක්ෂණ විස්සක්ද (20) ද, පොදු ගුවන් සේවා සම්බන්ධ රැම්ප් පරීක්ෂණ නවයක්ද (09) 2011 වර්ෂය තුළ පවත්වන ලදී.

## වීසා සඳහා නිර්දේශ

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය භූමි ඉංජිනේරුවන්ට ගොඩබෑසීමේ පිටසන් සහ පදිංචි වීමේ වීසා ලබාගැනීම සඳහා නිර්දේශ නිකුත් කළේය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ භූමි ඉන්ජිනේරුවරුන් සඳහා නිර්දේශ තිස් තුනක් (33) නඩත්තු පුහුණු ශිෂ්‍යයින් සඳහා නිර්දේශ හතලිස් පහකුත් (45) නිකුත් කර ඇත.

## නඩත්තු ඉංජිනේරු බලපත්‍ර

ගුවන් යෝග්‍යතා අංශය කර්මාන්තයේ නිරත වී සිටින පුද්ගලයින්ට ගුවන් යානා නඩත්තු ඉන්ජිනේරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා AME (BL) විභාග හතරකුත් (04) AML විභාග එකකුත් පැවැත්වීය. වැඩිදුරටත් AME (BL) AML වලට පරිවර්ථනය කිරීම සඳහා පරිවර්ථන විභාග දෙකක්ද (02) වර්ග (Type) විභාග හයක්ද (06) වලංගු කිරීමේ විභාග හතරක් (04) එම අංශය විසින් 2011 වර්ෂය තුළ පවත්වන ලදී.

## අමතර කොටස් සඳහා අනුමැතිය දීම

ගුවන් යෝග්‍යතා අංශයේ නිර්දේශ මත සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරල්වරයා ගුවන් යානා අමතර කොටස් ආනයනය /අපනයනය අනුමත කළේය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ගුවන් යෝග්‍යතා අංශය එක්පෝ ඒවියේෂන් සමාගමේ ඉල්ලීම් තිස් එකක් (31) ක් ද, ඩෙකෑන් ඒවියේෂන් සමාගමේ ඉල්ලීම් විසි දෙකක් (22) ක් ද ඒෂියන් ඒවියේෂන් සෙන්ටර් හි ඉල්ලීම් අටක් (08) ද දයා ඒවියේෂන්හි ඉල්ලීම දහයක්ද (10), කොස්මොස් ඒවියේෂන් සර්විසස් හි ඉල්ලීම් විසි නවයක් (29) ද ස්කයිලයින් ඒවියේෂන්හි ඉල්ලීම් පහක්ද (05) ද, ඔපන් ස්කයිස් සමාගමේ ඉල්ලීම් පහලොවක් (15) ද එරෝලංකා සමාගමේ ඉල්ලීම් දෙකක් (2) ද නිර්දේශ කර ඇත.

ගුවන්යානා නිරුපද්‍රිතතා ශාඛාව

# ඒකාබද්ධ ශාඛාව

## ගුවන් ප්‍රවාහන හා නීති කටයුතු අංශය

### ගුවන් සේවා සංඛ්‍යා ලේඛන

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා කාර්යයන් පිළිබඳ සංඛ්‍යා ලේඛන කලට වේලාවට ICAO වෙත ලබා දෙමින් එහි වගකීම ඉටු කර ඇත.

### ගුවන් ප්‍රවාහන සමාගම් මෙහෙයුම්

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් ආරම්භ කල නව විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් ගණනාවක් වීය. මේ අතර තවත් සමහර ගුවන් ප්‍රවාහන සමාගම් කොළඹ දක්වා කරන මෙහෙයුම් යළි ආරම්භ කළේය. ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් ආරම්භ කළ අළුත් උපලේඛණ ගත ගුවන් ප්‍රවාහන සමාගම් වූයේ යුක්රේනයේ ඒරෝසවිට් (AEROSVIT) සමාගමයි. ඒරෝෆ්ලොට් (AEROFLOT) සමාගම එහි මෙහෙයුම් යළි ආරම්භ කළේය. 2011 නව කුලී මෙහෙයුම්කරු වූයේ යුක්රේනයේ එන්ටඑයාර් (ENTER AIR) සමාගමයි. 2011 අවසානයේදී මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිතව තිබුණු තායි එයාර් ඒෂියා සමාගම (THAI AIR ASIA) සමාගම එම තීරණය වෙනස් කොට දැන් 2012 මාර්තු මාසයේදී මෙහෙයුම් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

වර්ෂය තුළ මිහින් ලංකා සමාගම ඉන්දුනීසියාවට හා බංගලාදේශයට මගී ප්‍රවාහන සේවා ආරම්භ කළ අතර ජපානයට හා චීනයට මෙහෙයුම් කළ ගමන් වාර සංඛ්‍යාව වැඩි කළේය. ඊට අමතරව සූරිච් (ZURICH) මෙහෙයුමද යළි ආරම්භ කළේය.

### මගී හා නැව් බඩු චලන

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මගී හා නැව් බඩු චලන සංඛ්‍යාවෙහි සැහෙන වර්ධනයක් වාර්තා වී තිබුණි. බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (BIA) වෙත පැමිණි හා ඉන් පිටත්ව ගිය මගී සංඛ්‍යාවන් පිළිවලින් 3,079,126 ක් සහ 3,095,089 ක් විය. මෙම මගී සංඛ්‍යාවෙන් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්හි වෙළදපොළ කොටස 1,508,288 ක් සහ 1,511,333 ක් වූ අතර එයින් පිළිවලින් පැමිණි හා පිටත් වී ගිය මගීන්ගෙන් සියයට පණහක් (50%) සහ සියයට හතලිස් නවයක් (49%) ක් නියෝජනය වේ.

2011 දී බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙන් පැටවූ නැව් බඩු මෙට්‍රික් ටොන් 95,411 කින් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ වෙළඳපොළ කොටස වූයේ මෙට්‍රික් ටොන් 43,516 කි. මෙය සම්පූර්ණ නැව් බඩු ප්‍රමාණයෙන් සියයට හතලිස් හයකි (46%)කි. බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙන් ගොඩ බෑ නැව් බඩු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 63,161 වූ අතර මෙයින් මෙට්‍රික් ටොන් 37,890 ක් හෙවත් සියයට හැටක්(60%) ශ්‍රී ලංකන් එයාර් ලයින්ස්හි වෙළඳපොළ කොටස විය.

### සංක්‍රමණ මගීන්

බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මෙම කලාපයේ කේන්ද්‍ර ගුවන් තොටුපොළක් වශයෙන් දියුණු කිරීමට අදහස් කරන්නේ නම් ගුවන් තොටුපොළ හරහා ගමන් කරන (සංක්‍රමණ) මගීන් සංඛ්‍යාව වැඩි කර ගැනීම ඒ සඳහා ඉතාමත් වැදගත් සාධකයක් වනු ඇත. වර්ෂය තුළ බණ්ඩරණායක ගුවන් තොටුපොළට පැමිණි සංක්‍රමණ මගීන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව 710,867ක් වූ අතර එම සංඛ්‍යාව සම්පූර්ණ පැමිණීමේ සංඛ්‍යාවෙන් සියයට විසිහතරකි (24%) කි. මෙම සංක්‍රමණ මගීන් සංඛ්‍යාවෙන් සියයට අනූ අටක් (98%) ප්‍රවාහනය කර ඇත්තේ ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම විසින්ය.

## දේශීය ගුවන් සේවාව

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ උපලේඛන ගත මගී ප්‍රවාහන සේවාවන් හි නිරත වූ දේශීය ස්තම්භ තටු (Fixed Wing) ගුවන් යානා මෙහෙයුම්කරුවන් කිසිවෙකු සිටියේ නැත. මෙම වර්ෂය තුළ යාපනය හා රත්මලාන අතර දෙදිසාවට ගමන් කළ මගී සංඛ්‍යාවේ හි (94) සුළු වැඩි වීමක්ද දක්නට ලැබුණි. 2004 ජුනි මාසයේදී හෙලිකොප්ටර් මෙහෙයුම් ආරම්භ කළ සී/ස ඩෙකෑන් ඒවියේෂන් (ලංකා) සමාගම රට තුළ ගමනාන්ත කීපයකටම ඔවුන්ගේ මෙහෙයුම් සිදු කළහ. කොස්මෝස් ඒවියේෂන් සමාගමද ඔවුන්ගේ හෙලිකොප්ටර් මෙහෙයුම් නොකඩවා පවත්වාගෙන ගියහ. සෙනොක් ඒවියේෂන් සමාගම 2011 අවසානයේ හෙලිකොප්ටර් මෙහෙයුම් ආරම්භ කළහ. රටට පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාවේ සීඝ්‍ර වර්ධනයත් සමග ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගම 2011 වර්ෂය පුරා ඔවුන්ගේ එයාර් ටැක්සි (Air Taxi) මෙහෙයුම් නොකඩවා පවත්වාගෙන ගියේය. සී/ස දයා ඒවියේෂන් සමාගම පෞද්ගලික වාණිජ මෙහෙයුම් නොකඩවා පවත්වාගෙන ගියේය.

## සංචාරක නියෝජිතවරු

1992 අංක 55 දරණ ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත අනුවත් ඒ යටතේ පවත්වන ලද රෙගුලාසි අනුවත් ශ්‍රී ලංකාව තුළ සිටින සියලුම සංචාරක නියෝජිතවරුන් (CAASL) විසින් නිකුත් කරනු ලබන සහ වාර්ෂිකව අලුත් කරනු ලබන බලපත්‍රයක් ලබා ගත යුතුව ඇත. මෙම නියෝජිතයන් විසින් පුද්ගලයින් සෑහෙන සංඛ්‍යාවක් ඔවුන්ගේ සේවයෙහි යොදවා ගනු ලැබ ඇත.

## ද්වී පාර්ශවීය ගුවන් සේවා සාකච්ඡා

විදේශ ගුවන් සේවා බලධාරීන් සමග පවත්වන ලද ද්වී පාර්ශවීය ගුවන් සේවා සාකච්ඡා වලට CAASL ද සහභාගී විය. මෙම සාකච්ඡා අතරින් පහක් (05) පවත්වන ලද්දේ තනි තනි රාජ්‍යයන් සමගය. මීට අමතරව ඉන්දියාවේ පවත්වන ලද ගුවන් සේවා සාකච්ඡා පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයටද (ICAN) CAASL සහභාගී විය. මෙම සාකච්ඡාවන්හි ප්‍රතිඵල පහත දැක්වේ.

## තනි රාජ්‍යයන් සමග පවත්වන ලද ද්විපාර්ශවීය සාකච්ඡා

- දකුණු අප්‍රිකාව - (මාර්තු මස - කොළඹදී) රාජ්‍යයන් දෙක අතර පවතින ගුවන් සේවා ගිවිසුම් ක්‍රමිකව නවීකරණය කිරීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. සතියකට ගුවන් ගමන් වාර 7 දක්වා ප්‍රවාහන අයිතිවාසිකම් ලබා දීමට දෙපාර්ශවය එකඟ විය.
- ඉන්දියාව - (අප්‍රේල් මස - නවදිල්ලියේ දී) - එකිනෙක පාර්ශව නම් කරන ලද ගුවන් ප්‍රවාහන සමාගම් වලට සතියකට ගමන් වාර 112 දක්වා ප්‍රවාහන අයිතිවාසිකම් ලබා දීම සඳහා රාජ්‍යයන් දෙක අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් සඳහා චෙන්නායි දක්වා නව ගමන්වාර ගණනාවක් ලබා ගැනීමට ද හැකි විය.
- රුසියාව - (ජුලි මස මොස්කව් හිදී) - නිරුපද්‍රිතතා විධිවිධාන, සුරක්ෂිතතාව, ගුවන් ගමන් ගාස්තු බහු සමාගම් නම් කිරීම සහ වාණිජ අවස්ථා සම්බන්ධව සාකච්ඡා කිරීම හරහා රාජ්‍ය දෙක අතර පවතින ගුවන් සේවා ක්‍රමිකව නවීකරණය කිරීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
- පිලිපීනය - (ජුනි මස මැනිලා හිදී) - දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර, කොළඹ හා මැනිලා අතර ප්‍රවාහන අයිතිවාසිකම් සතියකට ගුවන් වාර හතර දක්වා (සතියක ආසන 600) වැඩි කරන ලදී. මැනිලා හැර වෙනත් ඕනෑම ස්ථානයකටත් ආපසුත් ගමන් වාර සංඛ්‍යාව හා ධාරිතාව සීමා නොකිරීමටද එකඟ විය.

## 2011 ඔක්තෝම්බර් මාසයේදී ඉන්දියාවේ මුම්බායි නගරයේදී පවත්වන ලද ICAN සම්මේලනයේදී පවත්වන ලද ද්වීපාර්ෂවීය සාකච්ඡා

2011 ඔක්තෝම්බර් මස 17-22 දක්වා ඉන්දියාවේ මුම්බායි නගරයේදී පවත්වන ලද ගුවන් සේවා ගිවිසුම් සම්බන්ධ ICAO සම්මේලනයට (ICAN) ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට සහභාගී විය. ශ්‍රී ලංකාව සහභාගී වූ සාකච්ඡා සමහරක ප්‍රතිඵල පහත දැක්වේ.

- සවුදි අරාබිය - එක් රාජ්‍යකට අනුමත කර ඇති ගමන් වාර සංඛ්‍යාව සතියට 14 දක්වා වැඩි කරන ලද අතර බහු සමාගම් නම් කිරීමකට ද එකඟවන ලදී.
- කැනඩාව - 2012 මැයි මාසයේදී ගුවන් සේවා ගිවිසුමක් සඳහා සාකච්ඡා පැවැත්වීමට දෙපාර්ශවය එකඟ විය.
- ප්‍රංශය - දැනට පවතින ගිවිසුම් පුළුල් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීමට දෙපාර්ශවය එකඟ විය.

» පෝලන්තය - නිරුපද්‍රිතතා විධිවිධාන, සුරක්ෂිතාව, ගුවන් ගමන් ගාස්තු බහු සමාගම් නම් කිරීම සහ වාණිජ අවස්ථා සම්බන්ධව සාකච්ඡා කිරීම හරහා රාජ්‍ය දෙක අතර පවතින ගුවන් සේවා ගිවිසුම් ක්‍රමිකව නවීකරණය කිරීමේ අරමුණෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

» ඇසර්බයිජාන් - අනෙක් පාර්ශවයේ රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමේ කොන්දේසියට යටත්ව රාජ්‍යයන් දෙක අතර කුලී ගුවන් යානා මෙහෙයුම් සඳහා අවසර දීමට එකඟ වෙමින් දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. අනාගතයේ අත්සන් කිරීම සඳහා ගුවන් සේවා ගිවිසුමක කෙටුම්පතක් සම්බන්ධව සාකච්ඡා පවත්වන ලදී.

» නෝර්වේ/ඩෙන්මාර්ක්/ස්වීඩන් හවුල් නියෝජනය - ශ්‍රී ලංකාව EU තිරස් ගිවිසුම අත්සන් කළ විට ඒ බව ස්කැන්ඩිනෝවියානු නියෝජිත පිරිසට නිල වශයෙන් දැනුම් දී EU ගිවිසුමේ ඇතුළත් වගන්ති වලට අදාළ කරුණු සාකච්ඡා කරන බව සඳහන් කරමින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

» එක්සත් අරාබි එමිර් රාජධානිය - අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර තාවකාලික මෙහෙයුම් අවසරය ලබා දී ස්ථිර කරන ලදී. ශ්‍රී ලංකා නියෝජිත පිරිස, මත්තල ගුවන් තොටුපොළට මෙහෙයුම් සිදු කිරීම ආරම්භ කරන මෙන් UEA ගුවන් ප්‍රවාහන සමාගම් වලට විධිමත් පරිදි ආරාධනා කළේය.

» ස්පාඤ්ඤය - ගුවන් සේවා සම්බන්ධතාවක් ආරම්භ කිරීම සඳහා අනාගතයේදී ශ්‍රී ලංකාව සහ ස්පාඤ්ඤය අතර ගුවන් සේවා ගිවිසුමක් අත්සන් කිරීම පිළිබඳ මූලික සාකච්ඡා අවසන් කරන ලදී.

» ජැමෙයිකාව - ද්වි පාර්ශවීය ගුවන් සේවා සම්බන්ධතාවක් ආරම්භ කර ඉදිරියට යාම සම්බන්ධව ධනාත්මකව සාකච්ඡා පවත්වන ලදී.

» අයිස්ලන්තය - දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර හවුල් සංකේත/කුලී/තැව් බඩු මෙහෙයුම් හැකි ඉක්මනින් ආරම්භ කිරීමට රාජ්‍යයන් දෙකේ ගුවන් ප්‍රවාහන සමාගම් උනන්දු කරවීය.

## EU තිරස් ගිවිසුම

යුරෝපා සංගමය තුළ සිටින ශ්‍රී ලංකාවේ ද්වි පාර්ශවීය හවුල් කරුවන් සමග ඇති ගුවන් සේවා සම්බන්ධතාවන්ට අදාළ සමහර කරුණු සම්බන්ධව 2011 ඔක්තෝම්බර් මස 11 වන දින ශ්‍රී ලංකාව EU තිරස් ගිවිසුමට ඇතුළත් විය. මෙයින් EU තිරස් ගිවිසුම් අත්සන් කර ඇති විශාල රාජ්‍යයන් සංඛ්‍යාවක් අතරට ශ්‍රී ලංකාවද එක් විය. එයින් වැඩි දුරටත් අදහස් වූයේ ශ්‍රී ලංකාව EU සාමාජික රාජ්‍යයන් සමග අත්සන් කර ඇති ද්වි පාර්ශවීය ගුවන් සේවා ගිවිසුම් යුරෝපා සංගමයේ නීති වලට පටහැනි නොවන බවය.

## ආසන වෙන්කිරීමේ සහ ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව

2009 වර්ෂයේ ආරම්භ කරන ලද ආසන වෙන් කිරීමේ සහ ගාස්තු ගණනය කිරීමේ පාඨමාලාව සංචාරක කර්මාන්තයට අවශ්‍ය පුහුණු මානව සම්පත සැපයීම අතින් ස්ථිර දියුණුවක් ලබා ඇත. මෙම පාඨමාලාව හැදෑරූ 4 වන ශිෂ්‍ය කණ්ඩායම 2011 ඔක්තෝම්බර් මාසයේදී ඉගෙනුම සම්පූර්ණ කළහ. 5 වන කණ්ඩායම 2012 ජනවාරි මාසයේදී පාඨමාලාව ආරම්භ කිරීමට නියමිතය.

## වාර (SLOT) සමායෝජනය

වාර (SLOT) කමිටුවේ සම්මත උපමානයන්ට අනුකූලව BIA වාර වෙන් කිරීම සිදු කෙරිණ. රට තුළ පවතින සාමකාමී වාතාවරණය සමග ගුවන් ප්‍රවාහන සමාගම් සහ ගුවන් මගීන් වැඩි වැඩියෙන් බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ඔවුන්ගේ ගමනාන්තය වශයෙන් තෝරා ගනිමින් පවතින නිසා අනාගතයේදී ධාරිතා සීමා කිරීම් සිදු වීමට ඉඩ ඇත.

## පොදු පරීක්ෂණ වැඩසටහන්

සංචාරක නියෝජිත ආයතන සහ BIA හි වාණිජ මෙහෙයුම් පරීක්ෂා කිරීම සඳහා පොදු පරීක්ෂකවරුන් සංචිතයක් පිහිටුවන ලදී. CAA හි දැනට සිටින කාර්යය මණ්ඩල සාමාජිකයන් අතරින් පුද්ගලයින් බඳවාගෙන ඔවුන් පරීක්ෂකවරුන් වශයෙන් පුහුණු කරවන ලදී.

## (APIG) ගුවන් තොටුපොළ ක්‍රියා පිළිවල වැඩි දියුණු කිරීමේ සංසදය

කර්මාන්ත හවුල්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ගැටළු විසඳීම සඳහා BIA හි වාණිජ මෙහෙයුම් නිරීක්ෂණය කිරීමට DGCA විසින් පුද්ගලයන් කීප දෙනෙකුගෙන් යුත් කුඩා කණ්ඩායමක් පත් කරන ලදී. මෙම අංශය විසින් එම කණ්ඩායම හසුරවන ලද අතර දියුණු කිරීමේ ක්‍රියාමාර්ග යෝජනා කිරීම් සඳහා

ඔවුන්ගේ නිරීක්ෂණ ක්‍රමවත්ව සකස් කරන ලදී.

### පාරිභෝගික පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම

පාරිභෝගික පැමිණිලි ගැන කටයුතු කිරීම සඳහා මෙම අංශය 2011 ඔක්තෝම්බර් මාසයේදී පාරිභෝගික කටයුතු අධිකාරිය සමග එක්ව යාන්ත්‍රණයක් සකස් කළේය. ඉන් පසු ගුවන් ප්‍රවාහන සමාගම් වලට සහ සංචාරක නියෝජිත වරුන්ට එරෙහිව ඉදිරිපත් කරන ලද පැමිණිලි ගණනාවක්ම වෘත්තීමය ප්‍රවිෂ්ඨයකින් විසඳන ලදී. ගුවන් සේවා කර්මාන්තයෙන් සහ ගුවන් ගමන් යන මහජනයාගෙන් මෙම වැඩපිළිවලට ධනාත්මක ප්‍රතිචාරයක් ලැබී ඇත.

### ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ හවුල්කරුවන් /වාණිජ දෙපාර්තමේන්තුව සමග රැස්වීම්

ගුවන් සේවා කර්මාන්තයේ ධනාත්මක වර්ධනයක් සහතික කිරීම සඳහා මෙම අංශය ගුවන් ප්‍රවාහන සමාගම් නියෝජිත මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක නියෝජිත මණ්ඩලය, IATA නියෝජිත සංගමය වැනි ගුවන් සේවා කර්මාන්තයට සම්බන්ධ සංවිධාන හා වාණිජ දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන සමග රැස්වීම් නිතිපතා සංවිධානය කළේය.

### මොරටුව විශ්ව විද්‍යාලයේ සේවා අපේක්ෂකයන්ට සේවස්ථ පුහුණුව

මොරටුව විශ්ව විද්‍යාලයේ ඉල්ලීමක් මත ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය 2011 දී උපාධි අපේක්ෂකයින් තිදෙනෙකුට (03) මාස (06)ක කාලයක් අධිකාරිය තුළ සේවාස්ථ පුහුණුව ලබා දුන්නේය. මෙම අංශය එකී පුහුණු වැඩසටහන සමායෝජනය කළ අතර අධ්‍යාපන චාරිකා සංවිධානයෙන් උපාධි අපේක්ෂකයින් ගුවන් සේවා කර්මාන්තයට නිරාවරණය කරන ලදි. DD/AT-LA ඔවුන්ගේ අධීක්ෂක වශයෙන් කටයුතු කළේය. මේ වන විට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ප්‍රවාහන හා සහයක සේවා කළමණාකරණ දෙපාර්තමේන්තුවේ සිසුන් 07 දෙනෙකුට මෙම සේවාව සපයා ඇත.

## මානව සම්පත් හා කාර්යයාල කළමණාකරණ අංශය

### කාර්යය මණ්ඩලය

CAASL හි අනුමත සේවක සංඛ්‍යාවෙහි දැනට තනතුරු එකසිය හැට පහක් (165) ක් ඇත. ඊට ප්‍රධාන විධායක නිලධාරියෙකු, ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් විසි හය දෙනෙකු (26), විධායක නිලධාරීන් තිස් පස් දෙනෙකු (35), කාර්යය භාර නිලධාරීන් පනස් තුන් දෙනෙකු (53), සහයක කාර්යය මණ්ඩලය තිස් දෙනෙකු (30) ඇතුළත් වේ. 2011 දෙසැම්බර් අවසානය වන විට නව ප්‍රවේශයකින් තිස් එක් දෙනෙක් (31) ද ඇතුළුව CAASL හි සේවයෙහි යෙදී සිටි සේවකයින්ගේ සම්පූර්ණ සංඛ්‍යාව එකසිය හතලිස් පහකි (145).

### සේවක සුභසාධනය

සේවකයින්ගේ සහ ඔවුන්ගේ ආසන්න පවුල් සාමාජිකයන්ට පිරිනමන සුභ සාධක පහසුකමක් වශයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරිය එහි වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය නොකඩවා පවත්වාගෙන ගියේය.

2011 මැයි මාසයෙන් ආරම්භ වූ කාල සීමාව තුළ මෙම යෝජනා ක්‍රමය යටතේ ගෘහස්ථ පහසුකම් වශයෙන් රු 944,752/= ක මුදලක් ද බාහිර වෛද්‍ය පහසුකම් වශයෙන් 933,462/= ක් මුදලක් සේවකයින් එකසිය දහ තුන්දෙනෙකුට (113) ගෙවා ඇත. ඔවුන්ගේ සෞඛ්‍යයට නිරුපද්‍රිතතාවට සහ සුරක්ෂිතතාවට හානිකර වන තත්වයන්ට මුණ පැමට සිදු විය හැකි සිවිල් ගුවන් සේවා පරීක්ෂකවරුන්ට විශේෂ ආවරණයක් පිරිනැමීමට සෙලින්කෝ ඉන්ෂුවරන්ස් PLC ආයතනය එකඟ වූ හෙයින් CAASL හි අනතුරු රක්ෂණ යෝජනා එකී ආයතනය සමග අළුත් කරන ලදී.

සේවකයින්ට සහය වීමක් වශයෙන් සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් රු 4,531,278/= මුදලක් ආපදා ණය වශයෙන් සේවකයන් තිස් දෙනෙකුට (30) රු 10,619,293/=ක මුදලක් දේපොළ ණය වශයෙන් සේවකයින් හත් (07) දෙනෙකුටද ගෙවන ලදී. මීට අමතරව 2011 වර්ෂය තුළ වාහන හා යතුරු පැදි මිලදී ගැනීම සඳහා රු 5,090,000/= ක මුදලක්ද ණය මුදල් වශයෙන් ගෙවා ඇත. ත්‍රීරෝද රථ ණය ක්‍රමයද සේවකයින්ට වැඩි පහසුකම් සහිතව සංශෝධනය කරන ලද අතර වර්ෂය තුළ සේවකයින් නව (9) දෙනෙකුට රු 3,309,256/=ක මුදලක් ත්‍රීරෝද රථ ණය මුදල් වශයෙන් ගෙවා ඇත.

### පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් සහ සම්මේලන

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ CAASL කාර්යය මණ්ඩලයේ දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් සහ සම්මේලන සඳහා රු 22,782,411.78/= ක මුදලක් වැයවී ඇත. 2011 වැඩසටහන් අයවැයෙහි සහ 2011 පුහුණු වැඩසටහනෙහි හඳුනා ගන්නා ලද පුහුණු අවශ්‍යතා

සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන ඇතුළත් පහසුකම් සලස්වන ලදී.

පිළිවලින් විධායක නිලධාරීන්ට සහ සිවිල් ගුවන් සේවා නිලධාරින්ට පිරිනමන ලද විදේශ පුහුණු අවස්ථා, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් හා සම්මේලන අවස්ථා ඇතුළත් මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් අනූවක් (90) වර්ෂය තුළ සිදුකර ඇත. දේශීය පුහුණු අවස්ථා, සම්මන්ත්‍රණ, වැඩමුළු රැස්වීම් හා සම්මේලන අවස්ථා එකසිය තිස් පහක් (135) විධායක නිලධාරීන්ට හා කාර්යය භාර නිලධාරීන්ට ප්‍රදානය කර ඇත. මේ අනුව 2011 වර්ෂය තුළ CAASL හි සේවකයන්ට පිරිනමන ලද පුහුණු අවස්ථා, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් හා සම්මේලන අවස්ථා මුළු ගණන දෙසිය විසි පහකි (225) කි. 2010 වර්ෂය සමග සසඳන කල සේවකයින් සහභාගී වූ දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සම්මන්ත්‍රණ වැඩමුළු රැස්වීම් සහ සම්මේලන අවස්ථා සංඛ්‍යාවෙහි සැලකිය යුතු වැඩිවීමක් දක්නට ඇත.

## තාක්ෂණික පුස්තකාලය

ගුවන් සේවා කර්මාන්තය කෙරෙහි උනන්දුවක් දක්වන අයට සේවය සැපයීම තාක්ෂණික පුස්තකාලයේ ප්‍රධාන අරමුණ වේ. CAASL හි කාර්යය මණ්ඩලයෙන් මෙන්ම ගුවන් සේවා කර්මාන්තයෙහි නිරත වන පිටස්තර පුද්ගලයින්ගෙන්ද CAASL හි තාක්ෂණික පුස්තකාලයට අනුග්‍රහය ලැබී තිබේ.

පුස්තකාලය පරිහරණය කරන පිටස්තර පුද්ගලයින්ගේ සංඛ්‍යාව සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ සියයට විසි පහකින් (25) වැඩි වී ඇත. එය සම්පත් හා දැනුම් මධ්‍යස්ථානයක් වශයෙන් සේවය කරයි. 2011 වර්ෂය තුළ පුස්තකාලයට අළුත් ප්‍රකාශන මිලදී ගැනීම සඳහා රු 270,708/= ක මුදලක් වැය කරන ලදී.

## CAASL වෙබ් අඩවිය

CAASL වෙබ් අඩවිය (www.caa.lk) වැඩි දියුණු කර අන්තර්ගත කළමණාකරන පද්ධතියක් හඳුන්වා දෙමින් සහ නව පෙනුමක් ලබා දෙමින් යාවත්කාල කරන ලදී. නව අවශ්‍යතාවන්ට අනුව තොරතුරු ප්‍රතිසංවිධානය කර නව තොරතුරු ඇතුළත් කර යාවත්කාල තත්වයෙන් පවත්වාගෙන යන ලදී. වෙබ් අඩවිය යාවත්කාල කිරීම අඛණ්ඩව සිදු කෙරිණි.

## CAASL ස්වයංකරණය

CAASL හි තොරතුරු තාක්ෂණ දියුණුව ගැන සලකන විට සමාලෝචනයට භාජනය වන වර්ෂය කැපී පෙනෙන වර්ෂයක් වීය. බලපත්‍රය ලත් මෘදුකාංගය යොදමින් මේල් සර්වරය උසස් තත්වයකට ගෙන ඒමට කටයුතු කළේය. මේ අනුව CAASL මයික්‍රොසොෆ්ට් 2010 බලපත්‍ර ලත් අනුවාදය සමග කටයුතු කරන පුරෝගාමී රාජ්‍ය ආයතනය බවට පත් වීය. තාක්ෂණික නිර්දේශ සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහය ලබා ගත් අතර බලපත්‍ර 130 ක් මිලදී ගන්නා ලදී. ඊමේල් සර්වරය ස්ථාපනය කිරීම නිසා CAA හි සංදේශන කාර්යයහි විශාල දියුණුවක් ඇති වීය. සංවිධානය තුළ E-Mail මගින් වැඩ කිරීමේ පරිසරයක් ඇති කරනු ලැබීය.

මේල් සර්වර් පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා බ්ලේඩ් සර්වර්, බ්ලේඩ් සර්වර් චැසි, ඔන්ලයින් UPS, එක්ස්ටර්නල් හාඩ් ඩිස්ක්, සර්වර් රැක් සහ ටේප් ඩ්‍රයිව් යන කොටස් මිලදී ගන්නා ලදී. CAASL හි පුද්ගලයින් සම්බන්ධ කර ගැනීම තව දුරටත් පහසු කරවමින් ලින්ක් (Lync) පහසුකම්ද හඳුන්වා දෙන ලදී. මෙම කාර්යයන් සඳහා රුපියල් මිලියන 13 පමණ සම්පූර්ණ වියදමක් දරා ඇත.

CAA, 3 වන මහලටත් ගොඩනැගිල්ලේ ප්‍රවේශ ශාලාවටත් කටුනායක හා රත්මලාන උපකාර්යයාල වලටත් wi-fi පහසුකමක් සවි කරන ලදී. රත්මලාන උප කාර්යයාලයට වෙනම ADSL සම්බන්ධතාවක්ද සපයන ලදී. 2011 වර්ෂය තුළ සියලුම විධායක නිලධාරීන්ට ලැප් ටොප් සපයා දෙමින් කාර්යය මණ්ඩලයට ලබා දෙන පහසුකම් ප්‍රමාණය තව දුරටත් වැඩි කළේය. 2011 වර්ෂය තුළ තොරතුරු තාක්ෂණයට අදාළ මිලදී ගැනීම් සඳහා රු 7,645,820/= ක මුදලක් වැය වී තිබිණි.

## CAASL නව ස්ථානයකට ගෙන යාම

හේතු කීපයක් නිසා එහි මූලස්ථානය කොළඹ 3, සුප්‍රීම් ගොඩනැගිල්ලෙන් ඉවත් කර වෙනත් ස්ථානයකට ගෙන යාමට CAASL ට අවශ්‍ය වී තිබිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2011 වර්ෂය තුළ CAASL මූලස්ථානය වෙනත් ස්ථානයකට ගෙන යන ලදී. දැන් විවෘත ඉඩ කඩ සහිත වැඩ පරිසරය නිසා සංවිධානය තුළ පුද්ගල සම්බන්ධතාවය දියුණු වී ඇති අතර පියකරු වාතාවරණය නිසා CAASL ට වෘත්තිමය පෙනුමක්ද ලැබී තිබේ. මූලික වශයෙන් මෙම ගොඩනැගිල්ල අවුරුදු තුනකට (03) කට බද්දට ගෙන ඇති අතර ඊට බදු කුලී වශයෙන් වාර්ෂිකව රු. මිලියන 34 තරම් මුදලක් වැය කිරීමට සිදුව ඇත. කාමර වෙන් කිරීම, තිරරෙදි දැමීම, බුමුතුරුණු ඇතිරීම සහ වෙනත් අභ්‍යන්තර අලංකරණ කටයුතු සඳහා රුපියල් මිලියන 28 කට ආසන්න මුදලක් වැය වී ඇත.

### පිවිසුම් පාලන පද්ධති

CAASL නව ස්ථානයකට ගෙන යාමත් සමග එහි CCTV කැමරා සහිත පිවිසුම් පාලන පද්ධතියක් හඳුන්වා දෙමින් කාර්යයාල ගොඩනැගිල්ල තුළට අනවශ්‍ය පුද්ගලයින් ඇතුල් වීම සීමා කිරීමට හැකි විය. දැන් එම කැමරා තුළින් පුද්ගලයින්ගේ චලන බලාගත හැකි අතර ඔවුන්ගේ චලන පාලනය කිරීමටත් අනවසර ඇතුල්වීම් නිරීක්ෂණය කිරීමටත් හැකි වී තිබේ. CAASL තුළට පැමිණෙන සියලුම අමුත්තන්ට ඒ සඳහා අවසර පත්‍ර ලබා දෙන අතර වැඩි දියුණු කළ පාලන පද්ධතිය නිසා ඔවුන්ට අවහිරයක් ඇති නොවේ. මෙම පාලන පද්ධතිය සඳහා වැය වී ඇති මුදල රුපියල් 4,430,231/= කි.

### CAASL සේවකයින් ලබා ලත් නිවාඩු

සේවයට වාර්ථා කරන විට මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් සේවකයින්ට ලබා දී ඇති සහන කාලය හැර ඔවුන් ලබා ගන්නා කෙටි නිවාඩු සහ ප්‍රමාද වී පැමිණීම් පිළිබඳ වාර්තා වර්ෂය පුරාම සමීපයෙන් නිරීක්ෂණය කරන ලදී. ලබා නොගත් නිවාඩු වෙනුවෙන් මුදල් ලබා ගැනීමේ පහසුකම වැනි පෙළඹවීම් හේතුවෙන් සේවයට පැමිණීමට සේවකයින්ගේ ඇති උනන්දුව වැඩි වී තිබේ. (06 පරිශිෂ්ඨය)

## මූල්‍ය කළමනාකරණ අංශය

### වැඩසටහන් අයවැය

සිවිල් ගුවන් සේවා අධිකාරිය, එළඹෙන වර්ෂයේ වියදම පෙන්නුම් කරන 2012 වැඩසටහන් අයවැය මෙහෙයවීම සහ කළමණාකරණය, ගගන නාවික සේවා, පියසර නිරූපද්‍රිතතාවය සහ එකාබද්ධ වශයෙන් හැඳින්වෙන ප්‍රධාන වැඩසටහන් හතරක් යටතේ පිළියෙළ කළේය.

ප්‍රක්ෂේපිත ආදායම රු. මිලියන 558 ක් වන අතර ඇස්තමේන්තු කරන ලද වියදම රු. මිලියන 1,077.9 කි. පෙර වසර සමග සසඳන කල ඇස්තමේන්තු කළ වියදමෙහි 9.6%කුත් ප්‍රක්ෂේපිත ආදායමෙහි 11.7%ක වැඩිවීමකුත් පෙන්නුම් කෙරේ.

### CAA ආදායම

පෙර වසර සමග සසඳන කල CAA ආදායම 28% ක වැඩි වීමක් සිදු වී ඇත. මෙම සැලකිය යුතු වැඩිවීම සිදු වී ඇත්තේ විදේශ විකුණුම් අයභාරය නැව් නැගීමේ ගාස්තු රැස් කිරීමේ සේවා ගාස්තු හා වෙනත් නියාමන සේවා සඳහා අය කරනු ලබන ගාස්තු වලින් ලැබෙන ආදායමේ වැඩි වීම නිසාය. (05 පරිශිෂ්ඨය)

පරිපාලන ශාඛාව

# 2011 - කාර්යය සාධක දර්ශක

## 2011 අධිකාරියෙහි කාර්යය සාධනය

| | 2010 | 2011 |
|---|---|---|
| **නිරුපද්‍රිතතා හා සුරක්ෂිතතා අධීක්ෂණ හා රාජකාරි සහ කාර්යයන්** | | |
| (රෙගුලාසි / නිවේදන / රීති සංඛ්‍යාව) | | |
| ගුවන් යානා මෙහෙයුම් | 14 | - |
| ගුවන් යෝග්‍යතා | 04 | - |
| ගුවන් ප්‍රවාහන | 00 | - |
| **සංවිධාන/ පුද්ගලයින් සඳහා මුල්වර නිකුත් කළ බලපත්‍ර/සහතික** | | |
| ගුවන් ප්‍රවාහන සමාගම් | 03 | 01 |
| නඩත්තු සංවිධාන | 05 | 03 |
| පියසර පුහුණු පාසල් | 03 | 01 |
| **නඩත්තු සහ ඉංජිනේරු පාසැල්** | - | - |
| ගුවන් නියමු | 199 | 273 |
| ගුවන් ගමන් පාලක | 12 | 09 |
| ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවරුන් | 53 | 04 |
| ගුවන් යානා නඩත්තු බලපත්‍ර | - | 56 |
| පියසර පිටත් කරන්නන් | 02 | 01 |
| පියසර උපදේශක | 02 | 10 |
| සහකාර පියසර උපදේශක | 00 | 11 |
| භූමි උපදේශක | 05 | 25 |
| ASO බලපත්‍ර | 04 | 00 |
| මැදිරි සේවක සාමාජික | 91 | 252 |
| **සහතික කළ සංවිධාන /පුද්ගලයින් පිළිබඳ සෝදිසි** | | |
| රෑම්ප් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා | 30 | 65 |
| රෑම්ප් පරීක්ෂණ - මෙහෙයුම් | 26 | 105 |
| රෑම්ප් පරීක්ෂණ - ඒකාබද්ධ | - | - |
| ගගන යාත්‍රාංගන පරීක්ෂණ | 09 | 20 |
| ගුවන් සංතරණ සේවා සපයන්නන් පිළිබඳ පරීක්ෂණ | 30 | 36 |
| නඩත්තු සංවිධාන පරීක්ෂණ | 05 | 10 |
| පියසර පාසල් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා | 14 | - |
| පියසර පාසල් පරීක්ෂණ - පුද්ගල බලපත්‍ර | 14 | 13 |
| ගුවන් සේවා සුරක්ෂිතතා පරීක්ෂණ | 12 | - |
| සිමියුලේටර් පරීක්ෂණ | 02 | 02 |
| අතරමග පරීක්ෂණ - මෙහෙයුම් | 08 | 12 |
| අන්තරායකාරී ද්‍රව්‍ය පරීක්ෂණ | 08 | 35 |
| ස්ථාන පහසුකම් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතා | 05 | 10 |
| ස්ථාන පහසුකම් පරීක්ෂණ - මෙහෙයුම් | 05 | 04 |
| සම්පූර්ණ කරන ලද විගණන | | |
| ගුවන් යෝග්‍යතා | 01 | - |
| මෙහෙයුම් | 01 | - |
| ඒකාබද්ධ (ගුවන් යෝග්‍යතා - මෙහෙයුම්) | - | - |
| ගුවන් සංතරණ සේවා | 01 | - |
| ගගන යාත්‍රාංගන සහතික කිරීම් | - | - |

## 2011 අංශ විශේෂිත කාර්යයන්

| | 2010 | 2011 |
|---|---|---|
| **මෙහෙයවීම හා කළමණාකරණය** | | |
| පවත්වන ලද අධිකාරියේ රැස්වීම් | 07 | 09 |
| පවත්වන ලද විගණන කමිටු රැස්වීම් | 04 | 04 |
| පවත්වන ලද කාර්යය මණ්ඩල කමිටු රැස්වීම් | 02 | 09 |
| පවත්වන ලද DPIG රැස්වීම් | 04 | 5 |
| පවත්වන ලද කර්මාන්ත උපදේශන රැස්වීම් | 327 | 169 |
| බාහිර සංවිධාන / පුද්ගලයන් හමුවීම් | 223 | 248 |
| ලැබුනු ලිපි සංඛ්‍යාව | 4940 | 6216 |
| **ගුවන් සේවා සුරක්ෂිතතා අංශය (AVSEC)** | | |
| ඡායා රූප චිත්‍රපට සඳහා අනුමැතිය | 17 | - |
| ගුවනේ සිට මල් හා පත්‍රිකා විසිරවීමට අනුමැතිය | 05 | - |
| ගුවන් තොටුපළ පිවිසුම් අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ | 10 | 11 |
| ගුවන් යානා තුළ/නැව් බඩු ගබඩා තුළ අවි ආයුද රැගෙන යාමට අනුමැතිය | 72 | 77 |
| පියසර තට්ටුවේ ගමන් කිරීමට බලය පැවරීම | 18 | 15 |
| ජාතික ගුවන් සේවා සුරක්ෂිතතා වැඩසටහනට සංශෝධන/වෙනස් කිරීම් | - | - |
| පවත්වන ලද ජාතික ගුවන් සේවා සුරක්ෂිතතා රැස්වීම් | - | - |
| නිකුත් කරන ලද මාර්ගෝපදේශක ලේඛන | - | - |
| සංශෝධනය කරන ලද මාර්ගෝපදේශක ලේඛන | - | - |
| අනුමත කරන ලද නව මෙහෙයුම් අත්පොත | - | 04 |
| පවත්නා මෙහෙයුම් අත්පොත් - සංශෝධන | 02 | 04 |
| නිකුත් කරන ලද ගුවන් සේවා සුරක්ෂිතතා දැන්වීම් (නව) | - | - |
| පවත්නා ගුවන් සේවා සුරක්ෂිතතා දැන්වීම් / සංශෝධන | - | - |
| ඉටු කරන ලද සුරක්ෂිතතා සෝදිසි කාර්යයන් | 22 | 25 |
| කර්මාන්ත සඳහා පවත්වන ලද සුරක්ෂිතතා පුහුණු පාඨමාලා | 01 | - |
| සහතික කරන ලද සුරක්ෂිතතා සෝදිසි කරන්නන් | 152 | 229 |
| සහභාගී වූ සුරක්ෂිතතා පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 03 | 03 |
| **විශේෂ ව්‍යාපෘති අංශය** | | |
| COSCAP-SA කාර්යය මණ්ඩලයට ලබා දුන් ගුවන් ගමන් පහසුකම් | 50 | 46 |
| ආරම්භ කරන ලද විශේෂ ව්‍යාපෘති | 03 | 03 |
| **ගුවන් සංතරණ සේවා අංශය (ANS)** | | |
| උස් ගොඩනැගිලි තැනීම සඳහා අනුමැතිය | 754 | 648 |
| NOTAM නිකුත් කිරීම අනුමැතිය | 114 | 206 |
| ගගන නාවික තොරතුරු චක්‍රලේඛ නිකුත් කිරීම | | 12 |
| නිකුත් කරන ලද AIP අතිරේක | | 08 |
| නිකුත් කරන ලද AIP සංශෝධන | | 02 |
| ඉහළින් පියාසර කිරීමට අනුමැතිය | 977 | 940 |
| අනියම් පියසර සඳහා ගොඩබෑසීමේ අවසර | 622 | 630 |
| නිකුත් කරන ලද නව ගුවන් සේවා නිරූපද්‍රිතතා නිවේදන | 10 | 0 |
| සංශෝධනය කරන ලද ගුවන් සේවා නිරූපද්‍රිතතා නිවේදන | 07 | 0 |
| සහභාගී වූ පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ | 23 | 19 |
| නිකුත් කරන ලද නව මාර්ගෝපදේශක ලේඛන | 05 | 0 |
| සංශෝධනය කරන ලද මාර්ගෝපදේශක ලේඛන | 01 | 01 |

| | | |
|---|---|---|
| නිකුත් කරන ලද භූමි ගගන යාත්‍රාංගන සහතික | 01 | 0 |
| අළුත් කරන ලද ජලාශ ගගන යාත්‍රාංගන සහතික | - | 0 |
| සහතික කරන ලද ජලාශ ATS සැපයුම්කරුවන් | - | 0 |
| ජලාශ ගගන යාත්‍රාංගන අනුමත කිරීම් | - | 15 |
| අළුත් කරන ලද ජලාශ ගගන යාත්‍රාංගන සහතිකය | - | 0 |
| ගගන යාත්‍රාංගන සෝදිසි කාර්යයන් | 09 | 20 |
| ATS සෝදිසි කාර්යයන් | 30 | 36 |
| ලැබුනු ගුවන් සේවා සිදුවීම් | 55 | 114 |
| විමර්ශනය කළ ගුවන් සේවා සිදුවීම් | 02 | 01 |
| පවත්වන ලද ATC ප්‍රමාණන විභාග | - | 06 |
| ATC සිමියුලේටර් පරීක්ෂණ | - | 17 |
| භාෂා ප්‍රවීණතා විභාග | - | 19 |
| දේශන (COSCAP - SA) සහාය | - | 05 |
| **පුද්ගල බලපත්‍ර අංශය (PL)** | - | |
| ආධුනික ගුවන් නියමු බලපත්‍ර | 142 | 115 |
| පෞද්ගලික ගුවන් නියමු බලපත්‍ර | 76 | 98 |
| වාණිජ ගුවන් නියමු බලපත්‍ර | 300 | 317 |
| ගුවන් ප්‍රවාහන ගුවන් නියමු බලපත්‍ර | 359 | 382 |
| ගුවන් ගමන් පාලක බලපත්‍ර | 91 | 81 |
| ගුවන් යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර | 283 | 173 |
| ගුවන් යානා නඩත්තු බලපත්‍ර | 164 | 221 |
| මැදිරි සේවක පිරිස් සහතික | 91 | 252 |
| පියසර මෙහෙයුම් නිලධාරී බලපත්‍ර | 02 | 01 |
| විදේශ බලපත්‍ර වලංගු කිරීම (ගුවන් නියමු) | 79 | 97 |
| නිදහස් බැලූන් නියමු බලපත්‍ර | - | 01 |
| පියසර ඉංජිනේරු බලපත්‍ර | - | 01 |
| පියසර නාවික බලපත්‍ර | - | 01 |
| වලංගු කිරීමේ (AME) | 24 | 19 |
| ගුවන් යානා වර්ග ප්‍රමාණන | 87 | 146 |
| පියසර උපදේශක ප්‍රමාණන | 02 | 21 |
| පියසර පාසල් බලපත්‍ර (අළුත් කිරීම) | 01 | 04 |
| භූමි උපදේශ බලපත්‍ර | 02 | 06 |
| භූමි උපදේශක අනුමැතිය | 05 | 24 |
| ගුවන් ගමන් පාලක-ප්‍රමාණන | 12 | 103 |
| පියසර පාසල් බලපත්‍ර | 03 | 01 |
| AME ප්‍රවර්ගය | 10 | 07 |
| ASO බලපත්‍ර | 04 | 00 |
| විදේශ ගුවන් නියමුවන් බඳවා ගැනීමේ අනුමැතිය | 47 | 56 |
| වීසා නිර්දේශ නිකුත් කිරීම | 174 | 92 |
| පුද්ගලික බලපත්‍ර නිකුත් කිරීම | 55 | 125 |
| NIB පැහැයුම් නිකුත් කිරීම | 172 | 373 |
| වෛද්‍ය පරීක්ෂණ | 926 | 1350 |
| විභාග | - | - |
| 1. PPL විභාග | 06 | 120 |
| 2. විශේෂ ගුවන් නීතියේ විභාග | 66 | 10 |
| 3. AME විභාග | 02 | 02 |

| | | |
|---|---|---|
| 4. AML විභාග | 02 | 03 |
| 5. FOO විභාග | 00 | 00 |
| 6. CPL /IR(A) විභාග | 08 | 15 |
| 7. CPL(H) විභාග | 00 | 01 |
| 8. ATPL විභාග | 04 | 13 |
| 9. ATPL(H) විභාග | 00 | 20 |
| 10. ATPL(H) විභාග | 04 | 00 |
| 11. ATPL විභාග (CAAUK) | 55 | 57 |
| 12. ඉංග්‍රිසි භාෂා ප්‍රවීණතා පරීක්ෂණ | 102 | 124 |
| 13. කල් ඉකුත් වූ බලපත්‍ර ප්‍රතිසක්‍රියන විභාග (CPL/IR) | 00 | 02 |
| 14. ගුවන් විදුලි සංදේශන ප්‍රායෝගික පරීක්ෂණ | 26 | 31 |
| 15. සහකාර පියසර උපදේශන විභාග | 00 | 04 |
| 16. පියසර විභාග පරීක්ෂක විභාග | 00 | 03 |
| 17. PPL විභාග පරීක්ෂණ සඳහා | 00 | 03 |
| 18. AML පරිවර්තන විභාග | 02 | 02 |
| | | |
| **මෙහෙයුම් අංශය (OPS)** | | |
| නිකුත් කරන ලද නව ගුවන් සේවා නිරුපද්‍රිතතා නිවේදන | 03 | - |
| ගුවන් සේවා නිරුපද්‍රිතතා නිවේදන - සංශෝධන | 14 | - |
| සහභාගී වූ පුහුණු පාඨමාලා /සම්මන්ත්‍රණ | 07 | 07 |
| නිකුත් කරන ලද නව මාර්ගෝපදේශන ලේඛන | 06 | - |
| මාර්ගෝපදේශන ලේඛන සංශෝධන | 05 | - |
| විශේෂ මෙහෙයුම් | 13 | 10 |
| මැදිරි සේවක පිරිස් බලය පැවරීම් | 105 | 252 |
| විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් සහතික - නිකුත් කිරීම | 09 | 05 |
| විදේශ ගුවන් ප්‍රවාහන සමාගම් බලපත්‍ර - අලුත් කිරීම | 26 | 27 |
| අන්තරායකාරී ද්‍රව්‍ය ප්‍රවාහන බලපත්‍ර (මුල්වර) | - | 01 |
| අන්තරායකාරී ද්‍රව්‍ය ප්‍රවාහන බලපත්‍ර (අළුත් කිරීම්) | 13 | 10 |
| නම්කරන ලද පරීක්ෂක කමිටු නියමු (මුල්වර) | 07 | 05 |
| නම්කරන ලද පරීක්ෂක කමිටු නියමු (අළුත් කිරීම්) | 10 | 22 |
| ගුවන් යානා මෙහෙයුම්කරු සහතික (මුල්වර) | 01 | 01 |
| ගුවන් යානා මෙහෙයුම්කරු සහතික (අළුත් කිරීම්) | 05 | 07 |
| සිමියුලේටර් ස්ථාන පහසුකම් සඳහා අනුමැතිය | 13 | 01 |
| සිමියුලේටර් අළුත් කිරීම් | 13 | 10 |
| පරීක්ෂණ සඳහා බලය පැවරීම් | 113 | 244 |
| ක්‍රියාත්මක කරන ලද සෝදිසි කාර්යයන් | 81 | 181 |
| නිරුපද්‍රිතතා සිදුවීම් සමඵයකට පත් කිරීම් | 06 | - |
| | | |
| **ගුවන් යෝග්‍යතා අංශය (AW)** | | |
| නිකුත් කරන ලද නව ගුවන් සේවා නිරුපද්‍රිතතා නිවේදන | 02 | 01 |
| සංශෝධනය කරන ලද ගුවන් සේවා නිරුපද්‍රිතතා නිවේදන | 04 | - |
| සහභාගී වූ පුහුණු පාඨමාලා / සම්මන්ත්‍රණ | 02 | 05 |
| නිකුත් කරන ලද මාර්ගෝපදේශක ලේඛන | 01 | - |
| සංශෝධනය කරන ලද මාර්ගෝපදේශක ලේඛන | 01 | - |
| ඉටු කරන ලද සෝදිසි කාර්යයන් | 32 | 56 |
| ගුවන් යානා ගුවන් යෝග්‍යතා සහතික (මුල්වර) | 07 | 18 |
| ගුවන් යානා ගුවන් යෝග්‍යතා සහතික (අළුත් කිරීම්) | 26 | 27 |
| ගුවන් යානා නඩත්තු සංවිධාන වැඩපොළ අනුමැතිය | 36 | 09 |

| | | |
|---|---|---|
| ගුවන් යානා ලියාපදිංචි කිරීමේ සහතිකය (මුල්වර) | 07 | 14 |
| ගුවන් යානා ලියාපදිංචි කිරීමේ සහතිකය (අළුත් කිරීම්) | 26 | 24 |
| පහසුකම් පරීක්ෂා කිරීමෙන් පසු නඩත්තු සංවිධාන අනුමත කිරීම් | 29 | 57 |
| ගුවන් සේවා සිදුවීම් සමථයකට පත් කිරීම් | 43 | 38 |
| **ගුවන් ප්‍රවාහන සහ නීති කටයුතු අංශය (ATLA)** | | |
| නව නීති කෙටුම්පත් | 01 | 00 |
| නව රෙගුලාසි කෙටුම්පත් | 01 | 02 |
| සහභාගී වූ පුහුණු පාඨමාලා / සම්මන්ත්‍රණ | 01 | 02 |
| නිකුත් කරන ලද නව මාර්ගෝපදේශක ලේඛන | 00 | 01 |
| සංශෝධනය කරන ලද මාර්ගෝපදේශක ලේඛන | 01 | 01 |
| දේශීය පියසර උප ලේඛන අනුමත කිරීම් | 07 | 00 |
| ගුවන් ප්‍රවාහන සැපයුම් කරුවන් පිළිබඳ සෝදිසි කාර්යයන් | 02 | 04 |
| ජාත්‍යන්තර පියසර උපලේඛන අනුමත කිරීම් | 38 | 32 |
| තාක්ෂණික නොවන විශේෂඥ කාර්යය මණ්ඩලය සඳහා වීසා නිර්දේශ | 18 | 11 |
| ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් ප්‍රවාහන සමාගම් සඳහා කුලී ප්‍රවාහන බලපත්‍ර | 05 | 06 |
| ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් ප්‍රවාහන සමාගම් සදහා කුලී ප්‍රවාහන සමාගම් බලපත්‍ර | 03 | 03 |
| කුලී බලපත්‍ර - ජාත්‍යන්තර මෙහෙයුම් | 03 | 03 |
| කුලී බලපත්‍ර -දේශීය නිත්‍ය මෙහෙයුම් | 03 | 05 |
| ගුවන් ප්‍රවාහන සැපයුම්කරු බලපත්‍ර | 373 | 405 |
| පෞද්ගලික මෙහෙයුම් බලපත්‍ර | 01 | 02 |
| අත්සන් කරන ලද නව ගුවන් සේවා ගිවිසුම් | 01 | 01 |
| අළුත් කරන ලද ගුවන් සේවා ගිවිසුම් | 02 | 14 |
| වර්ෂය අවසන් වන විට "විවෘත ගුවන් තල" ගුවන් සේවා ගිවිසුම් | 06 | 06 |
| **මානව සම්පත් හා කාර්යයාල කළමනාකරණ අංශය (HROM)** | | |
| නිකුත් කරන ලද නව රීති - HROM | 02 | 05 |
| සංශෝධනය කරන ලද රීති | 02 | 03 |
| කාර්යය මණ්ඩල බඳවා ගැනීම් | 14 | 36 |
| විදේශ පුහුණු අවස්ථා - මුළු ගණන | 74 | 90 |
| දේශීය පුහුණු අවස්ථා -මුළු ගණන | 35 | 135 |
| කාර්යය මණ්ඩලය - මුළු ගණන | 124 | 148 |
| පොදු කාර්යය මණ්ඩල රැස්වීම් | - | 01 |
| පවත්වන ලද කාර්යය සාධක ඇගයීම් | 68 | 68 |
| කාර්යය මණ්ඩල විශ්‍රාම ගැනීම් | 01 | 03 |
| ලබා දුන් කාර්යය මණ්ඩල ණය | රු. මි. 12.5 | රු. මි. 23.9 |
| පවත්වන ලද විධායක කාර්යය මණ්ඩල රැස්වීම් | 07 | 08 |
| පවත්වන ලද දේශීය වැඩමුළු | 00 | 03 |
| තාක්ෂණික පුස්තකාලයට එක් කළ නව ලේඛන | 103 | 117 |
| වෙබ් අඩවි සංශෝධන | 211 | 12 |
| මෘදුකාංග නවීකරණ | 98 | 460 |
| **මූල්‍ය කළමණාකරණ අංශය (FM)** | | |
| රැස් කළ මුළු ආදායම | රු. මි. 582 | රු. මි. 744 |
| මුළු වියදම | රු. මි. 197 | රු. මි. 315 |
| කාර්යය මණ්ඩල වැටුප් | රු. මි. 43 | රු. මි.125 |
| මිලදී ගත් වාහන | 02 | 05 |
| මිල දී ගත් පරිගණක | 47 | 74 |

| | | |
|---|---|---|
| **අභ්‍යන්තර විගණන අංශය (AI)** | | |
| පවත්වන ලද විගණන | 12 | 15 |
| ඉදිරිපත් කළ සොයා ගැනීම් | 39 | 95 |
| | | |
| **ගුවන් යානා අනතුරු හා සිදුවීම් විමර්ශන අංශය (AAII)** | | |
| වාර්තා වූ සිදුවීම් | 01 | 01 |
| වාර්තා වූ අනතුරු | 00 | 00 |
| වාර්තා වූ සිද්ධි | 00 | 114 |
| ගුවන් සේවා මරණ | 00 | 00 |
| මගීන්ට හෝ සේවක පිරිසට සිදු වූ තුවාල | 00 | 00 |
| නව රෙගුලාසි කෙටුම්පත් | 00 | 01 |
| සහභාගී වූ පුහුණු පාඨමාලා /සම්මන්ත්‍රණ | 00 | 01 |
| නිකුත් කළ නව මාර්ගෝපදේශක ලේඛන | 00 | 01 |
| සංශෝධනය කළ මාර්ගෝපදේශක ලේඛන | 00 | 01 |

# කර්මාන්තයෙහි කාර්යය සාධනය - 2011

| | 2010 | 2011 |
|---|---|---|
| ගුවන් ගමන් තොරතුරු<br>ජාත්‍යන්තර ගුවන් ගමන් | | |
| මගීන් | 5,931,559 | 6,885,082 |
| පිටත් වූ | 2,657,532 | 3,095,089 |
| ගොඩ බසින ලද | 2,609,237 | 3,079,126 |
| සංක්‍රමණ | 664,790 | 710,867 |
| නැව් බඩු (මෙට්‍රික් ටොන්) | 160,838 | 158,572 |
| ගෙන ආ | 59,631 | 63,161 |
| ගෙන ගිය | 101,207 | 95,411 |
| ගුවන් යානා චලන | 33,907 | 43,673 |
| නිත්‍ය පියසර | 32,590 | 41,891 |
| කුලී පියසර | 1,317 | 1,782 |
| මෙහෙයුම් සිදු කළ ගුවන් ප්‍රවාහන සමාගම් | 32 | 36 |
| නිත්‍ය සේවා | 23 | 28 |
| කුලී සේවා | 04 | 04 |
| නැව් බඩු ප්‍රවාහන | 05 | 04 |
| දේශීය ගුවන් ගමන් | | |
| මගීන් (ගෙනගිය) | 3,976 | 2,047 |
| නැව් බඩු මෙට්‍රික් ටොන් | 0 | 0 |
| ගුවන් යානා චලන | 500 | 392 |
| නිත්‍ය පියසර | - | - |
| කුලී පියසර | - | - |
| මෙහෙයුම් සිදු කළ ගුවන් ප්‍රවාහන සමාගම් සංඛ්‍යාව | | |
| නිත්‍ය සේවා | 1 | - |
| කුලී සේවා | 2 | 2 |
| මෙහෙයුම් සිදු කළ ගුවන් ප්‍රවාහන සමාගම් | | |
| බලපත්‍ර ලත් ගුවන් ප්‍රවාහන සමාගම් | 07 | 08 |
| බලපත්‍ර ලත් පියසර පාසල් | 05 | 06 |
| අනුමත නඩත්තු සංවිධාන | 05 | 08 |
| රා.22,000 ට වැඩි බර ගුවන් යානා | 20 | 25 |
| රා.22,000 ට අඩු බර ගුවන් යානා | 10 | 17 |
| බැලූන් | 05 | 10 |
| වෙනත් | - | - |
| ගුවන් යානා අනතුරු සංඛ්‍යාව | - | - |
| ගුවන් යානා සිදුවීම් සංඛ්‍යාව | 46 | 01 |

# 2011 මූල්‍ය ප්‍රකාශ

## මූල්‍ය වාර්තාකරණය පිළිබඳව, අධිකාරියේ සාමාජිකයින්ගේ වගකීම

2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14 වන සහ 15 වන වගන්ති ප්‍රකාර සිවිල් ගුවන් සේවා අධිකාරියේ සාමාජිකයින් පහත සඳහන් කරුණු සම්බන්ධව වගකීමට බැඳී ඇත.

I. අධිකාරියේ ආදායම හා වියදම, වත්කම් හා වගකීම් සහ අනෙකුත් සියළුම මූල්‍ය ගණුදෙනු නිසි පරිදි ගිණුම් ගත කිරීම.

II. අධිකාරියේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මූල්‍ය තත්වය පිළිබඳ සත්‍ය හා පැහැදිලි දසුනක් ඉදිරිපත් කිරීම සඳහා, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සම්මත කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම.

III. අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීමටත් වංචා සහ වෙනත් අක්‍රමිකතා අනාවරණය කිරීම සහ වැළැක්වීම සඳහා උචිත අභ්‍යන්තර පාලන ක්‍රම පිහිටුවීමටත් නිසි පියවර ගැනීම.



**ජෙනරල් රෝහාන් ද සිල්වා දළුවත්ත**
සභාපති
2012 පෙබරවාරි 24



**එච්.එම්.සී. නිමල්සිරි**
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී

# ශේෂ පත්‍රය

*2011 දෙසැම්බර් 31 දිනට*

| | සටහන | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මුළු වත්කම්** | | 1,086,262,271.36 | 1,068,151,620.35 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපොළ පිරියත හා උපකරණ | | 110,099,478.51 | 50,449,662.26 |
| **ආයෝජන** | | | |
| භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජනය | | 351,203,735.08 | 466,296,789.40 |
| **ජංගම වත්කම්** | 10 | 624,959,057.77 | 1,017,701,958.09 |
| පාරිභෝගික තොග | | 1,586,231.16 | 1,193,297.32 |
| සේවක සුභ සාධන හා සමාජ රක්ෂණ අරමුදල | | 361,021.00 | 361,021.00 |
| අනතුරු විමර්ශන අරමුදල | | 50,000,000.00 | 50,000,000.00 |
| පාරිතෝෂික අරමුදල | | 7,928,221.10 | 6,334,650.53 |
| ණය ගැතියෝ | 10.1 | 53,197,554.60 | 31,976,133.86 |
| ලැබිය යුතු දෑ | 10.2 | 168,441,522.22 | 124,573,937.57 |
| පෙර ගෙවුම් | 10.3 | 41,546,415.51 | 5,021,442.57 |
| භාණ්ඩාගාර ජංගම ගිණුම් | | 246,014,436.24 | 261,992,863.30 |
| මුදල් හා මුදල් සමාන දෑ | 10.4 | 55,883,655.94 | 69,951,822.54 |
| **ස්කන්ධය සහ වගකීම්- ප්‍රාග්ධනය සහ සංචිත** | | 1,086,262,271.36 | 1,068,151,620.35 |
| **ස්කන්ධය** | | 525,268,118.82 | 657,578,794.17 |
| රජයේ ප්‍රධාන | 11 | 9,168,434.05 | 9,774,488.05 |
| ප්‍රත්‍යාගණන අතිරික්ත | 12 | 13,485,465.44 | 13,652,001.91 |
| ලාභ/අලාභ ගිණුම | | 502,614,219.33 | 634,152,304.21 |
| **වගකීම්** | | 560,994,152.53 | 410,572,826.18 |
| **ජංගම නොවන වත්කම්** | 13 | 18,653,741.00 | 12,917,735.00 |
| තැම්පතු - බැංකු ඇපකර | | 8,490,000.00 | 4,211,064.00 |
| රක්ෂණ අරමුදල් | | 562,850.00 | 496,700.00 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 9,239,870.00 | 7,848,950.00 |
| සේවක සුභ සාධන හා සමාජ රක්ෂණ අරමුදල (විශ්‍රාම අරමුදල) | | 361,021.00 | 361,021.00 |
| **ජංගම වගකීම්** | 14 | 542,340,411.53 | 397,655,091.18 |
| උපචිත වියදම් | 14.1 | 37,472,007.48 | 78,834,795.91 |
| අනතුරු විමර්ශන අරමුදල් | | 250,000,000.00 | 50,000,000.00 |
| ණය හිමියෝ | 14.2 | 8,853,968.31 | 6,827,431.97 |
| භාණ්ඩාගාර ජංගම ගිණුම් | 14.3 | 246,014,435.74 | 261,992,863.30 |

පිටු අංක 65 සිට 81 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍ය අංගයන් වේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙනුවෙන් අත්සන් තබන ලදී.

**ජෙනරල් රෝහාන් ද සිල්වා දළුවත්ත**
සභාපති
2012 පෙබරවාරි 24

**එච්.එම්.සී නිමල්සිරි**
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී

# ආදායම් ප්‍රකාශය

අනතුරු විමර්ශන අරමුදල - ගුවන් යානා අනතුරු විමර්ශනය හා සෙවීම සහ මුදා ගැනීම පිළිබඳ රජය සතු වගකීම පවරා ඇත්තේ සිවිල් ගුවන් සේවා අධිකාරියටය. මෙම වගකීම ඉටුකිරීමේදී දැරීමට සිදුවිය හැකි වියදම් පියවීම සඳහා රුපියල් මිලියන 20 ක් 2006 වර්ෂයේ ගිණුම් යටතේ ප්‍රතිපාදනය කර තිබුණි. සේවාවන්හි මිල ඉහළ යාම ආවරණය කිරීම සඳහා 2009 වර්ෂයේදී තවත් රුපියල් මිලියන 10 වෙන් කරන ලදි.

2010 දී මෙම අරමුදල රුපියල් මිලියන විස්සකින් (මිලි 20) තව දුරටත් වැඩි කරන ලදි. 2011 වර්ෂයේ CAA හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම අරමුදල රුපියල් මිලියන 250 දක්වා වැඩි කිරීමට තීරණය කර ඇත.

සේවක සුභ සාධක හා සමාජ ආරක්ෂණ අරමුදල - මෙම අරමුදල පිහිටුවා ඇත්තේ 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 20 (05) වගන්තිය අනුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වන ලද රාජ්‍ය සේවකයින් වෙනුවෙන් එකිනෙක විශ්‍රාමික නිලධාරියා නමින් මෙහි තැම්පත් කර ඇති මුදල් එම නිලධාරීන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවයෙන් විශ්‍රාම ලබන අවස්ථාවන්හිදී ඔවුනට ගෙවනු ඇත.

## 06. ආදායම් බදු

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කර ඇති ලාභය පදනම් කරගෙන වෙන් කරන ලදුව 2000 අංක 30 දරණ දේශීය අදායම් පනතේ සහ එහි සංශෝධනයන්හි විධිවිධානයන්ට අනුව ගැළපුම් කර ඇත.

## 07. මුදල් සහ මුදලට සමාන දෑ

මුදල් සහ මුදලට සමාන දෑ මුදල් පොතේ ශේෂය සහ ඇමතුම් තැම්පතු වශයෙන් අර්ථ දක්වා ඇත.

## 08. රජයේ ප්‍රදාන

රජයේ ප්‍රදානයන්හි අගයෙන් පිළිබිඹු වන්නේ සිවිල් ගුවන් සේවා අධිකාරිය පිහිටුවන ලද අවස්ථාවේ සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවෙන් මාරු කරන ලද වත්කම් වල සමුච්චිත ක්ෂය වීම් අඩු කළ පසු අගයයි.

| | | |
|---|---|---|
| 2011-01-01 දිනට රජයේ ප්‍රදාන | - | රු. 9,774,488.05 |
| අඩු කළා-2011 වසර සඳහා අඩු කිරීමේදී | - | රු. 606,054.00 |
| 2011-12-31 දිනට රජයේ ප්‍රදාන | - | රු. 9,168,434.05 |

## 09. භාණ්ඩාගාර ජංගම ගිණුම

භාණ්ඩාගාර ජංගම ගිණුමෙන් පිළිබිඹු වන්නේ 2003 අංක 25 දරණ මුදල් පණත අනුව නැව් නැගීමේ ගාස්තු වශයෙන් රැස් කරන ලද මුදල් ය.

| | | |
|---|---|---|
| සී/ස ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) | - | රු. 159,909,383.23 |
| සංචාරක ප්‍රවර්ධන අරමුදල | - | රු. 79,454,691.62 |
| ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය | - | රු. 6,150,360.89 |

## 10. ශේෂ පත්‍රයෙන් පසු සිදු වීම්

ගැළපීම් අවශ්‍ය වන හෝ, අවසන් ගිණුම් වල හෙළිදරව් කිරීම අවශ්‍ය වන හෝ කිසිදු තත්වයක් ශේෂ පත්‍ර දිනයෙන් පසුව උද්ගත වී නැත.

## 11. පෙර වසර ගැළපුම්

පෙර වසර (2010) ගණුදෙනු වලට අදාළව ආදායම් ප්‍රකාශයෙහි පහත සඳහන් ගැළපීම් සිදු කර ඇත.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| **කාර්යය මණ්ඩල වියදම්** | | |
| වැටුප් හා වේතන | 468,144.44 | 50,545.00 |
| ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් | 71,894.08 | |
| විශේෂ දීමනාව | 99,200.00 | |
| ප්‍රවාහන දීමනාව | 92,105.00 | 4,950.00 |
| උපයන විට ගෙවන බදු (PAYE) | | 316.37 |
| සේවක අර්ථසාධක අරමුදල් | 3000.00 | 21,177.65 |
| සේවක භාරකාර අරමුදල් | 600.00 | |
| ප්‍රසාද දීමනා | 15,491.80 | |
| සුභ සාධක | 4,711.55 | |
| **රැස්වීම්, සම්මන්ත්‍රණ වැඩමුළු (විදේශීය)** | 350,117.10 | |
| **සාමාන්‍ය මෙහෙයුම් වියදම්** | | |
| විදුලි සංදේශනය | 175,947.62 | |
| මුද්‍රණ කටයුතු | 19,000.00 | |
| විභාග ගාස්තු | 16,000.00 | |
| දායක මුදල් ප්‍රකාශන/පුවත්පත් | 6,480.00 | |
| CAATA වියදම් | 396,380.00 | 108,721.00 |
| **විවිධ හා වෙනත් වියදම්** | | |
| පිරියත යන්ත්‍ර සූත්‍ර නඩත්තුව | 48,716.67 | 9,000.00 |
| විවිධ වියදම් | 45,054.28 | |
| **පොදු වියදම්** | | |
| වාහන නඩත්තුව | 13,500.00 | |
| ගොඩනැගිලි නඩත්තුව - අළුත්වැඩියා | 6,050.00 | |
| ගොඩනැගිලි නඩත්තුව - ජලය | 5,438.40 | |
| ආදායම් බදු | 322.00 | |
| ජාතිය ගොඩ නැගීමේ බදු | | 113,276.82 |
| සමාජ වගකීම් බද්ද | 601,518.00 | 88,960.00 |

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| **තැම්පතු පරීක්ෂණ** | | 776,451.10 |
| ක්ෂය වීම් පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 251,483.04 | |
| **ආදායම** | | |
| EL සේවා ගාස්තු | | 11,173,307.70 |
| **එකතුව** | 2,691,153.98 | 12,346,705.64 |

## 12. වාර්තා කිරීමේ ආකෘතිය

සාමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ වාර්තා කිරීමේ ආකෘතිය වෙනස් කර නැත.

# විගණකාධිපති වාර්තාව

ටීසී/බී/සීඒඑස්එල්/එෆ්ඒ/2011 2012 දෙසැම්බර් 07 දින

සභාපති,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය.

## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර මාගේ විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථාකාලයේ දී නිකුත් කරනු ඇත.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 05 ප්‍රකාර සමාලෝචිත වර්ෂය අවසාන තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට දැක්විය යුතු වුවත් රු.1,586,231 ක් වූ පිරිවැය වටිනාකම අවසාන තොගය ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, මෙම තොගයේ සැලකිය යුතු ප්‍රමාණයක ලිපිද්‍රව්‍ය තොගයක් ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස දුර්වර්ණ වී තිබුණ ද එම ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම තොග හානි ලෙස කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36 ප්‍රකාර දෙපාර්ශවය අතර එකඟත්වයට නොඑළඹුනු රු.110,632,274 ක් වූ අසම්භාව්‍ය බඳු බැරකම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දී  මිලදී ගන්නා ලද ජංගම නොවන වත්කම් යටතේ දැක්විය යුතු රු.6,986,498ක් පිරිවැය වූ පරිඝනක මෘදුකාංග ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

#### 2.2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් වලට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.214,805,125ක් හිඟ හිටව තිබු අතර ඉන් රු. 14,584,634 ක් වර්ෂයකට වැඩි කාලයක් හිඟහිටි ශේෂ වශයෙන් පැවතුණි. එමෙන්ම ගෙවිය යුතු ගිණුම් වලට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.46,325,975 ක් මුදල් නොපියවා තිබු අතර ඉන් රු.812,320 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නොපිය වූ ශේෂ වශයෙන් පැවතුණි.

#### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය අවසානයේ ගිණුම් විෂයයන් 16 කට අදාලව එකතුව රු. 214,805,125 ක් වූ ලැබිය යුතු ශේෂ සඳහා සහ ගිණුම් විෂයයන් 35කට අදාලව එකතුව රු.46,325,975 ක් වූ ගෙවිය යුතු ශේෂ සඳහා සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2.2.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත<br>(i) 10(5) වගන්තිය. | බෙදාහැරීමෙන් පසුව ඉතිරිවන ශුද්ධ අතිරික්ත ආදායම් ඒකාබද්ධ අරමුදලට බැරකල යුතු වුවත් රු.502,614,219 ක් වූ සමුච්චිත ලාභය 2011 දෙසැම්බර් 31 දිනවන විටත් බැර කර නොතිබුණි. |
| (ii) 11 වගන්තිය | භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා නොගෙන අවස්ථා 31කදී එකතුව රු.507,937,571ක් භාණ්ඩාගාර බිල්පත්වල හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 111 (අ) වගන්තිය සහ 2011 අයවැය ප්‍රකාශය | අධිකාරියේ නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් සහ අනිකුත් ඉපයීම් වෙනුවෙන්, උපයන විට ගෙවීම් බදු පෞද්ගලිකව දැරිය යුතු වුවද 2007 සිට 2011 වසර දක්වා වූ වසර 05ක් සඳහා එකතුව රු.11,916,740 ක් වූ උපයන විට ගෙවීම් බදු අධිකාරියේ අරමුදලින් ගෙවා තිබුණි. |
| (ඇ) 2008 ජුනි 26 දිනැති අංක 14/ 2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | යථෝක්ත චක්‍රලේඛයෙන් හිමිකම් නොලබන මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන්ට මසකට රු.15,000 හා රු.10,000 බැගින් ප්‍රවාහන දිමනාවක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී සහ ඉකුත් වර්ෂයේ දී ගෙවා තිබු ප්‍රවාහන දීමනාව<br>පිළිවෙලින් රු.9,888,671ක් සහ රු.20,967,837 ක් විය. |
| (ඈ) කළමනාකරණ සේවා චක්‍රලේඛ | |
| (i) 2009 ජුනි 01 දිනැති අංක 34(1) දරන චක්‍රලේඛය | රාජ්‍ය සංස්ථා වල නිලධාරීන්ට ගෙවනු ලබන රු. 350 සිට රු.500 දක්වා වු සංයුක්ත දිමනා වලට පටහැනිව රු. 1,500 සිට රු.3,500 දක්වා අධිකාරියේ නිලධාරීන්ට සංයුක්ත දිමනා ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ මුල් මාස 10 ක් තුල එසේ ගෙවීම් කර තිබු මුළු දිමනා ප්‍රමාණය රු.1,247,500 ක් විය. |
| (ii) 2011 දෙසැම්බර් 22 දිනැති අංක 47 දරන චක්‍රලේඛය | එක් සේවකයෙක් සඳහා භාණ්ඩාගාරයෙන් අනුමත රු.7,500ක් වූ වාර්ෂික ප්‍රසාද දමනාවට අමතරව සියලුම සේවකයින්ට එක් නිලධාරියෙකුට උපරිමය රු. 27,500 ක් වන පරිදි කාර්ය සාධන දිමනාවක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුල චක්‍රලේඛයන්ට පටහැනිව ගෙවන ලද දීමනාව රු.3,367,897ක් විය. |
| (ඉ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |

| | |
|---|---|
| (i) 1994 ජුනි 04 දිනැති අංක 95 දරන චක්‍රලේඛය | යථෝක්ත චක්‍රලේඛයට පටහැනිව මහා භාණ්ඩාගාරයේ නිසි අවසරය නොලබා නිලධාරීන්ට වෘත්තිය දීමනා ලෙස මසකට රු.25,000 සිට රු.75,000 දක්වා වූ දීමනාවක් ද තවත් නිලධාරීන් 4 දෙනෙකුට රු.750 සිට රු.5,000 දක්වා වූ විශේෂ දීමනාවක් ද මාසිකව ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද වෘත්තිය දීමනාව රු.2,557,500 ක් විය. |
| | අධිකාරියෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් තුල කාර්ය මණ්ඩල පුහුණු වැඩ මුළුවක් පවත්වා තිබූ අතර, එම වැඩ මුළුවට සහභාගි වූ නිලධාරීන්ට රු.603,750ක විශේෂිත දීමනාවක් භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ii) 2011 අප්‍රේල් 29 දිනැති අංක 60 දරන චක්‍රලේඛය | අධිකාරිය විසින් වයස අවු: 60 ඉක්මවූ නිලධාරීන් 05 දෙනෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව සේවයේ යොදවා වැටුප් හා දීමනා ලෙස රු.4,007,140ක් ගෙවීම් කර තිබුණි. |

### 2.2.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරුනු ලැබේ.

(අ) නිලධාරීන් සහ සුහ සාධක සංගම් විසින් පෞද්ගලිකව දැරිය යුතුව තිබූ ආහාරපාන සංග්‍රහ වියදම් රු.873,160 ක් සමාලෝචිත වර්ෂයේ දී අධිකාරියේ අරමුදලින් වැය කර තිබුණි.

(ආ) ගුවන් නිරුපද්‍රිතතාවය හා සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීම සඳහා වූ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවට අධිකාරියේ කාර්යාලය තුළ තැබීමට ආදර්ශ ගුවන් යානා 08ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,254,000ක් වැය කර තිබුණි. මෙම ආදර්ශ ගුවන් යානා තැබීම තුලින් කුලියට ගත් ගොඩනැගිල්ලේ කාර්යාල ඉඩ ද ඇහිරී තිබුණි.

(ඇ) අමාත්‍යවරයාගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ විදේශ චාරිකා වෙනුවෙන් රු.3,421,142ක මුදලක් අධිකාරියේ අරමුදලින් වැය කර තිබුණි.

### 2.2.7 දෘෂ්‍ය අක්‍රමිකතා

රේඛීය අමාත්‍යාංශයෙන් වැටුප් ලබන, අමාත්‍ය කාර්ය මණ්ඩලයට අයත් නිලධාරියෙකුට සිවිල් ගුවන් සේවා අධිකාරියේ සංවර්ධන සැලසුම් සම්බන්ධීකාරක තනතුරකට බඳවා ගත් බවට පත්වීම් ලිපියක් ලබාදී තිබූ අතර ඔහුගෙන් කිසිදු සේවයක් ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.1,200,390 ක් ගෙවා තිබුණි. එමගින් එම නිලධාරියාට වැටුප් 2ක් ලබා ගැනීමට අවකාශය සලසා තිබුණි. එමෙන්ම එම නිලධාරියාට අධිකාරිය විසින් ලබා දී තිබූ ලබා වාහනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ඉන්ධන සඳහා රු.462,135 ක් ද, සහභාගි වී තිබුණු විදේශ සංචාර සඳහා ගුවන් ටිකට්පත් වෙනුවෙන් රු.258,901 ක් ද අධිකාරිය විසින් ගෙවා තිබුණි.

## 3 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය බද්දට පෙර රු.428,897,727 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා බද්දට පෙර ලාභය රු.385,125,238 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.43,772,489 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ආදායම සහ සේවා සැපයීමෙන් ලැබූ ආදායම වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3. 2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම 27.80 % ක වැඩිවීමක් ද වියදම 59.93 % ක වැඩිවීමක් ද පෙන්වන අතර, සමාලෝචිත වර්ෂයේ බදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 11.37 % කින් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් දර්ශක අනුව, ඉකුත් වර්ෂ දෙක හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධනයේ වැඩි වීමක් දක්නට ලැබුණි.

| විෂයය | විස්තරය | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| (අ) ගුවන් යානා චලන | (i) කුලී පියසර-පැය | 1,782 | 1,317 | 1,057 |
| | (ii) නිත්‍ය ගුවන් ප්‍රවාහන සමාගම්- පියසර-පැය | 41,891 | 32,590 | 27,545 |
| (ආ)සම්පූර්ණ කරන ලද විගණන | (i ) මෙහෙයුම් | - | 01 | 01 |
| | (ii) ඒකාබද්ධ (මෙහෙයුම් හා යෝග්‍යතාව ) | - | - | - |
| | (iii) ගගන යාත්‍රාංගනය | - | - | 01 |
| (ඇ) ඉටුකරන ලද නිරූපදිත / සුරක්ෂිත හා අධීක්ෂණ කාර්යයන් | (i) රෑම්ප් පරීක්ෂණ ගණන (ගුවන් යෝග්‍යතාවය) | 65 | 30 | 72 |
| | (ii)රෑම්ප් පරීක්ෂණ ගණන(ඒකාබද්ධ) | - | - | - |
| | (iii) ගගන යාත්‍රාංගනය | 20 | 09 | 10 |
| | (iv) අන්තරාකාරී භාණ්ඩ | 35 | 08 | 19 |

### 4.2 ආර්ථික නොවූ ගනුදෙනු

අධිකාරියේ ගුවන් සේවා පරීක්ෂකවරුන් සඳහා 2011 වර්ෂයේ දී එකක් රු.475 බැගින් කරපටි 525ක් රු.284,866ක් වූ මුදලකට මිලදී ගෙන තිබුණ ද එම කරපටි නියමිත ප්‍රමිතියට සුදුසු නොවීම හේතුවෙන් නිකුත් නොකර ගබඩාවේ රඳවා තිබුණි.

### 4.3. කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) (i)අවුරුදු 3ක කාල පරිච්ඡේදයක් සඳහා පෞද්ගලික පාර්ශවයකට අයත් ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණු අතර ගොඩනැගිලි පරිශ්‍රය තුල ගබඩා කාමර සහ රියදුරු විවේකාගාර ඉදිකිරීම් හා අළුත් වැඩියාවන් වෙනුවෙන්

එකතුව රු. 28,214,123ක් අධිකාරියේ අරමුදලින් දරා තිබුණි. එසේම 2011 මාර්තු මස සිට මාසික කුලි ගෙවා තිබුණ ද , ගොඩනැගිල්ලේ විවිධ ඉදිකිරීම් හා අළුත්වැඩියා කිරීම් ගොඩනැගිලි හිමියා සිදුකර නොදීම නිසා අධිකාරියේ කාර්යාල කටයුතු නව කුලි ගොඩනැගිල්ලට ගෙන ඒමට මාස 02 ක කාල පමාවක් සිදුවී තිබුණි. මේ අනුව ගොඩනැගිල්ලේ කාර්යාල කටයුතු නොපැවැත්වූ 2011 මාර්තු හා අප්‍රේල් යන මාස දෙක සඳහා වැට් බදු සහිතව රු. 3,283,657 ක් සහ කාර්යාල කටයුතු පවත්වාගෙන ගිය පැරණි ගොඩනැගිල්ලට තව දුරටත් රු.1,340,412 ක් ගෙවීම් කිරීමට සිදුවී තිබූ බැවින්, එකතුව රු. 4,624,069 ක මුදලක් නිෂ්ඵල ලෙස ගොඩනැගිලි කුලි ලෙස අරමුදල මගින් වැය කර තිබුණි.

(ii) කුලියට ගත් ගොඩනැගිල්ලේ කුලි ගිවිසුම් අත්සන් කිරීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ නිර්දේශය ප්‍රකාර ගෙහිමියා සියළු අළුත්වැඩියා සහ වරිපනම් ගාස්තු දැරිය යුතුය යන කොන්දේසිය ඇතුලත් නොකර ගිවිසුම් අත්සන් කර තිබීම හේතුවෙන් වාර්ෂික වරිපනම් ගාස්තු වැඩිවීම වෙනුවෙන් රු. 269,535 ක් අධිකාරියේ අරමුදලින් ගෙවා තිබූ අතර, ගොඩනැගිල්ල සඳහා ඇති කරගන්නා කුමන හෝ ගිවිසුමක් මත දැරීමට සිදුවන වියදම් වලින් අඩක් අධිකාරිය විසින් දැරීමට ද සිදුවී තිබුණි.

(ආ) අධිකාරිය විසින් ගුවන් නියමු බලපත්‍ර ලබාදීම, උස් ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබාදීම ආදී වූ විවිධ සේවාවන් සැපයීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු පසුගිය වසර 06 ක් තුල සංශෝධනය කර නොතිබුණි. මේ නිසාම සේවා සැපයීම සඳහා දරණ මුදලට ප්‍රමාණවත් ගාස්තුවක් අධිකාරියට නොලැබෙන බව නිරීක්ෂණය විය.

## 4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයකු ලෙස අධ්‍යක්ෂ (සමුච්චිත) කටයුතු කරමින් කුලි පදනමට ගොඩනැගිල්ලක් ගැනීම සඳහා වූ ඇගයීම් කමිටුවේ සභාපති ලෙස ද කටයුතු කිරීමෙන් ගොඩනැගිලි කුලියට ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගය විනිවිදභාවයකින් යුක්තව සිදු වූ බවට විගණනයේ දී එකඟ විය නොහැකි විය. සමාලෝචිත වර්ෂයේ දී රු. 78,807,771 ක මුදලක් ගොඩනැගිලි කුලි වශයෙන් ගෙවීමේදි සාමාන්‍ය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් මගින් අනුමැතියක් ලබා ගැනීම ප්‍රමාණවත් නොවන අතර, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීම අත්‍යවශ්‍ය වුවත් එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

## 4.5 වෙනත් රාජ්‍ය ආයතන වලට ලබාදුන් අධිකාරියේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක: පිඊඩී 12 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව අධිකාරිය සතු වාහන 3 ක් අමාත්‍යවරයාගේ ප්‍රයෝජනය සඳහා ලබා දී තිබූ අතර ඉන්ධන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල දී රු.632,581 ක් අධිකාරියේ අරමුදලෙන් දරා තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ තත්ත්වයන් පහත පරිදි විය.

| කාර්ය මණ්ඩල වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී | 01 | 01 |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | 34 | 26 |
| විධායක නිලධාරීන් | 41 | 35 |
| ක්‍රියාකාරී නිලධාරීන් | 55 | 53 |
| කාර්යාල සහායක | 34 | 30 |
| | ----- | ----- |
| එකතුව | 165 | 145 |
| | ==== | ==== |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ මූල්‍ය අංශයේ මුදල් කළමනාකරු නියෝජ්‍ය මුදල් කළමනාකරු යන තනතුරු 2ක යටපත් කර බඳවා ගැනීමේ පරිපාටියට අනුව සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරිනියක් නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් තනතුරෙහි වැඩ බැලීම සඳහා පත්කර වසර 4කට වැඩි කාලයක් වැඩ බැලීමේ දීමනා ගෙවමින් සේවයේ යොදවා තිබුණි.

(ආ) 1997 ඔක්තොම්බර් 27 දිනැති අංක 124 දරණ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව පුරප්පාඩු 7ක් පිරවීමට අධිකාරිය කටයුතු කර නොතිබූ අතර එම තනතුරු සඳහා නිලධාරීන් වසර 2 සිට 6 දක්වා කාලයක් වැඩ බැලීමට පත්කර වැඩ බැලීමේ දීමනා ලෙස රු.2,124,313 ක් ගෙවා තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ දී ඇස්මේන්තු ගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, 85% සිට 179% දක්වා වූ පරාසයක සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ ) ආදායම් රැස්කිරීම
(ඇ) වියදම් කළමනාකරණය
(ඈ) රජයේ නීති රීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) පිරිස් කළමනාකරණය



එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

## විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පිළිතුරු

FN/12/4

2013.02.12

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ඉහත කරුණ පිළිබඳව ඔබගේ අංක ටීසී/බී/සීඒඒඑස්එල්/එෆ්ඒ/2011 සහ 2012 දෙසැම්බර් 07 දරණ ලිපිය හා සබැඳේ.

එම වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් මෙම අධිකාරියේ අදහස් පහත දැක්වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) ඔබගේ නිරීක්ෂණය පිළිගනිමු. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 05 ප්‍රකාර වර්ෂ අවසාන තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට දැක්වීම මින් ඉදිරියට කටයුතු කරන්නෙමු.

තවද, ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස දුර්වර්ණ වී ඇති ලිපි ද්‍රව්‍ය පිළිබඳ තක්සේරුවක් කර එහි වටිනාකම තොග හානි ලෙස කපා දැමීමට අවශ්‍ය කටයුතු කරන්නෙමු.

(ආ) ඔබගේ නිරීක්ෂණය පිළිගනිමු. ඒ අනුව ඉදිරියේදී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36 ප්‍රකාර, දෙපාර්ශවය අතර එකඟතාවයකට එළඹිය නොහැකි අසම්භාව්‍ය බදු බැරකම් ඇතිවුවහොත් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිකිරීමට කටයුතු කරන්නෙමු.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ඔබගේ නිරීක්ෂණය පිළිගනිමු. 2011 මූල්‍ය ප්‍රකාශනවල එම වරද මේ වන විටත් නිවැරදි කරනු ලැබ ඇත.

#### 2.2.3. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

ඔබගේ නිරීක්ෂණය පිළිගනිමු. ඒ පිළිබඳව පහත දක්වා ඇති පරිදි කටයුතු කරන්නෙමු.

| ලැබිය යුතු මුදල(රු) | මුදල් ලැබිය යුත්තේ කාගෙන්ද | හේතුව | ලැබිය යුතු අයකර ගැනීමට ගෙන ඇති පියවර |
|---|---|---|---|
| 14,43,077.21 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | එකතු කල අගය මත වන බදු මුදල් වලින් ආපසු ලැබිය යුතු මුදල | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා ආරම්භ කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 150,556,.79 | කොස්මෝස් ගුවන් සමාගම සහ හෙලිටුවර්ස් ගුවන් සමාගම | ගුවන් සමාගම් සහතික කිරීමේ කාර්යාවලියේදී අදාල සමාගම් සම්බන්ධයෙන් නීති ප්‍රකාර මහජන අදහස් විමසා පුවත්පත් වල පළකළ දැන්වීම් සඳහා දැරීමට වූ මුදල ප්‍රතිපූරණය කිරීම | අදාල මුදල් වහාම ගෙවන ලෙස අදාල සමාගම් වලට දන්වා ඇත. |
| **ගෙවිය යුතු මුදල(රු)** | **මුදල් ගෙවිය යුත්තේ කාටද** | **හේතුව** | **ගෙවීමට ගෙන ඇති පියවර** |
| 358,328.20 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | අදාල ඉන්වොයිසිය නොලැබීම | 2009/2010 යන වර්ෂයන් සඳහා වන විගණන ගාස්තු ගෙවීමට කටයුතු කර ඇත. |
| 788,534.57 | නිසි හඳුනාගැනීමක් නැත | නිසි හඳුනාගැනීමක් නොමැති වීම. | නිසි හඳුනාගැනීමෙන් අනතුරුව අදාල ගැලපීම් සිදුකර ඇත. |

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ඔබගේ නිරීක්ෂණය පිළිගනිමු. ලැබිය යුතු ශේෂ සහ ගෙවිය යුතු ශේෂ සඳහා වූ අවශ්‍ය සනාථ කිරීමේ තොරතුරු අදාළ පාර්ශවකරුවන් විසින් නිසි කළට මෙම අධිකාරියට නොසැපයීම නිසා මෙම තත්වය හට ගෙන ඇත. එබැවින් අදාළ තොරතුරු නොපමාව විගණකාධිපති දෙපාර්තමේන්තුවටද පිටපතක් සහිතව සපයන ලෙස අදාළ පාර්ශව කරුවන්ට දන්වා යවා ඇත. ඉදිරියේදී මෙම තත්වය මගහරවා ගැනීමට කටයුතු කරන්නෙමු.

### 2.2.5. නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට අනුකුල නොවීම

(අ) 1971 අංක 38 දරණ මුදල් පනත

(i) සහ (ii)

මෙම අධිකාරියට නීතියෙන් පැවරී ඇති කාර්යය, කර්තව්‍ය සහ වගකීම් ඉටුකිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, ජාතික අයවැයෙන් වාර්ෂිකව සම්පාදනය නොකෙරේ. එම මුදල් අධිකාරිය විසින්ම තම වාර්ෂික ක්‍රියාවලිය තුළින් සම්පාදනය කර ගත යුතුය. මෙම අධිකාරියේ ප්‍රධාන මූල්‍ය ඉපයීමේ ප්‍රභවයන් සහ එමගින් ලැබෙන්නාවූ මුදල් ප්‍රමාණයන් අවිනිශ්චිතය. තවද 1971 අංක 38 දරණ මුදල් පනතේ 7 වගන්තියට අනුව, රාජ්‍ය සංස්ථාවක අදායම් ගිණුමේ අතිරික්තය, එම ගිණුමෙන් ඉදිරි පස් වසරක් තුළ එකී සංස්ථාව විසින් දැරීමට සිදුවන වියදම් පියවා ගැනීමට හැකිවන පරිදි පවත්වාගෙන යාමට එහි අධ්‍යක්ෂක මණ්ඩලය බැඳී සිටින බැවින්, අධිකාරියේ ඉදිරි පස් වසර තුළ කාලයකට ඉටු කිරීමට අවශ්‍ය මුදල් ජනනය වන පරිදි එහි අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා අධිකාරියේ ආරම්භක අවදියේදීම (එනම් 2003 දී), විෂයභාර අමාත්‍යවරයාගේ සහ මුදල් අමාත්‍යාංශයේ ලිඛිත අවසරය ලබා ගෙන ඇත. මෙම අතිරික්ත මුදල් වියදම් කිරීමට අපේක්ෂිත කාර්යයන් අධිකාරියේ සංයුක්ත සැලැස්මේ (ව්‍යාපාරික සැලැස්මේ) පැහැදිලිව දක්වා ඇති අතර එහි පිටපත් විෂය භාර අමාත්‍යවරයාට සහ මුදල් අමාත්‍යාංශයට වාර්ෂිකව යවා ඇත. මෙම අධිකාරියට ප්‍රධාන ගොඩනැගිල්ලක් ඉදි කිරීම, මත්තල ගුවන් තොටුපොළ පරිශ්‍රයේ ශාඛා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සහ සේවක නිල නිවාස ඉදි කිරීම, නිවාඩු නිකේතනයක් ඉදි කිරීම ආදී කාර්යයන් සඳහා මෙම මුදල් යෙදවීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත් අධිකාරියේ අතිරික්ත මුදල් වලින් 2011 වසරේදී රු.මිලියන 250 ක් සහ 2012 වසරේදී රු.මිලියන 350 ක් ද මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේශණය කර ඇත. දැනට අධිකාරිය සතු අතිරික්ත මුදල් 1971 අංක 38 දරණ මුදල් පනතේ 7 වගන්තියේ අවශ්‍යතාවයන් සපුරාලීමට ප්‍රමාණවත් නොවන බැවින්

එම ඉතිරි අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ සහ මුදල් අමාත්‍යංශයේ තත්කාලීන අවසරය ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත.

(ආ) 2000 අංක 38 දරණ දේශීය ආදායම් පනත -111(අ) වගන්තිය සහ 2011 අයවැය ප්‍රකාශය

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල රීති සහ පරිපාලන ක්‍රියා පටිපාටි සංග්‍රහයෙහි ඇති ප්‍රතිපාදන වලට අනුව මෙම අධිකාරියේ කටයුතු සඵලව ඉටු කිරීමට දායකවන කෘතහස්ථ කාර්ය මණ්ඩලයක් ආයතය තුළ පවත්වා ගැනීම අරමුණු කොට, අධිකාරියේ නිලධාරීන් වෙනුවෙන් වූ උපයන විට ගෙවීම් බදු අධිකාරියේ මුදලින් දරණු ලැබ ඇත. මෙම අධිකාරියේ නිලධාරීන්ට ලබා දෙන පාරිශ්‍රමිකයන් සිවිල් ගුවන් සේවා කර්මාන්තයේ ඒ හා සමාන තත්වයන් දරන නිලධාරීන් ලබන පාරිශ්‍රමිකයන් අතර විශාල පරතරයක් ඇති හෙයින් මෙම බදු මුදල් අධිකාරිය විසින් ගෙවීම් කර යම්තාක් දුරට ඉහත පරතරයන් අඩුකර ගැනීමෙන් අදාළ නිලධාරීන් අධිකාරිය තුළ රඳවා ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) 2008 ජූනි 26 දිනැති අංක 14/2008 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

ආයතන සංග්‍රහයේ ඇති අර්ථ නිරූපනයට අනුව සංස්ථා සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස නොසැලකේ. එබැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල ඇති ප්‍රතිපාදන සිවිල් ගුවන් සේවා අධිකාරියේ පරිපාලන කටයුතු සඳහා කෙළින්ම උපයෝගී කරගෙන නොමැති අතර ඒ සඳහා භාවිතයට ගෙන ඇත්තේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල රීති සහ පරිපාලන ක්‍රියාපටිපාටි සංග්‍රහයෙහි (SLCAP 5000) ඇති ප්‍රතිපාදන වේ. එම පරිපාලන ක්‍රියාපටිපාටි සංග්‍රහයට අනුව ප්‍රස්තුත ප්‍රවාහන ගෙවීම් කළ හැකිය. තවද, 2008 ජූනි 26 දිනැති අංක 14/2008 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යොමු කර ඇත්තේ අමාත්‍යංශ ලේකම්වරුන්ට, පළාත් සභා ලේකම්වරුන්ට සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට පමණක් බැවින් මෙම අධිකාරියේ කටයුතු සඳහා එය බල නොපවත්වයි. මෙම අධිකාරියේ සේවයේ නියුතු සමස්ථ සේවක සංඛ්‍යාව 150 කට වඩා අඩු බැවින් එක් එක් ප්‍රධාන මාර්ගයක පැමිණෙන සේවක සංඛ්‍යාව අල්ප වීම හේතුකොට සෑම සේවකයෙකුම ආවරණය වන පරිදි අධිකාරියේ වියදමින් පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම ප්‍රායෝගික සහ ආර්ථිකවත් නොවීම හේතු කොට ගෙන සෑම සේවකයෙකුටම අදාල ප්‍රවාහන දීමනා ගෙවීම්, අධ්‍යක්ෂක මණ්ඩළයේ අනුමැතිය පරිදි සිදු කර ඇත.

(ඈ) කළමණාකරණ සේවා චක්‍රලේඛ

(i) 2009 ජූනි 01 දිනැති අංක 34(1) දරණ චක්‍රලේඛය

2009 ජූනි 01 දිනැති අංක 34(1) දරණ චක්‍රලේඛය අදාළ වන්නේ සංයුක්ත දීමනා සම්බන්ධයෙනි. ප්‍රස්තුත ගෙවීම් සංයුක්ත දීමනා ගණයට නොවැටේ. එය හුදෙක්ම දිරිගැන්වීමේ දීමනාවකි. එම දිරි ගැන්වීමේ දීමනා ක්‍රමය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, අධිකාරිය විසින් පවරණු ලැබූ සිවිල් ගුවන් සේවා අධ්‍යාපනය හෝ ප්‍රවර්ධනය වැනි සුවිශේෂී කාර්යයක නියැළි නිළධාරීන් සඳහා එම දීමනාව කාර්ය ප්‍රවර්ධනය අරමුණු කොට ගෙන ගෙවනු ලැබ ඇත.

(ii) 2011 දෙසැම්බර් 22 දිනැති අංක 47 දරණ චක්‍රලේඛය

ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් 2010 ඔක්තෝබර් මස මෙරටදී පැවැත්වූ නිරුපද්‍රිතතා සුපරීක්ෂණ විගණනය අරභයා පෙර සූදානම් සහ පසු විපරම් ආදී කටයුතු වලට අදාලව, විශේෂයෙන්ම 2010 වසරේ අග භාගයේ දී සහ 2011 වසරේ මුල් කාර්තු 3 තුළදී සමස්ථ සේවක මඩුල්ල කණ්ඩායමක් ලෙස රට වෙනුවෙන් සිදුකළ සුවිසාල මෙහෙය ඇගයීමක් ලෙස සළකා අධ්‍යක්ෂ මණ්ඩළ අනුමැතිය පරිදි මෙම කාර්ය සාධන දීමනාව ගෙවීමට කටයුතු කර ඇත. කෙසේ වුවද ඉදිරි වසර වලදී මේ සම්බන්ධයෙන් වන්නාවූ අදාළ අනුමැතියන් පරිදි කටයුතු කරන්නෙමු.

(ඉ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

(i) 1994 ජුනි 04 දිනැති අංක 95 දරණ චක්‍රලේඛය

මෙරටේ සිවිල් ගුවන් සේවා කර්මාන්තයට ඇතුළුවන සෑම ආයතනයක් හෝ පුද්ගලයෙකු හෝ අදාළ කටයුතු වල නිරත වීම සඳහා, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පනවනු ලබන්නාවූ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත ක්‍රියාපටිපාටි සපුරාලිය යුතුය. ඒ බව සහතික කිරීමේ සහ විමර්ශනය කිරීමේ වගකීම, සිවිල් ගුවන් සේවා නියාමන කටයුතු භාරවූ රාජ්‍ය ආයතනය වශයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට පැවරී ඇත. එම කාර්ය සඵලව ඉටු කිරීමට අදාළ විවිධ විෂයන්හි ප්‍රවීන කෘතහස්ථ කාර්ය මණ්ඩයකගේ සේවය අවශ්‍යය. එවැනි පුද්ගලයන්ගේ සේවය ලබා ගැනීමට නම් ඔවුන්ගේ නිපුණතාවයට සරිලන පාරිශ්‍රමිකයක් ගෙවිය යුතු වේ. විෂයෙහි ප්‍රවීනයන්ට, කර්මාන්තයේ ගෙවන වැටුප් සමග සැසඳෙන වැටුප් ගෙවා අධිකාරියේ සේවයේ නිරත කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිපාදන 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතින් සළසා ඇති අතර එම ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීමේ බලයද අධිකාරියට පවරනු ලැබ ඇත. තවද, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩල රීති හා පරිපාලන ක්‍රියාපටිපාටි සංග්‍රහයෙහි එම කටයුතු කිරීම සඳහා විධිමත් ක්‍රම වේදයක් යොදා ඇත. ඒ අනුව ප්‍රස්තුත වෘත්තිය දීමනා ගෙවා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩළ අනුමැතිය පරිදි, නිලධාරීන් 4 දෙනෙකුට රු. 750/= සිට රු. 5000/= දක්වා මාසික දීමනා ගෙවනු ලැබුයේ අධිකාරියේ අවශ්‍යතාව මත ඔවුන් විසින් තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව ඉටුකරනු ලබන වැඩිමනත් රාජකාරී කටයුතු වල ස්වභාවය සහ ප්‍රමාණය සැළකිල්ලට ගැනීමෙනි.

ප්‍රස්තුත වැඩමුළුව පැවැත්වූයේ අධිකාරියේ අනුමත වාර්ෂික වැඩ සටහනකට අනුවය. එහි අභිමතාර්ථය වූයේ සේවකයින්ට කණ්ඩායමක් ලෙස වැඩකිරීමේ වැදගත්කම හා නායකත්වය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමය. වැඩසටහනට සුදුසු පරිසරයක් අවශ්‍යවූයෙන් ඒ සඳහා නිසි ක්‍රමවේදයකට අනුව කෙරුණු මනා අධ්‍යයනකින් පසුව පෞද්ගලික ආයතනයක් තෝරා ගැනිණි. වැඩමුළුව පැවැත්වූයේ සති අන්තයේ දෙදිනක බැවින් සේවක සහභාගීත්වය වැඩිකිරීම සඳහා අභිප්‍රේරණයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩළ අනුමැතිය පරිදි මෙම ප්‍රස්තුත ගෙවීම් කර ඇත.

(ii) 2011 අප්‍රේල් 29 දිනැති අංක 60 දරණ චක්‍රලේඛය

2011 අප්‍රේල් 29 දින අංක 60 දරණ චක්‍රලේඛය මගින් දක්වා ඇත්තේ රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන්ගේ විශ්‍රාම ගැනීම සහ සේවා දිගුකිරීම් සම්බන්ධයෙන් බල පැවැත්විය යුතු විධිවිධානයන් වේ. අමාත්‍ය මණ්ඩළය විසින් අනුමත කරනු ලැබූ සිවිල් ගුවන් සේවා අධිකාරියේ කාර්ය මණ්ඩළ රීති සහ පරිපාලන ක්‍රියා පටිපාටි සංග්‍රහයට අනුව සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවකයෙකුට වයස අවුරුදු 60 දක්වා සේවය කළ හැකි අතර කිසිදු අවස්ථාවක එම රීතියට පටහැනිව හෝ ඉහත සඳහන් චක්‍රලේඛයට පටහැනිව හෝ අධිකාරියේ කිසිදු සේවකයෙකුගේ සේවය වයස අවුරුදු 60 ඉක්මවා දීර්ඝ කර නැත. එහෙත් සීමිත අවස්ථා කීපයකදී පමණක් අධිකාරියේ සේවා අවශ්‍යතා සහ ප්‍රමුඛතා සැළකිල්ලට ගෙන වයස 60 ඉක්මවූ පුද්ගලයින් කීප දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සිදු විය. ඒ සඳහා අවශ්‍ය නීති ප්‍රතිපාදන 2002 අංක 34 දරණ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතින් සලසා ඇත. කෙසේ වුවද අධිකාරියේ සේවය සඳහා විෂයානුබද්ධ දැනුම, පළපුරුද්ද සහ නිපුණතාවය අත්‍යාවශ්‍ය නොවන තනතුරු සඳහා ඉදිරියේදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම නොකිරීමටද අධිකාරිය තීරණය කර ඇත.

**2.2.6. මතභේදයට තුඩු දෙන කරුණු**

(අ) රජයේ නියමයන් පරිදි හෝ අධිකාරියේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පවත්වනු ලැබූ රාජකාරීමය මුහුණුවරක් හෝ ආයතනික හෝ අරමුණක් ඇති ක්‍රියාකාරකම් වලට සහභාගී වූ අය වෙනුවෙන් සැපයු ආහාර පාන සඳහා ප්‍රස්තුත සංග්‍රහ වියදම් අධිකාරියේ මුදලින් දරා ඇත.

(ආ) සිවිල් ගුවන් සේවා කටයුතු භාරවූ රාජ්‍ය නියාමන ආයතනය වශයෙන් කටයුතු කරනුයේ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියයි. විදේශ රාජ්‍ය දූත පිරිස් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය ඇතුළු විදේශීය ගුවන් සේවා නියෝජිතයන් දේශීය හා විදේශීය ගුවන් සමාගම් නියෝජිතයන් ගුවන් නියමුවන් ආදී විවිධ තාක්ෂණික ශිල්පීන් මෙම අධිකාරියට නිතර යන එන පුද්ගලයින් අතර වෙති. ඊට අමතරව සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳව පර්යේෂකයන්ද, පාසල් ළමුන්ද විවිධ අවශ්‍යතා සඳහා අධිකාරියේ ගොඩනැගිල්ලට පැමිණෙති. එසේ පැමිණෙන පුද්ගලයින්ට අධිකාරියේ ගොඩනැගිල්ලට ඇතුළු වනවාත් සමගම දැකුම්කළු හා සිත් ගන්නා පරිසරයක් ඇතිකිරීම තුළින් ආයතනික කටයුතු ඉටු කිරීම පහසු වනවා පමණක් නොව අධිකාරිය හා සමස්ත රට කෙරෙහි යහපත් වූ ආකල්ප ඇති කිරීමට පිටුවහලක් වේ. මෙය මහජන ප්‍රසාදය දිනා ගැනීම සඳහා කළ ආයෝජනයක් වේ. ඒ සඳහා ආකර්ෂණීය වූ විවිධ වර්ගයේ නවීන ගුවන් යානා ආකෘති කීපයක් අධිකාරී ගොඩනැගිල්ලේ තබා ඇති අතර ඒවා අධිකාරියෙහි වත්කම් බවට පත්ව ඇති බැවින් සම්පත් හානියක් සිදු වී නොමැත. ඒවා තබා ඇත්තේ කාර්යයාල කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකි අවකාශයට අවහිරයක් නොවන බැවින් එමගින් කාර්යයාලයේ ඉඩ කඩ ඇහිරීමක් වී නොමැත.

(ඇ) සිවිල් ගුවන් සේවා විෂයට අදාලව පැවති විදේශ කටයුතු වෙනුවෙන් දැරිය යුතු වියදම අධිකාරියේ අරමුදලින් දැරිය යුතු බවට විෂයය භාර අමාත්‍යවරයාගෙන් ලැබුණු ලිඛිත නියෝග වලට අනුව අමාත්‍යවරයාගේ හා ඔහුගේ කාර්යය මණ්ඩලයේ විදේශ ගමන් වලට අදාල වියදම් අධිකාරියේ අරමුදලින් දරණු ලැබ ඇත. අමාත්‍යංශයේ ලිඛිත නියෝග ඉටු කිරීමට සිවිල් ගුවන් සේවා අධිකාරිය එය පිහිටුවනු ලැබූ පනතේ 31 වන වගන්තිය ප්‍රකාර බැඳී සිටී.

**2.2.7 දෘෂ්‍ය අක්‍රමිකතා**

ප්‍රස්තුත කාරණයේදී අදාල නිලධාරියා අධිකාරියේ කාර්යය මණ්ඩලයට බඳවා ගෙන ඇමතිතුමාගේ කාර්යයාලයේ කටයුතු වල නිරත කරවීම සඳහා 2002 අංක 34 දරණ සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ 31 (i) වගන්තියට අනුව විෂයභාර අමාත්‍යවරයාගෙන් ලැබුණු ලිඛිත නියෝගයට අනුව කටයුතු කිරීමේදී සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් කළ යුතුව තිබුණේ ඔහුට විධිමත් පත්වීම් ලිපියක් නිකුත් කිරීම නොව විෂයට අදාලව වැඩ පැවරීමේ ලිපියක් නිකුත් කිරීම බව විෂයභාර අමාත්‍යංශයේ ලේකම් විසින් පෙන්වා දී ඇති අතර ඒ අනුව එම ක්‍රියාව නිවැරදි කරන ලෙසට ද උපදෙස් ලබා දී ඇත. ඒ අනුව කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

**4. 4.2 ආර්ථික නොවූ ගණුදෙනු**

අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව ප්‍රස්තුත කරපටි පිළියෙල කර ඇත්තේ සිවිල් ගුවන් සේවා අධිකාරියට පැමිණෙන විශේෂ අමුත්තන්ට සමරු තිළිණ ලෙස පිරිනැමීමටය. ඊට අමතරව අධිකාරිය විසින් සංවිධානය කරනු ලබන අධ්‍යාපන හා ප්‍රවර්ධන කාර්යයන්ට සහභාගී වී ජයග්‍රහණය කරනු ලබන පාසල් ළමුන්ටද, අධිකාරියේ ගුවන් සේවා පරීක්ෂකවරුන්ටද මෙම කරපටි නිකුත් කරනු ඇත. මෙම කරපටි වල නියමිත ප්‍රමිතිය නොමැතිවීම පිළිබඳ ප්‍රශ්නයක් පැන නැගී නැත.

### 4.3 කළමණාකරණ අකාර්යක්ෂමතා

(අ) (i) සිවිල් ගුවන් සේවා අධිකාරිය පවත්වාගෙන යනු ලබන වර්ථමාන ගොඩනැගිල්ලට ගෙන ඒමට ප්‍රථම එය පැවතියේ ගාලු පාරේ අංක 64 දරණ ස්ථානයේ පිහිටි සුප්‍රීම් ගොඩනැගිල්ලේය. සංචාරක අමාත්‍යාංශය විසින් එය බද්දට ගෙන තිබුණ අතර එය මහල් 4 ක් හා තවත් මහලක කොටසක් ගොඩනැගිලි කුලිය බෙදා ගැනීමේ පදනම මත සිවිල් ගුවන් සේවා අධිකාරියට ලබා දී තිබුණි. 2010 දී රජය විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවීම සමග සංචාරක අමාත්‍යාංශය හා තවත් ආයතන රාශියක් ඊට එකතුවීම නිසා අවශ්‍යවූ ඉඩකඩ ලබාගෙන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පවත්වාගෙන යාම පිණිස සුප්‍රීම් ගොඩනැගිල්ලෙන් ඉක්මනින් ඉවත් වන ලෙස මෙම අධිකාරියට දන්වන ලදී. ඒ අනුව අධිකාරියේ ඉඩ කඩ අවශ්‍යතා සහ වෙනත් අපේක්ෂිත පහසුකම් දක්වා පල කරනු ලැබූ පුවත් පත් දැන්වීමකට අනුව ප්‍රතිචාර අතරින් අදාල තෝරා ගැනීම් කොන්දේසි සපුරාලමින් අවම මිල (වර්ග අඩියට රු.100/=) ගණන් ඉදිරිපත් කර තිබුණේ වර්තමාන ගොඩනැගිල්ල අයිතිකරුය. කෙසේ වෙතත් ඉහත මිල රජයේ තක්සේරුකරුගේ මිලට වඩා වැඩි වූ බැවින් එය සුදුසු තීරණ සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ පසු මෙම මිලට වර්තමාන ගොඩනැගිල්ල කුලියට ගැනීමට මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අවසර ලැබිණි. ගොඩනැගිල්ල සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල කාර්යයාල සැලැස්මකට අනුව රියදුරු විවේකාගාර සහ ගබඩා කාමර ආදී ඇතැම් පහසුකම් ප්‍රධාන ගොඩනැගිල්ලට පිටතින් පිහිටුවීමට සිදුවිය. එබැවින් ඒවා තාවකාලිකව ඉදිකෙරුණු ලැබූ අතර ඒ සඳහා මහල් 4 කින් යුත් සම්පූර්ණ ගොඩනැගිල්ල තුළ කාර්යයාල කාමර බෙදා වෙන් කිරීමට වියදම් වූ මුළු මුදල රු.28,214,123/=ක් වූ අතර එම මුදල අවුරුදු 3 ක් සඳහා ප්‍රක්ශේපණය කළ විට වර්ග අඩියකට දරා ඇති මුදල රු.125 කි. එය ගොඩනැගිලි සඳහා ඉදිරිපත් වූ සියළුම සාමාර්ථික මිල ගණන් වලට වඩා අඩුය.

කිසිම ගොඩනැගිලි හිමියෙකු තමාගේ ගොඩනැගිල්ලක් තුළ කාර්යයාල කාමර බෙදා වෙන්කර දීමට එකඟ නොවන අතර ඒ සඳහා ගත වන කාලය තුළදී ගොඩනැගිල්ල නොමිලේ ලබා නොදෙනු ඇත. නව ගොඩනැගිල්ලේ කාර්යයාල කාමර නිම වෙන තුරු කාර්යයාල කටයුතු පළමු ගොඩනැගිල්ලේ කරගෙන යාමට සිදු වූ හෙයින් ප්‍රස්තුත කාලය තුළ ප්‍රස්තුත ගෙවීම් කිරීමට සිදුවිය.

(ii) සාමාන්‍යයෙන් වරිපනම් බදු නිතර නිතර සංශෝධන වලට ලක් නොවේ. ඒවා සංශෝධනය වන්නේද කුඩා ප්‍රතිශතයකිනි. ඒ අනුව ගොඩනැගිලි කුලිය ද සංශෝධනය කිරීම සාමාන්‍ය ව්‍යවහාරයයි. ප්‍රධාන තක්සේරුකරු විසින් නිර්දේශ කර තිබූ කොන්දේසි කුලී ගිවිසුමට ඇතුළත් කිරීමට ගොඩනැගිලි හිමියා එකඟ නොවූ බැවින් එසේ කිරීමට අපහසු විය. කෙසේ වෙතත් මෙම ගොඩනැගිල්ල පිහිටා තිබෙන කොළඹ 02 ප්‍රදේශයේ ගොඩනැගිලි හිමියා විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් වලට සරිලන වෙනත් ගොඩනැගිල්ලක් ලබා ගැනීම එම කාලය තුළදී අපහසු බවද වැඩිදුරටත් සඳහන් කරමි.

(ආ) ඔබගේ නිර්දේශය සමග එකඟ වන අතර, නියාමන ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. ගාස්තු සංශෝධනයන් ප්‍රමාද කළේ 2009 වසර දක්වා රටේ පැවති තත්වයන් මත ගාස්තු සංශෝධනය කළේ නම් එය සිවිල් ගුවන් සේවා කර්මාන්තයේ ප්‍රවර්ධනයට අයහපත් ලෙස බලපාන බැවිනි.

### 4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

ඔබගේ නිරීක්ෂණය සමග එකඟවන අතර, එවැනි අතපසුවීම් ඉදිරියේදී ඇති නොවන අයුරින් කටයුතු කිරීමට පියවර ගෙන ඇත.

### 4.5 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් අධිකාරියේ සම්පත්

සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන දේශීය ගුවන් තොටුපොළවල් නගා සිටුවීමේ හා නව ගුවන් තොටුපොළවල් ඉදිකිරීමේ ව්‍යාපෘති නිරීක්ෂණ කාර්යයන් සඳහා යෙදවීමට

2002 අංක 34 දරණ සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ 31(1) වගන්තියට අනුව අමාත්‍යවරයාගේ ලිඛිත නියෝගය මත අධ්‍යක්ෂක මණ්ඩළ අනුමැතියට යටත්ව අදාල වාහන ලබා දී ඇත.

### 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) අධිකාරිය අනුමත ආයතනික සැළැස්ම සෑදීමේදී අත්‍යවශ්‍ය තනතුරු වලට අමතරව අධිකාරියේ සේවකයන්ගේ උසස්වීම් අවස්ථාවන්ද සැළකිල්ලට ගෙන තනතුරු කිහිපයක් ඇති කරනු ලැබීය. සහකාර මුදල් කළමණාකරණ තනතුර එවැනි තනතුරකි. එබැවින් ආරම්භයේදී එම තනතුර පිරවීමට අවශ්‍ය නොවන බවට තීරණය කළ අධිකාරිය එය අවු 05 කාලයක් සඳහා විලම්බනය කර තිබුණි. ඒ අතරතුර නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් තනතුරේ පුරප්පාඩුව ඇතිවූ අතර, එම පුරප්පාඩුව පිරවීම ගත් උත්හාසය අසාර්ථක වූ හෙයින් අධිකාරියේ මූල්‍ය පාලන කටයුතු ක්‍රමවත්ව හා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මූල්‍ය අංශයේ සිටි ජ්‍යෙෂ්ඨතම නිලධාරිණිය වන ගණකාධිකාරිවරිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ(මූල්‍ය) තනතුරේ වැඩ බැලීම සඳහා පත් කරන ලදී. පසු කාලයේදී නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු බඳවාගත් අතර, අධිකාරිය පිහිටුවා වසර 05 ක් ගතව තිබූ බැවින් සහකාර මූල්‍ය කළමණාකරන තනතුර සක්‍රිය කර එම තනතුර සඳහා අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව, අවශ්‍ය සුදුසුකම් ලබා තිබූ ගණකාධිකාරි තනතුර දැරූ නිලධාරියා ඒ සඳහා උසස් කරන ලදී.

(ආ) සේවා අවශ්‍යතාවය මතම මෙම තනතුර සඳහා වැඩබැලීමට නිලධාරීන් යොදවා තිබුණද මේ වන විට එම වැඩබැලීමේ පත්වීම් ක්‍රියාත්මක නොවේ.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 5.1 අයවැය පාලනය

ඔබගේ නිරීක්ෂණය සමග එකඟ වෙමු. ඉදිරියේදී අයවැය ලේඛනය සකස් කිරීමේදී වඩාත් තත්‍ය හා ඵලදායී අයුරින් පිළියෙළ කිරීමට කටයුතු කරණු ඇත.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයෙහි පෙන්වාදුන් කරුණු කෙරෙහි අපගේ දැඩි අවධානය යොමුකොට ඇත. පෙන්වා දී ඇති අඩුපාඩු ඉදිරියේදී ඇති නොවන අයුරින් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතරම, ශ්‍රී ලංකාව තුළ සිවිල් ගුවන් සේවා කටයුතු කළමණාකරණය කිරීමේදී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් නිරන්තරයෙන් පවත්වනු ලබන විගණන වලට මුහුණ දී අදාල කටයුතු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත ක්‍රියා පටිපාටි වලට අනුව පවත්වාගෙන යනු ලබන බවට තහවුරු කිරීමේ සුවිශාල වගකීම මෙම අධිකාරියට පැවරී ඇති බැවින්, ඔබගේ අදාළ විගණන කටයුතු වලදී ඒ පිළිබඳව නිසි අවධානයක් යොමු කරවන මෙන්ද ඉතා කරුණාවෙන් ඉල්ලමු.

තවද, ඔබගේ වාර්තාවේ සඳහන් ඇතැම් පරිච්ඡේදයන්ට අදාළ මූලික විගණන විමසුම් මෙම අධිකාරිය වෙත යොමු කර ඇත්තේ එම වාර්තාව නිකුත් කළ පසු බැවින්, එම ඡේදයන්ට අදාළව විධිමත් ලෙස කරුණු දැක්වීමට මෙම අධිකාරියට අවස්ථාවක් නොලැබුණ බවද කාරුණිකව දන්වනු කැමැත්තෙමු.



**ජෙනරල් රෝහාන් ද සිල්වා දළුවත්ත**
සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

1 පරිශිෂ්ටය - CAA සංවිධාන ව්‍යුහය

## Civil Aviation Authority of Sri Lanka Functional Responsibility Chart



## 2 පරිශිෂ්ඨය - 2011 ගුවන් සේවා ආශ්‍රිත සිදුවීම්




| | | | |
|---|---|---|---|
| FUEL | ඉන්ධන ආශ්‍රිත | SEC | සුරක්ෂිත තාවයට සම්බන්ධ |
| RAMP | භූමි මෙහෙයුම් | TURB | කැලඹීම් හමුවීම |
| GCOL | භූමියෙහි ගැටීම් | ATM | ගුවන් ගමන් කළමණාකරණය සම්බන්ධතාව නැතිවීම |
| LALT | අඩු උස මෙහෙයුම් | CABIN | මැදිරි නිරුපද්‍රිතතා සිද්ධි |
| MAC | ගුවන් සමීප බව/ගැටුමකට ආසන්න බව /ගුවනේදී ගැටීම | BIRD | කුරුළු ගැටීම් |
| SCF-NP | පද්ධති සංරචක ක්‍රියා විරහිත වීම (බ්ලොත් පාදකය හැර) | OTHER | වෙනත් |
| SCF-PP | බ්ලොත් පාදකය අක්‍රිය වීම | | |

සටහන - 2011 වර්ෂය තුළ වාර්තා වූ සිදුවීම් සියල්ල - ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් සම්බන්ධ හෝ ශ්‍රී ලංකා දේශය තුළ කිසියම් ගුවන් යානයකට සම්බන්ධ හෝ සිදුවීම්

## 3 පරිශිෂ්ඨය - USOAP විගණන ප්‍රතිපලය

### USOAP විගණන ප්‍රතිඵල
### ප්‍රබලකර ක්‍රියාත්මක කිරීම් ප්‍රමාණයේ සාමාන්‍ය - රාජ්‍යයන් අනුව




### ICAO - SARPS ක්‍රියාත්මක කිරීමේ ප්‍රබලකර භාවය



## රාජ්‍යයන්හි නිරුපද්‍රිතතා අධීක්ෂණ හැකියාවන්




## ICAO නිරුපද්‍රිතතා අධීක්ෂණය විගණන ප්‍රතිඵල - ප්‍රබලකර ක්‍රියාත්මක කිරීම් අඩුබව ප්‍රතිශතය




Aviation Fuel (Jet A-I) price variations (for Contract Customers) at BIA
from 2006 - 2011
US$ per US Gallon
Month
January
February
March
April
May
June
July
August
September
October
November
December
Next January
2006
2007
2008
2009
2010
2011

## 5 පරිශිෂ්ඨය - නැව්නැගීමේ ගාස්තු රැස් කිරීම

| අර්ථලාභියා | 2009 (රු. මිලියන) | 2010 (රු. මිලියන) | 2011 (රු. මිලියන) |
|---|---|---|---|
| AASL. | 1,499 | 1,887 | 1,927 |
| ලංකා සංචාරක මණ්ඩලය/ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය | 749 | 943 | 976 |
| ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය | 53 | 72 | 84.6 |

## 2011 ආදායම හා වියදම

### ආදායම්




### වියදම්



## 6 පරිශිෂ්ඨය - CAA කාර්යය මණ්ඩලය ලබාගත් නිවාඩු



## 7 පරිශිෂ්ඨය - මගී පැමිණීම හා පිටත් වීම






## 8 පරිශිෂ්ඨය - විදුලි සංදේශ කුළුණු සඳහා අනුමැතිය

